# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

ශ්‍රී බුද්ධ වර්ෂ 2559 වප් මස 27 වන කුජ දින

2015 ඔක්තෝබර් මස 27 වැනි අඟහරුවාද



නොමිලේ පිරිනමන දහම් පඬුරකි

විකිණීම සඳහා නොවේ

# 2 වප් පොහොය දිනයේ වැදගත්කම



බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොවෙන් දඹදිව සංකස්ස පුරයට වැඩීම, මහා පවාරණ දිනය, භික්ෂූන් වහන්සේලා විනය ප්‍රඥප්තියක් ඉටු කරන දිනය, දෙවන පෑතිස් රජු අරිට්ඨ කුමරා ඇතුළු දූත පිරිස ධර්මාශෝක රජු වෙත යවා ජයසිරි මහා බෝ ශාඛාව ලංකාවට වැඩමවා හනික සංදේශය යැවීම, මහා අරිට්ඨ කුමරු (ප්‍රථම) සිඟාල මහ රහතන් වහන්සේ විසින් මිහිඳු මාහිමිගේ අනුදැනුම ඇතිව ථූපාරාමයේදී විනය පිටකය සංගායනා කිරීම වප් පෝය හා පවතින ශාසනික වැදගත් සිද්ධීන් වෙති.

අද ශ්‍රී ලංකාවාසීන් වප් පොහොය විශේෂයෙන්ම සලකන්නේ වස් සමාදන්වීම පවාරණය කෙරෙන දින සිට කඨින චීවර පූජා මාසය වශයෙන් සැලකීමය. වැසි සමය පැමිණි කල එක් ස්ථානයකට රැස්වී ව්‍රතාංග රකින කාලය වස් සමයයි. වප් පොහෝ දිනයෙන් පසු විහාරස්ථානවල කඨින පූජා පින්කම් පැවැත්වේ. කඨින සිවුරු පූජාව වසරකට වරක් පමණක් සිදු කෙරෙන මහත් වූ පින් රැස්කර ගැනීමට හැකි උතුම් පින්කමකි.

වප් පොහොය හා කඨින පූජාවේ ඉතිහාසය බුදුරජාණන් වහන්සේගේ මුල්ම කාලය හා බැඳී පවතී. මුල්ම අවධිය වස් සමාදන් වූයේ බුදුරජාණන් වහන්සේ සහ පස්වග මහණුන් යන සීමිත පිරිසකි. සියලුම භික්ෂූන් වහන්සේලා වස් සමාදන් විය යුතු යැයි නියමයක් එකල නොතිබුණි. වැසි සමය එළඹෙන විට ශ්‍රමණ බ්‍රාහ්මණ කණ්ඩායම එක් එක් ස්ථානයන්හි විසීම සිරිතක් විය. එහෙත් භික්ෂූන් වහන්සේලා පමණක් බහුජන හිත සුව පිණිස ගම් නියම්ගම් චාරිකාවේ යෙදීම සිදුවිය.

වැසි වැටෙන කාලය කුඩා සතුන්, කෘමීන්, පණුවන් පොළොවෙහි මතුවීම හා ගැවසීම නිතර සිදුවිය. පැළැටි දලු ලෑම, අලුත් පැළැටි හටගැනීම ඇරඹෙයි. මේවා පයට පාගමින් සතුන් මරමින් භික්ෂූන් වහන්සේලා චාරිකා කරන බවට අන්‍යයන්ගේ දෝෂාරෝපණයට ලක්විය. මේ විවේචන හා දෙස් පරොස් ගැන ඉවසිලිවන්තව කල්පනා කළ බුදුරජාණන් වහන්සේ සියලුම භික්ෂූන් වහන්සේලා වර්ෂා සෘතුවේදී වස් එළඹිය යුතු යැයි අනුදැන වදාළහ. එතැන් සිට භික්ෂූන් වහන්සේලා වස් විසීම ආරම්භ කළහ.


පෙර වස, පසු වස වශයෙන් වස් සමාදන් දෙකක් වෙයි. ඇසළ අව පැලකය පෙර වස ලෙසත්, නිකිණි අව පැළවිය පසු වස ලෙසත් හඳුන්වයි. වස් වසන සමයෙහි ධර්ම දේශනා ආදියට වඩින්නේ නම් දින හතක් ඇතුළත ආපසු වස් විසූ ආරාමයට වැඩම කළ යුතු වෙයි. එම ක්‍රමය සත්තාහ කරණයෙන් වැඩීම යනුවෙන් හඳුන්වයි. එහෙත් හදිසි උවදුරු, ආපද, අනතුරු අවස්ථාවලදී සත්තාහකරණයක් නැතිව වුවද යා හැකිය. සෑහෙන පමණට ආහාර නොලැබීම ආදිය ඇතිවූ විටද වස් ආරාමය වෙනස් කළ හැකිය. ගාලක, ගැලක, නැවක වුවද වස් වසන්නට අවසර ඇතත් රුක් බෙන්, රුක් දෙබල, එළිමහන, වහල හා දෙර නැති තැන්, සොහොන හා දේවාලය යන ස්ථානයන්හි වස් නොවසන ලෙසද නියම කර ඇත.

වස් සමාදන්ව පසුවන කාලය තුළ කමටහන් වැඩීම, ව්‍රතාංග රැකීම, ධර්ම දේශනා කිරීම, භික්ෂූන් වහන්සේ සතු විශේෂ යුතුකමක් ලෙස අනුදැන වදරා ඇත. මෙම කාලය විශේෂ වූ පුණ්‍ය කාලයක් බැවින් බොහෝ දෙනාට පින් රැස් කර ගැනීමට හැකිවෙයි.

පෙර වස් වසා තුන්වෙනි මාසයේ පුර පසළොස්වක පොහෝ දිනයෙහි වස් පවාරණය කරනු ලැබේ. මෙදින වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලාට චීවරකරණය (කඨින පූජා) කරන සමය එළැඹේ. මෙම කඨින පූජාව බුදුරජාණන් වහන්සේගේ කාලයේ පටන් මේ දක්වාම ථෙරවාදී බුදු දහම පවතින සෑම රටකම පවතින විරාගත චාරිත්‍රයකි.


භික්ෂූන් වහන්සේ වෙනුවෙන් කඨින පූජාව කළ හැක්කේ වප් පසළොස්වකට පමණි. වස් පවාරණය කළ භික්ෂූන් වහන්සේ නමක් සිටීම, දායකයන් විසින් සංඝයා වහන්සේට දී සංඝයා වහන්සේ විසින් සුදුසු භික්ෂූන් වහන්සේ නමකට දියයුතු වීම, එතන්හිදීම කපා කොටා මසා පඬු පොවා සකස් කර ගත යුතු වීම ආදී කරුණු රාශියක් එකතු වීමෙන් සිදුවුණ පින්කමක් හෙයින් කඨින පූජාව දුර්ලභ පින්කමක් ලෙස සැලකේ.

වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා ඒකාන්තයෙන්ම කඨින චීවර පූජා ලැබිය යුතු යැයි නියමයක්ද ඇති අතර, බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා වස් සමාදන් වූ ස්ථානයකදී කඨින චීවර ලබාගත හැක්කේ එක් භික්ෂූන් වහන්සේ නමකට පමණය. එක් පුද්ගලයකුට ස්ථාන රාශියකදී කඨින චීවර රාශියක් පූජා කළ හැකිය. කඨින චීවර පූජාවකදී ඒ සඳහා පූජා කරනු ලබන සියලුම වස්තූන් කඨිනානිසංස ලබන දන වශයෙන් පිළිගැන්වේ. ආරාමයකට අවශ්‍ය විවිධ උපකරණද මේ සමග පූජා කරනු ලැබේ.



**පූජ්‍ය කරඇල්ලේ සුමනජෝති හිමි**

"මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# ඔබ සිහි නුවණින් සිටින්නෙක්ද?

සම්මා සම්බුදු රජාණන් වහන්සේ අපට උගන්වා වදාළේ සියලු ආකාරයේ පාප ක්‍රියාවන් අත්හැර දමා දහැමි බව වැඩිදියුණු කරගන්නා ලෙසටය. ගිහි අය යා යුතු මාර්ගය උන්වහන්සේ ඉතා කරුණාවෙන් පහදා දුන් සේක. නිවන කරා යායුතු බුදු මග කෙබඳු දැයි වටහා දුන් සේක. මෙම පහදා දීම කොයි ආකාරයේද කීවහොත් බුදුන් වහන්සේ අපට නිවන් මගට පියවර තබන මුල්ම ස්ථානයට කැඳවාගෙන යාමක් බඳුය. එම මග පෙන්වා දුන් පසුව අපට ඇත්තේ එම ධර්ම මාර්ගයේ ගමන් කිරීම පමණි. එසේ කිරීම හෝ නොකිරීම අපට අයත් කාර්යයකි. බුදුන් වහන්සේ සිය යුතුකම හා වගකීම ඉටු කොට ඇත.

මෙම ධර්ම මාර්ගයේ ගමන් කිරීම පෘතග්ජන අපට ලෙහෙසි පහසු නැති බව මුලින්ම කිව යුතුය. ඒ සඳහා විශාල කැප කිරීමක් කළ යුතුය. එම දුෂ්කර මාර්ගයේ ඉදිරියට ගමන් කරන අන්දම අප ඉගෙන ගත යුතුය. එය එක්තරා විදියකට ධර්මය හැදෑරීමකි. එම හැදෑරීම අතිශයින් දුෂ්කරය. හැබැයි එය දුෂ්කර යැයි කියා අතරමග අත්හැර දැමියද නොහැකිය. මේ සඳහා අප තුළ සම්මා දිට්ඨිය තිබීම අතිශයින් අවශ්‍ය සාධකයකි. එම ක්‍රියාවලිය "ධර්ම යුද්ධයක්" ලෙසට හැඳින්වීමේද වරදක් නැත. ධර්ම යුද්ධය ජයගැනීම යනු නිවන් මග අවබෝධ කරගැනීමම වන්නේය.

"දැකීම" තුළ යම් වෙනස්කම් තිබුණත් අප නිවැරදි ආකාරයට පුහුණු වුවහොත් අප අතර මතගැටුමක් හට නොගනී. එය ගංගාවන් රැසක් ගලා ගොස් මුහුදට වැටීමට සමාන වන්නේය. මුහුදට එක්වූ ගංගා ජලය කවර ගංගාවේ ජලයදැයි කිසිවකුටවත් කිව නොහැකිය. ගංගාවේ ජලය ලුණු රස නැති වුවත් එය මුහුදට වැටුණු පසු ලුණු රසයෙන් යුක්ත වෙයි. මිනිසුන් ගෙන බැලුවත් එම ධර්මතාව පොදුය. ධර්ම ප්‍රවාහය හා එක්වූ පසු ඔවුන් එසේ එක්ව සිටින්නේ එකම ධර්ම මාර්ගයක් සමගය.

විවිධ ප්‍රදේශවලින් පැමිණියත්, විවිධ හැඩරුව ගත්තත් ඔවුන් එකට එක්වී සිටින්නේ එකම මගක ගමන් කිරීම සඳහාය. සියල්ලෝ එකමුතු භාවයට පත්ව එකට මිශ්‍ර වෙති. එසේ වුවත් ඔවුන්ගේ සිතුවිලි හා ඔවුන් ක්‍රියාකරන ආකාරය එක සමාන නොවෙති. මතවාද හා ගැටුම් හටගන්නේ මිනිස් සිතේ ඇති මෙම චංචල හා විපරීත ස්වභාවය නිසාවෙනි. මෙසේ විවිධ මතවාද ඇතිවීම "දිට්ඨීමානය" ලෙසට හැඳින්විය හැකිය. බුදුන් වහන්සේ අපට උගන්වා වදාළේ සියලුම දෘෂ්ටීන් අත්හැර දමන ලෙසය. දෘෂ්ටීන්ට අදාළ කරුණු තේරුම් ගැනීම මිස අන්තවාදී ලෙස එහි එල්ලා නොසිටිය යුතු බව උන්වහන්සේ පහදා දුන්හ. මේ සඳහා සිතේ ඇති මානයට ඉඩ නොදිය යුතු බවද උන්වහන්සේ පැහැදිලි කළ සේක.


මෙහිදී "සතිය" හෙවත් "සිහිය" ගැන අප විශේෂයෙන් අවධානය යොමු කළ යුතුවේ. මෙය "සිහි නුවණ" යනුවෙන්ද හැඳින්විය හැකිය. අප හැම විටකදීම සිහි නුවණින් සිටිය යුතුය. අප කුමන කාර්යයක නියැලී සිටියත් හොඳ සිහි නුවණින් සිටීම අතිශයින් වැදගත්ය.

"සතිය" හෙවත් "සිහිය" පවතින විට අපි අප ගැන දකිමු. අපේ සිත් ගැනද දකිමු. "සිරුර තුළ සිරුර දකිමු", "මනස තුළ මනස දකිමු". "සතිය" නොපැවතියහොත් අපි ඒ කිසිදෙයක් නොදකිමු. සිදුවෙමින් පවතින්නේ කුමක්ද කියා නොදනිමු.


බුදුන් වදාළ ධර්මයට අපි නිරතුරුව සවන් දිය යුතු වෙමු. මේ සඳහා "වැටහීම" අවශ්‍ය වේ. නිවැරදි වැටහීම ඇතිවන විට බුදුන් වදාළ නිර්මල බුදු වදන් අපට ශ්‍රවණය වෙන්ට පටන් ගනී. එමනිසා ඔබ මෙම ලිපිය කියවන විටත් ඔබ ඉගෙන ගනිමින් සිටින්නේ ධර්මය බව වටහා ගන්න.

ජීවිතය හොඳින් හා ධර්මානුකූලව පවත්වා ගැනීමට නම් ඔබට සිහි නුවණ තිබිය යුතුමය. හොඳ සිහියෙන් හෙවත් "සතියෙන්" තොරව ඔබ ඉතා සුළු මොහොතක කාලයක් සිටියත් ඔබ පසුවන්නේ කිසියම් උමතු ගතියකිනි. හොඳ සිහියෙන් සිටීම යනු ඔබ ඔබ ගැනම දැනුමින් හා අවබෝධයකින් සිටීමය.

**නිව්ටන් ගුණසේකර**



"යමකු බැරෑවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# පිරිත් අසන්නට දෙවියන් වුවත් වඩින්නේ නිවැරදිව කිව්වොත් විතරයි

අතීතයේ මිනිස්සු පිරිත් කියා රාත්‍රී නින්දට යාම පුරුද්දක් කොට ගෙන තිබිණි. මෙසේ පිරිත් කීමේදී ඇතැම් ගැමියෝ පිරිත් පොතේ දේවාරාධනාව පමණක් එක් දවසක කොට ඉතිරි සූත්‍රය කීම පසුදට කල් තැබූහ. දේවාරධනාව කරද්දී දෙවියෝ පිරිත් ඇසීමට සතුටින් එම ස්ථානයට එකතු වූහ. ඊළඟ දවසේ පිරිතේ එක කොටසක් පමණක් කීහ. ඊට පසුද පිරිතේ තවත් කොටසක් කීහ. දෙවියන් තම නිවසින් නික්ම යාම වළක්වා තම නිවසේ රඳවා ගැනීමට ගැමි ජනයා මෙවැනි උපක්‍රම භාවිත කළ බව පෙනේ. එය නිවසේ සෙත ශාන්තියට හේතුවක් බව ඔවුහු සිතූහ.

ගෙදර පිරිත් කියන විට අමනුෂ්‍ය කරදර විවිධ ශබ්ද ඇසේය. විවිධ ගඳ හමා එන්නේය. කරදර වැඩිවන බවටද ප්‍රවාද නැගේ. එසේ වීමට ප්‍රධාන හේතුව ධර්ම ගෞරවයෙන් තොරව කිරීම නිසා දෙවියන්ගේ ආශිර්වාදය අහිමි වීමය.

එබැවින් පිරිතක් කියන විට පළමුව මල්පහන් තබා තෙරුවන් වැඳ, ධර්ම ගෞරවයෙන්, ශ්‍රද්ධාවෙන්, ඉතාම පිරිසිදු තැනකදී කළ යුතුය. ප්‍රධාන කොටම පිරිත් කියන නිවෙස ගෙරි මස් වැළකීමෙන් ආරක්ෂා කළ යුතුය. පිරිත් පොත බලා වේගයෙන් පිරිත කියාගෙන යන විට එය අර්ථය නොදන වචන මාලාවක් ගායනා කිරීම පමණක් වේ. එවැනි විටක ඇති කරන ප්‍රතිඵලය ද බලය හීන වූවකි. එයින් දෝෂ මගහැරීමක් හෝ මහා සෙතක් ආශිර්වාදයක් බලාපොරොත්තු විය නොහැක.

ඕනෑම කෙනෙකුට තම නිවසේදී මහා මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය, මහා ජයමංගල ගාථා, රතන සූත්‍රය වැනි පිරිත් සජ්ඣායනා කිරීමේදී උච්චාරණ විධි තිබුණත් එයින් පිටස්තරව ගායනා වුණා කියා හානියක් නැත.

එහෙත් සමහර පිරිත් සූත්‍ර සජ්ඣායනා කරන විට උච්චාරණ විධිය අත්‍යන්තයෙන්ම වැදගත් වේ. එසේ නොවුණොත් පෙරළා දෝෂ පැමිණීමේ ඉඩක් නැතැයි කිව නොහැක. නිවැරදි උච්චාරණය දෙවියන්ගේ ප්‍රසාදයට හේතු වූ ආකාරය පුරාණ අටුවා කතාවල දක්වේ. ඉන් එකක් මෙසේය.

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''



පුරාණ රුහුණු රටේ කැලෑබද ප්‍රදේශයක ගල් ලෙනක ගුරු හිමිනමක් හා ළාබාල සාමණේර හිමි නමක් විසූහ. දවසක් ගුරු හිමියෝ දින කීපයක් සඳහා දුර ඈත ගමකට වැඩම කළහ. සාමණේර හිමියන් රාත්‍රී කාලයේ පහනක් දල්වා ලෙන අසළ ගසක් යටට වී පිරිත් සූත්‍ර කටපාඩම් කළහ. එක් අවස්ථාවක උන්වහන්සේ මහා සමය සූත්‍රය මිහිරි හඬින් සජ්ඣායනා කළහ. ඒ අසා සිටි එක් දෙවියෙක්.

"සාදු... සාදු..." අයුරින් හඬක් නැගූහ. ඒ ඇසූ පොඩිහාමුදුරුවෝ අඳුර අතරින් වට පිට බැලූහ. කිසිවෙක් පෙනෙන්නට නැත.

"ඔබ කවුද?"

"ස්වාමීන් වහන්ස, මම දෙවි කෙනෙක්" දෙවියෝ ප්‍රකාශ කළහ.

ඔබවහන්සේ මහාසමය සූත්‍රය ඉතා නිවැරදිව මිහිරි හඬින් සජ්ඣායනා කළා. මම මේ සූත්‍රය එද බුදුරජාණන් වහන්සේ දේශනා කරද්දීත් මේ දිව්‍ය ආත්මයේ සිටම අසා සිටියා. එද උන්වහන්සේගෙන් මේ සූත්‍රය අසන්නට කෙතරම් දෙවිවරු වැඩම කළාදැයි කියනවා නම් මේ අහස දෙවියන්ගෙන් පිරී ගියා. දේව සභාවේ සිටි මට එද මහාසමය සූත්‍රය අසන්නට සිදුවූයේ මේ රුහුණු රටේ සිටයි. එදයින් පසු මට අද මිහිරි හඬින් නිවැරදි උච්චාරණයෙන් ඒ සූත්‍රය ඇසුණ නිසා සාදුකාර දුන්නායි කියා සිටියේය.

"මට ඔබ දකින්න ආසයි පෙනී සිටින්න" සාමණේර හිමියෝ ඉල්ලා සිටියහ.

"ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ ධර්මාවබෝධය ලබා නෑ. එම නිසා වීර්යය වඩා ඉක්මනින් ධර්මාවබෝධය ලබන්න. එබැවින් මගේ දිව්‍ය ශරීරය ඔබට නොපෙන්වමි. ආලෝකයක් ලෙස පෙනී සිටිමියි" පවසා ආලෝකයක් ලෙස පෙනී සිටි බව කියවේ.

පිරිත් සජ්ඣායනා කරන කාටත් මේ මනා වූ ආදර්ශයට කාරණයකි. නිවෙසේ ආටානාටිය සූත්‍රය වුවත් සජ්ඣායනා කළ හැකිය. නමුත් නිවැරදි ප්‍රතිපත්තියේ සිට නිවැරදි උච්චාරණයෙන් කළ යුතුය.

උද ලෙස අනිච්චා වත සංඛාරා උප්පාද වය ධම්මිනෝ යන ගාථාව නිවෙසේ උදේ හවා කීවත් එයද සෙත ශාන්තියකි. අද වනවිට සිදුවී ඇත්තේ "අනිච්චා වත සංඛාරා" යන ගාථාව මළ ගෙදරටම සීමාවී එය මළ ගෙදර ගායනා කරන තත්ත්වයට පමණක් වෙන්වී තිබීමය.

මේ ආකාරයට බොහෝ පිරිත් සූත්‍ර, ගාථා මිනිසුන් විසින් විවිධ දේට විවිධ අවස්ථාවලට වර්ග කරනු ලැබ ඇත. ඒ හැර බුදුරජාණන් වහන්සේ විසින් මේ පිරිත අසවල් තැනදීම කළ යුතු යැයි දේශනා කරනු ලැබ නැත.

නමුත් තුන් සූත්‍රය හැර සෙසු යම් යම් සූත්‍ර සජ්ඣායනා කිරීමේදී උච්චාරණ දෝෂ වුවහොත් ඒ දේශකයාට හා නිවෙසට පැහැදිලිවම දෝෂ පැමිණේ.

මේ දෝෂ එල්ල කරන්නේ බලවත් වූ අමනුෂ්‍යයන් විසිනි. නිවැරදි උච්චාරණයට සූත්‍ර සජ්ඣායනාවේදී අමනුෂ්‍යයන් බියට පත්වී පලා යයි. නමුත් උච්චාරණය දුර්වල වන විට බලවත් යක්ෂයෝ පලා නොගොස් තමන්ව පන්නන්නට උත්සාහ දරන අයට හානි පමුණුවයි. තමන් සිටින විමානය නැති කරන්නට යන බව දන්නා විටම එක විට එක බාධා ගෙනෙයි.

දේශකයා කායික මානසිකව ලෙඩ කර නිවසේ අය අසනීප කර ව්‍යාපාර ආදිය දුර්වල කොට එකිනෙකා හා අසමගිය ඇතිකොට කටයුතු කරවයි. ධර්මයට නිවැසියන්ගේ උනන්දුව අඩු කරයි.

අපි ගෙදර පිරිත් කියනවා. ඒත් කරදරවල අඩුවක් නැතැයි ඇතැම් නිවැසියෝ පවසති. එසේ නම් වහාම තමන් කියන පිරිත් නිවැරදි උච්චාරණයත්, ශ්‍රද්ධාවෙන්, පිරිසිදුව, ප්‍රතිපත්තියෙන් සිදුවේද නැද්ද යන්න වඩාත් කල්පනා කළ යුතුවේ.

**ධර්ම ගවේෂක**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."

# යානීධ භූතානි සමාගතානි ගාථාව කියන විට අමනුෂ්‍යයන් නිවසට පැමිණෙනවාද?

## පිරිත් දෙසුම් පිළිබඳ බොදු සමාජයේ ගැටලුවලට විසඳුම්

නූතන බෞද්ධ සමාජයේ බොහෝ දෙනකු තුළ පිරිත් දේශනය සහ පිරිත් ශ්‍රවණය සම්බන්ධ විවිධ ගැටලු පැන නැගී ඇති බව පෙනෙයි. ශබ්දවාහිනී යන්ත්‍ර මගින් සහ ගුවන් විදුලිය මගින් විකාශනය කෙරෙන පිරිත් දේශනාවලින් නිසි ඵල අත්වේද? යන්න අද බොහෝ දෙනකු තුළ පවතින කුකුසකි.

පිරිත් දේශනයක් සිදුකිරීමේදී සහ එය ශ්‍රවණය කිරීමේදී සම්පූර්ණ විය යුතු ආධ්‍යාත්මික සහ සදචාරාත්මක අංග කිහිපයකි. මහා සංඝරත්නය විසින් සජ්ජායනා කරනු ලබන පිරිත් දේශනයක් ශබ්දවාහිනී හෝ ගුවන් විදුලිය මගින් ප්‍රචාරය වුවද එම ආධ්‍යාත්මික සහ සදචාරාත්මක අංශවලින් වැඩි කොටසක් හෝ සපිරේ නම් පිරිතෙහි සැබෑ ගුණය සහ ආනුභාවය අත්විඳිය හැකි බව පළමුව කිව යුතුය.



එහෙත් වර්තමානයේ එම සීමා මායිම් සැහෙන දුරට උල්ලංඝනය වී ඇති බව අප නිතර අත්දකින සත්‍යයකි. වර්තමාන තාක්ෂණික පහසුව මත ශබ්දවාහිනියක් සහ ගුවන් විදුලි යන්ත්‍රයක් මගින් පිරිත් දේශනයක් විසුරුවා හැරීම කෙසේවත් අසීරු කටයුත්තක් නොවේ. බොහෝවිට එය කලින් අවස්ථාවක පටිගත කරන ලද්දකි. එමෙන්ම ඉන් නිකුත් වන්නේ සැබෑ මිනිස් කටහඬක්ද නොවේ. සැබෑ මිනිස් කටහඬට තරමක් සමීප වෙනත් සංඛ්‍යාතයක ශබ්ද මාලාවකි. එමෙන්ම එම පිරිත් දේශනාවන් වුව ඉබේ ඇසෙනවා මිස බොහෝ දෙනකු එය ශ්‍රද්ධාවෙන් ශ්‍රවණය කරන බවක් අපට නොහැඟේ. විශේෂයෙන් වර්තමානයේ බොහෝ නාගරික, අර්ධ නාගරික සේම ගම්බද ප්‍රදේශවලද ඇතැම් විහාරස්ථානවලින් සේම මංසන්ධි ආදියේ ඉදිකොට ඇති බුද්ධ ප්‍රතිමා, ත්‍රිරෝද රථ ගාල්, පොදු වෙළෙඳ සංකීර්ණවලින් දිනපතා උදය සවස අසන්නට ලැබෙන පිරිත් දේශනා අප ඉහත සඳහන් කළ පරිදි ශ්‍රද්ධා භක්තියෙන් යුතුව ශ්‍රවණය කරන්නවුන් කීයෙන් කීදෙනකු හිඳියි දැයි ඔබම සිතා බැලිය යුතුය. බොහෝ දෙනකුට ඒ පිරිත් දේශනා ශ්‍රවණය වනුයේ ගමනක් බිමනක් යන අතරේය. නැතහොත් ගෙදර දොර කිනම් හෝ වැඩපලක සිටින අතරේය. එසේත් නැතිනම් ආහාර ගන්නා අතරේ මුව කට දෙවන හෝ ශරීර කෘත්‍යය කරන අතරේය. එවන් කිනම් හෝ අවස්ථාවක තෙරුවන කෙරෙහි තුන් හිත පහදා ගැනීමට ඇති අවකාශය සහ ඒ සඳහා වන යෝග්‍යතාව කොතෙක්දැයි සිතා බැලීම බුද්ධිමත් ඔබට භාරය.

එසේම දැනට වසර කිහිපයක සිට ඇතැම් නාගරික ප්‍රදේශවල දිනපතා අලුයම් යාමයේ සහ සන්ධ්‍යා සමයේ තරගකාරී මට්ටමින් ශබ්දවාහිනී යන්ත්‍ර මගින් පිරිත් විසුරුවා හරින අයුරු අපට ඕනෑ තරම් අසන්නට ලැබී තිබේ. එවට අපට ශ්‍රවණය වන්නේ කන්කරච්චලයකට තුඩු දෙන මහත් ඝෝෂාවක් මිස බුදුන් විසින් දේශනා කොට වදාළ නෛර්යානික ශ්‍රී සද්ධර්මය නොවේ.

මෙයද වත්මන් සමාජයේ පවත්නා අතිශය අගතිගාමී තත්ත්වයකි. මෙම තත්ත්වය දුරලීම සඳහා මෙරට මහා සංඝරත්නය සහ බෞද්ධ ගිහි සමාජය අතා මහා සුසංවාදයක් ඇරඹීමේ කාලය උදාවී දැන් බොහෝ කලකි.

ශබ්දවාහිනී යන්ත්‍ර මගින් සිදුකරනුයේ කිසියම් ශබ්දයක් කිලෝ මීටර් කිහිපයක් දුරට විසුරුවා හැරීමය. ඒ අනුව ඒ ශබ්දය සාමාන්‍ය මනුෂ්‍ය කටහඬක ස්වරූපයෙන් ශ්‍රවණය කළ හැක්කේ ඊට තරමක් දුරින් හිඳින්නකු හටය. එසේ නොමැතිව එම ශබ්ද විහිද යනුයේ ඇතැම් විට සවන් පත්වලට දරාගත

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

නොහැකි ශබ්දයක් ලෙසින් විය හැක.

බුද්ධාදී මහෝත්තමයන් වහන්සේලා නිබඳව නිහැඬියාව අගය කරන බව බොහෝ සූත්‍ර දේශනාවන්හි පැහැදිලිවම සඳහන්ව තිබේ. එවන් පසුබිමක් යටතේ පිරිත් දේශනා වුව ශබ්දවාහිනී මගින් අධි ශබ්දයෙන් යුතුව විසුරුවා හැරීමේ යෝග්‍යතාව පිළිබඳව අප කවුරුත් විචාර බුද්ධියෙන් යුතුව විමසා බැලිය යුතුව තිබේ. මින් අප පවසා හිඳිනුයේ ශබ්දවාහිනී මගින් විසුරුවා හැරෙන පිරිත් දේශනා මුළුමනින් අවලංගු කර දැමීම නොවේ. ප්‍රඥා සම්පන්න බෞද්ධයන් වශයෙන් ඒ සඳහාද ආචාර විචාර සම්ප්‍රදයක්ද අනුගමනය කළ යුතු බවකි.



පිරිත් දේශනා සිදුකරන ස්ථානවලට අමනුෂ්‍යයන් පැමිණෙතැයි යන විශ්වාසය දැන් කාලෙක සිට සර්ව රාත්‍රික පරිත්‍රාණ දේශනාවල සිදුකෙරෙන ආටානාටිය සූත්‍රය සම්බන්ධයෙන් ඇති වූවකි. ඊට හේතුව එහි යක්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමත්, එම සූත්‍රය දේශනා කිරීමේදී භික්ෂූන් වහන්සේලා විශේෂ උච්චාරණ විධි අනුගමනය කිරීමත් නිසා විය හැකිය. එමෙන්ම රතන සූත්‍රයේ එන ''යානීධ භූතානි සමාගතානි'' යන වදන මුල් කොට ගෙන රතන සූත්‍ර දේශනාව ඇසීමටද භූතයන් පැමිණෙතැයි යන දුර්මතයක් මෑතක සිට සමාජය පුරා පැතිරෙමින් පවතී.

නිරෝකුඩ්ඩ ආදී සූත්‍ර දේශනාවලට අනුව මිනිසුන් හට නොමැති අධිභෞතික බලයක් අමනුෂ්‍යයන් හට හිමිය. මෙම බලය මහේශාඛ්‍ය දෙවිවරුන්ගේ සිට ප්‍රේත පිසාචාදීන් දක්වා විශාල පරාසයක පැතිර පවතින්නකි.




ඒ අනුව මේ සියලු අමනුෂ්‍යයන් හට මනුෂ්‍ය වාසස්ථානවලට පැමිණීමට කිසිදු අවහිරයක් නැත.

බුදු ගුණ බල මහිමය අසම සම බව බෞද්ධ සැවොම පිළිගනිති. එම බලය අතික්‍රමණය කිරීමට කිසිදු මිනිසකුට, දෙවියකුට, බ්‍රහ්මයකුට හෝ යක්ෂයකුට නොහැක. ඒ අනුව කවර හෝ පිරිත් දේශනාවක් මුල්කොට අමනුෂ්‍යයන් නිවසට පැමිණෙතැයි ඒ පැමිණෙනුයේ ඇතැම් සිතින් සහ සැදැහැති සිතුවිලිවලින් යුතුවය. ඒ අනුව එසේ පැමිණීමක් සිදුවුවද ඉන් ඒකාන්ත වශයෙන් සිදුවන්නේ යහපතකි.

එහෙත් නිවෙස්වල සිට කෙරෙන පිරිත් සහ දනමාන මුල් කොට පස් පව් දස අකුසලවලට මුල පිරෙන මත්පැන් සාද පවත්වන්නේ නම් එසේ දැහැමි සිතින් පැමිණෙන අමනුෂ්‍යයන්ගේ දැහැමි බව නැතිවී ඔවුන්ගේ සිත් පව්ටු සිතුවිලිවලින් පිරී යයි. එවිට නම් එම නිවසට සහ නිවැසියන්ට නපුරක්, අයහපතක් සිදුවිය හැක. ඒ අනුව ඔබ විසින් තරයේම සිහි තබා ගත යුත්තේ බණ, පිරිත්, දන මානාදී පින්කම් නිවසේ සිදුකෙරෙන අතරේ හෝ ඉන්පසු රහමෙර ආදී විපත්තිකර කිසිවක් නිවස පැත්ත පළාතකට නොගැනීමටය.

**පූජ්‍ය බමුණුගම ශාන්තවිමල හිමි**

''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''



# මරණය
## මෙනෙහි කරමු

බුද්ධ දේශනාවට අනුව ලෝකයේ පවතින සියලුම අප්‍රාණික, සප්‍රාණික වස්තූන් යම් දිනක විනාශයට පත්වෙයි. මෙම ධර්මතාව කිසිම පුද්ගලයකුට වෙනස් කළ නොහැක. එය ලෝක ස්වභාවයයි. මනුෂ්‍ය ජීවිතයද මෙම ධර්මතාවට අඩංගුය. ඉපදෙන සෑම සත්ත්වයකුම මරණ ධර්මතාව පෙරදැරි කොටගෙන උප්ත ලබයි. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව වූයේ මෙලොව උපන් සියලුම මිනිසා මරණයට පත්වන බවයි. එසේම උන්වහන්සේ දේශනා කළේ මිනිසා මරණය පිළිබඳව මෙනෙහි කරමින් ජීවත් විය යුතු බවයි. මරණය මෙනෙහි කරන ආකාර අටකි. ඒ මෙසේය.

1. **වධක පච්චු පට්ඨානය** - වධකයකු සිය ගෙල සිඳීමට තමා පසුපස සිටින බව සිතා ජීවත් විය යුතුය.
2. **සම්පත්ති විපත්තිය** - තමා සතු සම්පත් යම් දිනක විනාශ වන්නේ යම් සේද එසේම මරණය පිළිබඳ සිහි කටයුතුය.
3. **උපසංහරණය** - ලෝකයේ පහළ වූ ශ්‍රේෂ්ඨ පුද්ගලයෝද මරණයට පත්විය. එසේම මමද මරණයට පත්වන්නේය යනුවෙන් සිහිකට යුතුය.
4. **කායබහු සාධාරණය** - සම්, ලේ, ඇට, මස්, නහරවලින් සෑදුණා වූ මේ ශරීරය පණුවන්ට ආහාර වන්නේය සිතා මරණය පිළිබඳ සිහිකටයුතුය.
5. **ආයු දුබ්බලත්වය** - මිනිසාගේ ආයුෂය කෙටි බව සිහිකොට මරණය පිළිබඳව සිහිකටයුතුය.
6. **අනිමිත්තය** - මරණය මෙම වයස් සීමාවේදීම සිදුවිය යුතු යැයි නිශ්චිත කොට නොහැකි බව සිහිකටයුතුය.
7. **අද්ධාන පරිච්ඡේදය** -,මෙම කාලවකවානුවේදී මනුෂ්‍යයාගේ ආයුෂ ප්‍රමාණය මෙපමණකැයි ලෙස නිශ්චය කිරීමට නොහැකි බව මෙනෙහි කිරීම.
8. **ඛණ පරිත්තය** - මනුෂ්‍ය ජීවිතය මොහොතක් පාසා වෙනස් වෙමින් මරණයේ දෙරටුව කරා ගමන් කරමින් පවතින බව මෙනෙහි කළ යුතුය.

මෙම ආකාර අටට තමා මරණයට පත්වන්නේ යැයි යමෙක් මෙනෙහි කරමින් ජීවත් වන්නේ නම් හෙතෙම වැරදි කිරීමට නොපෙළඹේ.

*(විශුද්ධි මාර්ගය)*

# මළගිය ඥාතීන්ට ගෙදරදී පින් අනුමෝදන් කිරීම නුසුදුසුද?

බෞද්ධයන් ලෙස අපි ඕනෑම පින්කමක් අවසානයේ "ඉදම්මේ ඥාති නංහෝතු" ගාථාව කියමින් මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කරමු. නමුත් නිවසින් පිටත ස්ථානයකදී මිස නිවස තුළදී මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම තුළින් ඔවුන් අපේ ගෘහ සීමාව වෙත පැමිණ අපට කරදර කරාවි යනුවෙන් බියක් සමහරුන් තුළ තිබේ.

පරලෝසැපත් ඥාතීන්ට සැලකීම ඈත අතීතයේ පටන් සමාජය තුළ පැවැති කෘතවේදී ක්‍රියාවකි. සෑම ආගමකම පාහේ මළවුන් සිහිපත් කිරීමේ සම්ප්‍රදයන් තිබේ. ඇතැමුන් තම මියගිය ඥාතියා සිහිපත් කරන්නේ, ඔහු මියගිය දිනට සුසාන භූමියට ගොස් මල් පහන් පිදීමෙනි. පුරාණ ඉන්දියාවේ සමහරු තම ඥාතියා ජීවත්ව සිටින විට භාවිත කළ බඩු බාහිරාදිය ගිනි තබා ගිනි දෙවියන් පුද ඥාති ප්‍රේතයන් සුවපත් කළහ.

ඇත්ත සහ බොරුව



"දෙවු වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."

මෙවැනි විවිධ වූ සිරිත් විරිත් යටතේ බුදුරජාණන් වහන්සේද මියගිය ඥාතීන්ට සැලකීමේ ක්‍රමයක් අනුදැන වදාළහ. ඒ අන් කිසිවක් නොව, ඉහතද සඳහන් කළ පරිදි පින් අනුමෝදන් කිරීමයි.

මියගිය ඥාතීන් හැඳින්වීමේදී බුදු දහමද පිළිගන්නා එක්තරා වචනයක් තිබේ. ඒ ''ඥාති ප්‍රේත'' යනුවෙනි.

ප්‍රං‍ඉත යන වචන දෙක එකතු වී ප්‍රේත යන්න සෑදී ඇත. 'ඉත' යනු මේ ලෝකයයි. 'ප්‍ර' යනු පිටත්ව යාමයි. ඒ අනුව මේ ලෝකයෙන් පිටතට ගිය හෙවත් මියගිය හැමදෙනාම ප්‍රේත යන වදනින් හැඳින්විය හැකිය. එබැවින් මියගිය ඥාතීන් මළ ප්‍රේතයන් ලෙස හැඳින්වීමේ වරදක් නැත.

එසේ වුවද බුදු දහමේ සතර අපායක් පිළිබඳව දැක්වේ. මේ අපාය සතර නම් අවීචිය හෙවත් නරකය, තිරිසන්, ප්‍රේත සහ අසුරය. ඒ අනුව මෙම ප්‍රේත ලෝකයෙහි උපදින සත්ත්වයන්ද ප්‍රේත ලෙසම හැඳින්වේ. මෙම සතර අපායට අයත් 'ප්‍රේත' ලෝකයෙහි උපදින සත්ත්වයන් හට නිරායාශයෙන්ම දුක් විඳින්නට සිදුවෙයි. මෙම ප්‍රේත ලෝකයෙහි විවිධ ප්‍රේත කොට්ඨාස හිඳින අතර ඉන් එක කොට්ඨාසයක් වන්නේ ''**පරදත්තූප ජීවීන්**'' ය. අප අනුමෝදන් කරන පින් අනුමෝදන් විය හැක්කේ ප්‍රේත ලෝක අතරින් මෙම **පරදත්තූප ජීවී** කොට්ඨාසයේ හිඳින ඥාති ප්‍රේතයන්ට පමණි. දෙවියන්ටද පින් අනුමෝදන් වීමට පුළුවන. නමුත් ඒ පින් කැමැති දෙවියන්ට පමණි. මළගිය ඥාතීන් මනුෂ්‍යයන් වී ඉපදුණොත් ඔවුනට පෙර ආත්ම භාවවල ඥාතීන් අනුමෝදන් කරන පින් ලබා ගැනීමේ හැකියාවක් නැත. එසේම අවීචි නරකාදියෙහි උපන් සත්ත්වයන්ටත්, තිරිසනුන්ටත් පරදත්තූප ජීවී කොට්ඨාසයට අයත් නැති වෙනත් ප්‍රේත කොට්ඨාසවලටත්, අසුරයින්ටත් මිනිසුන් අනුමෝදන් කරන පින් ලබාගැනීමට නොපුළුවන.

පරදත්තූප ජීවී කොට්ඨාසයට අයත් ප්‍රේතයෝ නිතරම තමන්ගේ පෙර භවයේ ඥාතීන්ගෙන් පින් අපේක්ෂා කරති. මේ ලෝකයේ සිටින ඥාතීන් පින්කම් කොට එම පින් අනුමෝදන් කළ විට ඒ ලෝකයේ සිට ඔවුහු එම පින්කම දෙස බලා ''සාදු සාදු'' යැයි අනුමෝදන් වෙති. තව කෙනෙක් කරනු ලබන යහපත් දෙයක් දෙස බලා සතුටු වීමද කුසලයක් වේ. එම අනුමෝදන් වීමේ පින්කම සිදුකර ඇති නිසා **පරදත්තූප ජීවී** කොට්ඨාසයේ සිටින ඥාති **ප්‍රේතයා** පිනෙන් ශක්තිමත් වී එම පිනෙහි විපාක ලෙස සැප ඇති තැනක ප්‍රතිසන්ධිය ලබනු ඇත.

ඛුද්දක නිකායේ ''**තිරෝකුඩ්ඩ සූත්‍රය**'' ට අනුව මළගිය ඥාතීන්ට පින් අනුමෝදන් නොකළොත් ඔවුන් පින් ලබා ගැනීමේ රිසියෙන් තම ඥාති නිවෙස් සමීපයට පැමිණෙනු ඇත. මෙමගින් පැහැදිලි වන්නේ ඥාති ප්‍රේතයන් ඔවුන්ගේ පෙර භවයේ ඥාතීන් තමන් උදෙසා පින් අනුමෝදන් නොකරන විට මෙලෙස පැමිණෙන බවය. මෙසේ පින් බලාපොරොත්තුවෙන් පැමිණියත් ඔවුන් ජීවත්ව සිටින තම පෙර භවයේ ඥාතීන්ට පීඩා කරන්නේ නැත. එසේම පින් අනුමෝදන් වූ පසු ඔවුන් ඥාතීන්ගේ සමීපයේ රැඳෙන්නේද නැත. ඒ ඔවුන්ගේම එම ආත්ම භවයට අනුව ඔවුන්ට ගෙවල්වල වාසය කිරීමක් අවශ්‍ය නොවන නිසාය. එබැවින් බිය සැක දුරලා තමන්ගේ නිවසේදීත් වෙනත් ඕනෑම තැනකදීත් තමන් කරන හැම පින්කමක්ම අවසානයේ මළගිය ඥාතීන්ට පින් අනුමෝදන් කළ යුතුය.

එසේ අනුමෝදන් කිරීමේදී පින් අපේක්ෂාවෙන් සිටින මළගිය ඥාතීහු වෙත්නම් ඔවුන් පින් ලබා ගන්නා අතරේ තමන් කළ පින් අනුමෝදන් කිරීම නිසා තමන්ගේ පිනද වැඩි වනු ඇත. **පින** යනු තවත් කෙනකුට අනුමෝදන් කරන තරමටම වැඩි වන්නක් මිස අඩු වන්නක් නොවේ.

මෙකල සමහරු තම ඥාතියා මියගිය පසු උපදින්නේම ප්‍රේත ලෝකයේ බව විශ්වාස කරන්නට පුරුදු වී හිඳිති. මළගිය ඥාතියා වෙනුවෙන් ධර්ම දේශනාමය පින්කම කරන අවස්ථාවේ **ප්‍රේත තටුවක්** තබන්නේ එනිසාය. මේ ප්‍රේත තටුවට ඥාතියා කෑමට බීමට ප්‍රිය කරන දේවල් ඇතුළත් කෙරේ. එපමණක් නොව, මියගිය ඥාතියා දුම් සහ මත්පැන් පානය කළ අයකු නම් ඒවාද ප්‍රේත තටුවට එකතු කෙරෙනු ඇත. නමුත් කිසිදු ප්‍රේතයකුට මෙම ආහාර වැළඳිය නොහැකිය. මේවා පරිභෝජනය කරතොත් ඒ කකුල් දෙකෙන් ඇවිදින අහල පහළ මනුෂ්‍ය ප්‍රේතයකුට පමණි. එනිසා මෙවැනි අභිචාර විධි හරවත් බෞද්ධ ක්‍රියාකලාප නොවේ.

මේ අනුව, ඔබ හොඳ බෞද්ධයකු නම් කළ යුතු වන්නේ මියගිය ඥාතින් උදෙසා සැමද බුදුන් වඳින විට සහ දන කර්ම පින්කම් සිදුකරන විට තම නිවසේදීම කිසිදු බියක් ඇතිකර නොගෙන පින් අනුමෝදන් කිරීමය. එයින් ඔබටත් මළගිය ඥාතීන්ටත් යහපතක්ම අත්වනු ඇත.

**ඉන්දු පෙරේරා**



''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''



ධර්ම දේශනය

# අටමහකුසලින් පළමු තැන ගත් කඨින පිංකම

"පඨවිරිවන ජාතු කම්පතෙ - න චලති මෙරු රිවාති වායුනා
වජිරම්ච න භිජ්ජතෙ ඝනං - තම්ධමමතො කඨිනන්ති වුච්චති"

"කඨින චීවර දානමය කුසලය මහපොළොව මෙන් කිසිකලෙකත් කම්පා නොවෙයි. මහාමේරු පර්වතය මෙන් අධික සුළඟෙන් නොසෙල්වෙයි. ඒකඝන වජ්‍රපර්වතය මෙන් නොබිඳෙන ස්ථාවර ගරු පුණ්‍යක්‍රියාවෙකි."




දේශකයාණෝ : ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශද්වර්ගික කාරක සංඝ සභික

පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර

තේවාවහාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ


පින්වත්නි,

වප් පුන් පොහෝ දිනය බෞද්ධ පින්වතුන්ට ඉතා වැදගත් පොහෝ දිනයකි. සම්බුද්ධ ශාසනයේ ඉතාමත් වටිනාම පින්කම කරගැනීමට හැකිවන්නේ වප් පුන් පොහොය මුල්කර ගෙනයි. මහත් ආනිසංස ගෙන දෙන කඨින චීවර පූජා කිරීමේ මහා පුණ්‍යකර්මය සිදුකිරීමේ ආරම්භය සනිටුහන් වන්නේ මෙම උතුම් පොහෝ දිනයේදීය. එමෙන්ම තවත් කරුණු කීපයක් නිසා බෞද්ධ අපට වප් පුන් පොහෝ දිනය වැදගත් වේ. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ තව්තිසා දෙව්ලොව දී මාතෘ දිව්‍යරාජයාට විජම්පිටකය දේශනා කොට අවසන සංකස්ස පුරයෙන් මනුලොවට වැඩම කිරීම, වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා මහාපවාරණය කිරීම මෙන්ම ලාංකික අපට තවත් කරුණු කීපයක් නිසා මෙම උතුම් පොහෝ දිනය වැදගත් වේ. දෙවනපෑතිස් රජ දවස ධර්මාශෝක මහරජතුමන් වෙත පණිවිඩ යවා ශ්‍රීමහාබෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩමවීමට කටයුතු යෙදීම, අරිට්ඨ මහතෙරුන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් විනය පිටකය සංඝායනා කිරීම ආදී ශාසනික කටයුතු කීපයක්ම වප් පුන් පෝය මුල්කොට ගෙන සිදුවිය.

භාරත දේශයේ බුද්ධකාලීන අන්‍ය දාර්ශනික පූජකයෝ අධික ලෙස වැසි පවතින කාලය තුළ බැහැරට නොගොස් ආරාමයන්හිම වාසය කළහ. එසමයෙහි චාරිකාවන්හි යෙදුන බෞද්ධ භික්ෂූන්වහන්සේට ඔවුහු දොස්නැගූහ. මේ බව දත් බුදුරජාණන්වහන්සේ "අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං" යනුවෙන් උපසම්පදා භික්ෂූන්වහන්සේට ශික්ෂා පදයක් පනවා උපසපන් භික්ෂූන් වහන්සේට වස් සමාදන් වන ලෙසට අනුදැන වදාළහ. එතැන් සිට උපසපන් භික්ෂූන්වහන්සේ වස්විසීමට අදිටන් කරගත්හ. එම චාරිත්‍රය අවිච්ඡින්නව අදටත් පවත්වාගෙන ඒම සිරිතක්ව පවතී. පෙරවස් හා පසුවස් යනුවෙන් වස්සාන දෙකක් ඇත. ඇසළ අවපෑලවියෙන් එනම් ඇසළ පසළොස්වක පෝය දිනට පසුදින වස් සමාදන් වීම පෙරවස් නමින් ද, නිකිණි පුන් පොහෝදාට පසු වස් එළඹීම පසුවස් නමින් ද හැඳින්වේ. පෙරවස් සමාදන් වීමට නොහැකි වූ භික්ෂූන්වහන්සේ නමකට පසුවස් සමාදන් වීමට හැකිය. ලක්දිව වස්විසීම ආරම්භ වූයේ මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමෙන් අනතුරුවයි. ඒ සඳහා දේවානම්පියතිස්ස රජු විසින් අටසැටලෙන්වල වස් සමාදන් වූ භික්ෂූන්වහන්සේලාට පහසුකම් සලසා දුන් බව මහාවංශයේ සඳහන් වේ.

වස් සමාදන් වන සිල්වත් භික්ෂූන්වහන්සේ තමන් වහන්සේටත් දායක කාරකාදීන්ටත් කුසල් රැස්කර ගැනීමට මුල් දින තුන දී කටයුතු කරනු ලබයි. ගිහි දායක

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

ඇත්තන්ගේ ආරාධනයක් තිබුණ ද, නොතිබුණ ද උපසපන් භික්ෂූන් වහන්සේලා වස් සමාදන් විය යුතුය. වර්තමානයේ සෑම විහාරස්ථානයකම දායකයන්ගේ ආරාධනයෙන් උපසපන් භික්ෂූන් වහන්සේලා වස් සමාදන්ව වස් තුන්මාසය විහාරාරාමවල වැඩවාසය කරති. මෙම කාල වකවානුවේ දී දායකයින් සිවුපසයෙන් උපස්ථාන කරන අතර භික්ෂූන් වහන්සේ දායකයන්ට ධර්මයෙහි මනා ලෙස හැසිරීමට අවශ්‍ය අවවාද අනුශාසනා ලබාදෙති. මෙම කාලය තුළ දී විහාරාරාම වලින් බැහැරවන්නේ නම් සත්තාහරණයෙන්, සතිකරණයෙන් යුතුව බැහැර විය යුතුය. දෙමව්පියන් රෝගාතුර වීම, මහාසංඝරත්නය කැඳවීම, අසාධ්‍ය භික්ෂූන්වහන්සේ නමකගේ කැඳවීම වැනි ඉතා වැදගත් කරුණකදී සත්වන දින අරුණ නැගෙන්නට පෙර ජීවිතයට අනතුරක් නොවුනි නම් පැමිණෙන බව දන්වා ආරාමයෙන් බැහැරට යා හැකි වුවද භයවන දින රාත්‍රියේ හෝ ආපසු පැමිණිය යුතු වේ. එසේම වස් වසන භික්ෂූන්වහන්සේගෙන් දැඩි විනය පිළිවෙත් රැකීමක් සිදුවන බැවින් එය මාහැඟි ප්‍රතිපත්ති පූජාවක් ද වේ. එසේ වස්සානය නිසි ලෙස පිළිපදින භික්ෂූන්වහන්සේ නමකට පමණක් කඨින චීවරයක් පිළිගත හැකි වේ. නිසිලෙස වස් සමාදන් වීම යනු භික්ෂූන්වහන්සේට මෙන්ම උපාසකයන්ට ද උදාර පිංකම් රැස්කරගත හැකි පුණ්‍යකර්මයකි.

බුදුන්වහන්සේ විසින් කඨිනය අනුදැන වදාළේ පාවෙය්‍ය නම් රටෙහි විසූ භික්ෂූන්වහන්සේ තිස්දෙනෙකු අරභයාය. ඒ සියලු භික්ෂූන්වහන්සේ ආරණ්‍යයික පිණ්ඩපාතික පාංශුකූලික භික්ෂූහුය. ඒ තෙරුන්වහන්සේලා තිස්නම බුදුන්වහන්සේ දකිනු රිසිව සැවැත් නුවර වඩින ගමනේ දී, වස් එළඹෙන දිනට යා ගත නොහැකිව සාකේත නුවර අසළ සෙනසුනක වස් එළඹ වස් තෙමස ගෙවා, වස්පවරා යළිත් ගමනාරම්භ කොට වැලනොකැඩී වසිනා වැස්සෙන් වලගොඩැලි නොපෙනෙන තරමට ජලයෙන් පිරුණු මග ඔස්සේ වැඩමකිරීමේ දී සිවුරු තෙමී ගොස් ගමන් වෙහෙසින් ක්ලාන්ත ස්වභාව ඇතිව සැවැත්නුවර දෙව්රම්වෙහෙරට ළඟා වූහ. බුදුරජාණන්වහන්සේ වෙත ගිය භික්ෂූහු වැඳ එකත්පස්ව සිටි කල්හි, බුදුන්වහන්සේ සිරිත් පරිදි ආගන්තුක භික්ෂූන්වහන්සේ සමඟ පිළිසඳරෙහි යෙදී ගමනෙහි විඳි දුක්ගැහැට විමසා කරුණා උපදවා, අනමතග්ග සූත්‍රයෙන් බණ වදාරා පෙරවිසූ බුදුවරුන්ගේ සිරිත මෙන් වස්විසූ භික්ෂූන්ට කඨිනාස්තරණය පනවනු ලැබී නම් මේ භික්ෂූන්ට තමන් කැමති පරිද්දෙන් තුන්සිවුරෙන් එක් සිවුරක් තැන්පත් කර තබා, අන්තරවාසිකයෙන් හා උත්තරාසංග යෙන් පමණක් යුක්තව ගමන් කොට ගමන නිමවා ආපසු තම ආරාමයන් කරා ගොස්, තැන්පත් කළ සිවුර පැළඳ සුවසේ විසිය හැකි නොවේදැයි සලකා කඨිනාස්තරණය පැනවීම පිණිස භික්ෂූන් අමතා, මහණෙනි, වස්විසූ භික්ෂූන්ට හෙවත් පෙරවස් වසා මහාපවාරණයෙන් පැවරූ හෝ යම්කිසි අන්තරායකින් නොපැවරූ හෝ භික්ෂූන් කඨිනාස්තරණය කරන්නට අවසර දෙමියි දක්වා වදාළ සේක.

කඨින සිවුරු පූජා කිරීම, අටපිරිකර පූජා කිරීම, ආවාස ගෙයක් තනවා සඟසතු කොට පූජා කිරීම, බුද්ධ ධර්මය ලිවීම හා ලියවීම, සඟසතු කොට හෝ බුද්ධ පූජා වශයෙන් කෙත්වතු පිදීම, බුදුපිළිම බෝධිරෝපණය, වැසිකිළි කැසිකිළි තනවා සඟසතු කොට පූජා කිරීම යන අටමහකුසලයන් අතර කඨින සිවුරු පූජා කිරීම පළමුවැන්නයි. ඇසළ මස අවපෑලවිය දිනයෙන් පෙරහවස් සමාදන් වී වප් පුර පසළොස්වක දිනයේදී වස් පවාරණය කළ භික්ෂුව වෙත තුන්සිවුරෙන් එක් සිවුරකට ප්‍රමාණවත් අලුත් වස්ත්‍රයක් හා ඉදිකටු නූල් පඩු ආදී අනෙක් උපකරණ පූජා කළ යුතුය. වර්තමානයේ වස් ආරාධනා කරනු ලබන දායක දායිකාවන් විසින් අරුණට පළමුව වස්ත්‍රයන් මහපුද පෙරහරින් වඩමවාගෙන මහාසංඝරත්නයට පූජා කරනු ලබයි. එය පිළිගෙන භික්ෂූන් වහන්සේලා එදිනම එයින් සුදුසු පරිදි චීවරයක් පිළියෙල කොට දායකයින්ට භාරදෙනු ලබයි. ඉන් අනතුරුව දායකයින් විසින් සිවුපසයෙන් මහාපුදපූජා කොට එම චීවරය කඨින චීවරයක් ලෙස සංඝරත්නයට පූජාකරනු ලබයි. පසුව එය වස් සමාදන්ව වස් ආරාධනා කර කටයුතු කළ භික්ෂූන් වහන්සේ නමකට මහාසංඝරත්නයේ අනුමැතියෙන් පවරනු ලබයි. මෙය විනයකර්මයකි. මෙලෙස තනිසිවුර ලබන භික්ෂූන් වහන්සේට ද දායකයින්ට ද මහත්ඵල මහානිසංස ලැබේ. කඨින පූජාවට වස්ත්‍ර දෙකතුනක් පිදුවෙක් සංඝ සම්මතයෙන් වඩාත් සුදුසු වස්ත්‍රය කඨිනය වශයෙන් පිළිගත යුතුය. කඨින පූජාව කරන අයට ද එහි ආනිසංස වශයෙන් උත්තම පුරුෂයෙක්ව ඉපදීම, අගතියට නොයාම, ඉසුරුමත්ව මිනිස් ලොව ඉපදීම, උසස් කුලයෙක්හි ඉපදීම, ධනවත් වීම, කාටත් ප්‍රියමනාප වීම, සක්විති සම්පත් ලැබීම, තේජස හා කීර්තිය පැතිර යාම ආදී යහපත් ඵල විපාක අත්පත් වේ.

කඨිනය උදාර ආනිසංස ගෙනදෙන පූජාවෙකි. කඨිනය හේතුවෙන් දෙනු ලබන විපාක මහිමය කඨිනානිසංසයයි. කඨින චීවර දානය මහපොළොව මෙන් කිසිකලෙකත් කම්පා නොවන්නාහ. මහාමේරුපර්වතය මෙන් අධික සුළඟින් නොසෙල්වෙන්නාහ. වජ්‍රපර්වතය මෙන් ස්ථාවරය. නොබිඳෙන, සිදුරු කළ නොහැකි හෙයින් කඨින නමින් සඳහන්ය. සියලු බුදුවරයන්වහන්සේලා විසින්ම පසස්නා ලද පුණ්‍යකර්මයකි. සියලු ආමිෂ දානයන් අතරේ උතුම් දානයකි. පෙරවස් සමාදන් වූ භික්ෂූන්වහන්සේට වසරකට එක්වතාවක් පමණක් ලැබෙන භාග්‍යවන්ත, පුණ්‍යවන්ත අවස්ථාවකි. අනික් සිවුරු කොපමණ ලැබුවත් කඨින චීවරයක් තරම් ඒවා උසස් කොට නොසැලකේ. කඨින චීවර පූජාව භික්ෂූන්වහන්සේට මෙන්ම දායකයන්ට ද මහත් කුසල වැඩෙන්නකි.

බුදුරජාණන්වහන්සේ අනුදැන වදාළේ "අනුජානාමි භික්ඛවෙ වස්සං උට්ඨානං භික්ඛූනං කඨිනං අත්ථරිතුං" යනුවෙන් 'මහණෙනි, වස්වැස නිම කළ භික්ෂූන්ට කඨින ඇතිරීම අනුදනිමි' යනුවෙනි. කඨිනයක් හැම භික්ෂුවකටම ලබාගත නොහැකිය. ඒ සඳහා කරුණු කීපයක් සම්පූර්ණ විය යුතුය. ඇසළ පුන් පොහොය දා පොහොය කොට අවපෑලවිය දා පෙරවස් එළඹ වස් කඩ නොකොට, තුන්මස මුලුල්លෙහි එය මැනවින් ආරක්ෂා කොට, වප් පසළොස්වක දා මහාපවාරණයෙන් පවාරණය කළ භික්ෂුවක් විය යුතුය. එසේම පෙරවස් සමාදන්ව විසූ, යම් කිසි කරදරයක් හෝ රෝගයක් නිසා පෙරවස් පවාරණය කරන්නට නොහැකි වූ භික්ෂුවකට ද කඨිනයක් පිළිගත හැකිය. පෙරවස් එළඹ එය අතරමග දී කැඩී ගිය භික්ෂුවකටත්, පසුවස් එළඹී භික්ෂුවටත්, සාමණේරයන්ටත් කඨින පරිභෝග කිරීමට නොහැකිය.




නාගිත තෙරුන්වහන්සේ මහාකල්ප දහඅටක් දෙව්ලොව මිනිස්ලොව සැපවිඳ ඒ කඨින දානානිසංසයෙන්ම සකල ක්ලේශයන් ප්‍රහීන කොට බුදුරදුන් ප්‍රමුඛ පන්සියයක් මහතෙරුන්වහන්සේලා ඉදිරිපට සිට පූර්ව භවය ප්‍රකාශ කළහ. ඒහිභික්ෂු භාවයෙන් පැවිදි වීමට කඨින පූජාව අවශ්‍ය බව නාගිතාපදානයෙන් විස්තර වේ.

මේ උතුම් වප් පුන් පොහෝ දිනයේ දී කඨින චීවර පූජාව මුල්කර ගෙන අටමහකුසල් වලට අයත් මහ පින්කම කරගැනීම තුළින් භික්ෂූන් වහන්සේලාටත් ගිහි සැමටත් දෙලොව අභිවෘද්ධිය සාධනය කරගත හැකිවනවා ඇත.

තෙරුවන් සරණයි..!

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



# පුද පූජා පිළිබඳ බෞද්ධ විවරණය

ජනප්‍රිය බුදුදහම, පාරිහාරික බුදුදහම, සිංහල බුදුදහම යන විවිධ නම්වලින් විද්වතුන් හඳුන්වන නූතන බෞද්ධ ඇදහිල්ල තුළ පුද පූජා උත්සව ආදී ලෞකික පක්ෂයට ඇත්තේ විශාල නැඹුරුවකි. ඒ අනුව අද වන විට අප රටේ බුදුදහම තුළ ප්‍රතිපත්ති පූජාවට වඩා වැදගත්කමක් ආමිස පූජාවට හිමිවෙයි. ශ්‍රද්ධා භක්ති පෙරදැරිව උත්සව හා පුද පූජා පැවැත්වීමට බුදුන් වහන්සේ අනුදැන වදාරා ඇතැයි බහුතරයක් බෞද්ධයෝ විශ්වාස කරති. සිල්සමාදන් වෙනවාට, භාවනා කරනවාට වඩා දන්සල්, තොරන්, පෙරහර ආදිය පැවැත්වීම වඩාත් යෙහෙකැයි බෞද්ධයෝ සිතන්නේ ඒ නිසාය. ඒ නිසාවෙන්ම පුද පූජා, උත්සව අරඹා බුදුදහම තුළ සිදුකර ඇති යථා විවරණය කෙබඳුද කියා විමසා බැලීම වටී.

බෞද්ධ ඉගැන්වීමට අනුව සියලු දෙනාම එක හා සමාන බුද්ධිමත්හු නොවෙති. එකම විමුක්ති මාර්ගයේ වුවත් සියලු දෙනාට එක හා සමාන වේගයකින් ගමන් කළ නොහැක. බුදුන් වහන්සේ අනුපූර්ව සිත්පැණ ක්‍රමයක්, අනුපූර්ව ප්‍රතිපදා ක්‍රමයක් දේශනා කොට ඇත්තේ එනිසාය. එම අනුපූර්ව ප්‍රතිපදා මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ පුද පූජා, උත්සව ආදී බාහිර කටයුතු සඳහා ලබාදී ඇති ස්ථානය කෙබඳුද කියා විග්‍රහ කොට බැලිය යුතුය. මේ පිළිබඳව මහා විවරණයක් මහාචාර්ය ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න මහතාද සිය ''බෞද්ධ දර්ශනය හා චරණය'' කෘතියේදී මෙසේ ඉදිරිපත් කරයි. ''ආර්ය මාර්ගයේ කිසිදු තැනෙක බුද්ධ පූජා, බෝධි පූජා, ධාතු පූජා, දේව පූජා යනාදී කිසිවක් බුදුන් පළ කොට නැත. යහපත් වූ අවබෝධයේ පටන් යහපත් වූ හිතේ එකඟකම දක්වා ආර්ය මාර්ගයේ කිසිදු අංගයක් යටතේ පුද පූජා කිසිවක් කිසිදු සූත්‍රයක නම් කොට නැත. සිතින්, කයින්, වචනයෙන් කෙරෙන අකුසල් නමින් හඳුන්වන ක්‍රියා බැහැර කොට හිතකර වූ බැවින් කුසල් නමින් හඳුන්වන ලබන ක්‍රියා ප්‍රගුණ කිරීම ඉහත සඳහන් කිසිදු ක්‍රියාවක් අවශ්‍ය බවක් බුදුන් කිසිතැනක ආර්ය මාර්ගය සම්බන්ධයෙන් පළ කොට නැත.''

මේ අනුව පැහැදිලි වන්නේ බුදුදහම තුළ ඍජු ලෙසම පුද පූජා බැහැර කර ඇද්දැයි, අනුමාන කොට ඇද්දැයි යන්න සොයා බලනවාට වඩා විමුක්ති සාධක විෂයෙහි මෙම පුද පූජා හා උත්සව කොතෙක් වැදගත් හෝ නොවැදගත් වන්නේදැයි සොයා බැලීමයි. ඒ අනුව අද වන විට සමාජයේ ව්‍යාප්ත වී පවතින නොයෙකුත් පුද පූජා මුල් බුදුදහමේ මූලික අරමුණු හා පරමාර්ථ සමග ගලපා විග්‍රහ කොට ගත යුතුය.

පුද පූජා හා විවිධ උත්සව බොහෝ සෙයින් ව්‍යාප්ත වී පවතින්නේ දේව වාදී ආගම්වලය. අධි භෞතික බලවේග නැති නම් මහා බ්‍රහ්ම බඳු අධිපති දේව විශ්වාස සහිත ආගම්වල මෙම පූජා හා විවිධ උත්සවවලට විශාල ඉඩහසරක් ලැබෙයි. එහිලා ප්‍රධාන වන්නේ අධිකතර භක්තියයි. ඒ අනුව භක්තියෙන් හා විශ්වාසයෙන් කළ පුද පූජා හා විවිධ උත්සව විධි සමූහයක් එම දේව වාදී ආගම්වලින් නිර්දේශ

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

කර ඇත. එසේම එම පුද පූජා පැවැත්වීම තුළ යම් අර්ථ සිද්ධියක් සිදුවන බවද එම ආගම්වල ඉතා පැහැදිලිව උගන්වයි. එහෙත් බුදුදහම තුළ එබඳු ඉගැන්වීමක් නැත.

ඒ වෙනුවට බුදුදහම නිර්දේශ කොට ඇත්තේ පුද්ගලයාට සංසාරගත පැවැත්මේ ඇති අනිත්‍ය හා දුක්සහගත ස්වභාවය තේරුම් කර දීම, ඒ තත්ත්වයෙන් අත්මිදීමට නිසි මග පෙන්වීම ලබාදීමයි. ඒ සඳහා මිනිසා අධිභෞතික බලවේගයන්ගේ පිහිට පැතීම අර්ථශූන්‍ය බව බුදුදහම පෙන්වා දෙයි. සන්තානගත වූ තෘෂ්ණාව මිනිසුන් තුළ බිය උපදවයි. ඒ බියෙන් තැති ගත් මිනිසුන් බොහෝවිට පර්වත, වන, ආරාම, වෘක්ෂ ආදිය සරණ යති. ඒ බව බුදුදහමේ මෙසේ දක්වෙයි.

"බාහුං වේ සරණං යන්ති
පබ්බතානි වනානිච
ආරාම රුක්ඛ චේතපානී
මනුස්සා භය පජ්ජිතා."

එහෙත් බුදුදහම කියන්නේ එය නිර්භය වූ උතුම් සරණක් නොවන බවයි. එසේම එය දුකින් මිදීමට උපකාර නොවන්නක් බව බුදුදහම පැහැදිලිවම පවසයි.

බුදුන් වහන්සේ තවදුරටත් කියන්නේ යම් භික්ෂුවක් බුද්ධ දේශනාව අනුව ධාර්මිකව පිළිවෙතෙහි යෙදී වාසය කරයි නම් ඒ භික්ෂුව තථාගතයන් වහන්සේට උසස්ම පූජාව වූ ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරන බවයි.

"යො පන භික්ඛු ධම්මානුධම්මපටිපන්නෝ විහරති සාමීචි පරිපන්නෝ ධම්මානුධම්ම චාරි සො තථාගතං සක්කරෝති, ගරුකාරේති, මනේති, පූජේති, පරමා පූජපා පිරිපත්ති පූජපා."

මල් සුවඳ දුම් ආදියෙන් මට පූජා පවත්වන්නේ නියම පූජා නොපවත්වන්නෝ බවත්, ධම්මානුකූල ප්‍රතිපත්ති වන්නන් මට නියම පූජා පවත්වන බවත් බුදුන් වහන්සේ දේශනා කර තිබේ.

පූජාවලිය නම් කෘතියද මෙම කාරණය විග්‍රහ කරමින් කියන්නේ බුදුන් වහන්සේට ආමිසයෙන් හා ප්‍රතිපත්තියෙන් පූජා පැවැත්විය හැකි බවත් ප්‍රතිපත්තියෙන් කරන පූජාව වඩාත් උතුම් වන බවත්ය.

"අප බුදුහු සනරාමර ලෝකයා විසින් කරන ලද නොයෙක් පූජාවලට අදෘශ්‍යමාන වන බැවින් අරහත් නම් වන සේක. එහි ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා යැයි බුදුන් පුදනු ලබන පූජා දෙකක් වන්නේය. ඔවුන් අතරින් ආමිස පූජා නම් ශ්‍රද්ධාව මූලික වෙයි. ප්‍රතිපත්ති පූජාව නම් ගුණ මූලික වෙයි. එහි ප්‍රතිපත්ති පූජාව උතුම් පූජාව වෙයි."

ඒ අනුව පැහැදිලි කරගත යුතු වන්නේ බුදුදහමේ ඇගයුම් කරන වඩා ශ්‍රේෂ්ඨ පූජාව නම් ප්‍රතිපත්ති පූජාව බවයි. එනම් බුදුන් වහන්සේ වදාළ මගේ ගමන් කිරීමයි. පුද පූජා හා උත්සව සම්බන්ධයෙන් "බුදුන් වදාළ ධර්මය" නම් කෘතියේදී වල්පොල රාහුල හිමියෝ මෙබඳු මතයක් ඉදිරිපත් කරයි.

"සීල, සමාධි ශ්‍රද්ධාවෙන් අගතැන්පත් බුදුරජාණන් වහන්සේ වැනි උතුමකුට උන්වහන්සේ පිරිනිවන් පෑ අවුරුදු දෙදහස් පන්සියයකට පමණ පසුත් ආහාරපාන වර්ගවලින් ගරු කරන්නට සිතීම අපේ අභ්‍යන්තර දියුණුවේ අඩුකම විදහා පෑමකි. බාහිර දෙයකින් අපට බුදුන් වහන්සේට සෑහෙන ගෞරවයක් කරන්නට පුළුවන්කමක් නැත. තමන් වහන්සේට කරන උසස්ම ගෞරවය ප්‍රතිපත්ති පූජාව බව තථාගතයන් වහන්සේ විසින් බලවත් ලෙස පවසන ලදී."

තත්ත්වය මෙසේ වුවත් බුදුදහම තුළ මුල් අවදියේ සිටම පුද පූජා පිළිබඳ යම් අදහසක් පැවැති බව පෙනේ. බුදුදහම පහළ වන විට භාරතයේ පැවැති වෛදික ආගම තුළ පුද පූජා පිළිබඳ පැවැති උනන්දුව ඒ තත්ත්වය සඳහා බලපාන්නට ඇතැයි සිතිය හැක.

මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතා සඳහන් කරන්නේ බුද්ධකාලීන පූජා චාරිත්‍ර සමස්තයක් වශයෙන් නිරීක්ෂණය කරන විට ඒවායේ ප්‍රමුඛ අරමුණ 4 ක් පැවැති බවයි. ඒ මෙසේය.

1. පාපා ශෝධනය
2. දේව ප්‍රසාදනය හා ප්‍රාණ ගවේෂණය
3. පීතෘ පූජාව
4. අධ්‍යාත්මික විමුක්තිය.

මේ ආභාෂය යටතේ මුල් කාලයේ සිටම බුදුදහම තුළද පුද පූජා පැවැති බව පෙනේ. ඒ මේ පිළිබඳව පෙළ සාහිත්‍යයෙන් ලැබෙන උදාහරණයන්ය. පැරණි භාරතීය පාලි සාහිත්‍යයේ "පූජා" යන විද්‍යා භාවිත වූ අවස්ථා ගණනාවක් හඳුනාගත හැකිය. මහා මංගල සූත්‍රයේදී "පූජාත පූජනියානං - ඒතං මංගල මුත්තමං" පිදිය යුත්තන් පිදීම උතුම් මංගල කරුණක් ලෙස දක්වා තිබේ. එසේම සත්‍ය ගවේෂණයේ යෙදුණු ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන තවුසන් වෙතින් 7 වන 8 වන ධ්‍යාන උපදවා ගත් පසු ඔවුන්



උදාර වූ පූජාවෙන් සිද්ධාර්ථ තාපසයා පුදනු ලැබූ බව සඳහන් වේ. එසේම මහා ප්‍රජාපතී ගෝතමිය විසින් බුදුරජාණන් වහන්සේට සහල සිවුරක් පිළිගැන්වූ අවස්ථාවේදී ගෝතමිය සංඝයාට දෙන්න සංඝයාට දුන් කල්හි මටද පූජා වේ. (සංඝෝ ගෝතමී දේහි සංඝ තේ දින්නං අහංච පූජිතෝ භවිස්සති. තවද දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේදී අනඳ හිමියන් ඇමතූ බුදුන් වහන්සේ තමන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ඔබලා තථාගත ශරීරයට පූජා නොකළ යුතු බවත් නුවණෙහි ගැහැවියෝද, බමුණෝද තථාගත ශරීරයට පූජා පවත්වන බවත් දන්වීය.

එසේම විමානවත්ථුවේදී "පූජනීය වූ ධාතුන්ට පූජා කරන්න." එසේ කරන්නා ස්වර්ගයට යන්නෝ යයි දක්වා තිබේ. එසේම මෙත්තානිසංස සූත්‍රයට අනුව පුදන්නා පිදීමටද, වඳින්නා වැඳීමටද පාත්‍ර වන බව දක්වා තිබේ. එයින් පෙනී යන්නේ මුල් කාලයේ සිටම බුදුදහම තුළ පුද පූජා අදහසක් පැවැති බවයි.

ත්‍රිවිධ චෛත්‍ය පූජා අද වනවිට බෞද්ධයින් අතිශය ජනප්‍රිය අංගයකි. එහෙත් සත්‍යය වන්නේ මුල් බුදුසමය තුළ කළ ලෙසම මෙබඳු පූජා ක්‍රමයක් නොවූ බවයි. පෙළ සූත්‍රවල පවා සඳහන් වන "චේති" යන්න බෞද්ධයන්ට පමණක් උරුම වචනයක් නොවෙයි. එසේම මෙම චේතපත්ථාන සරණ ගියේ බියෙන් තැතිගත්

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

මිනිසුන් බවත් එම සරණ යාම නියම සරණ යාමක් නොවන බවත් බුදුන් වහන්සේ සඳහන් කර තිබේ. එසේම මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් සාරන්දන චේතිය, උදේශක චේතිය, බහුපුත්තක චේතිය, චාපාල චේතිය, ගෝතමක චේතිය ආදී ස්ථානවලින් පුදනු ලැබූ ස්ථාන නොවන බවද දැනගත යුතුය.

ඉහත දැක්වූ ආකාරයට මුල් බුදුසමය තුළ පුද පූජා සම්බන්ධයෙන් එතරම් උනන්දුවක් නොවූවද අටුවා යුගය පමණ වන විට බුදුදහම තුළ පුද පූජා සම්බන්ධයෙන් යම් වර්ධනයක්, ජනප්‍රියත්වයක් පැවැති බව පෙනේ. ඒ අනුව අද ක්‍රියාත්මක වන නූතන තත්ත්වය පුද පූජා සකස් කිරීමේ ආරම්භක පියවර යම් අටුවා යුගයේදී නිර්මාණය වූ බව සිතිය හැකිය. එම තත්ත්වය



නිර්මාණය වීම සඳහා එක් පැත්තකින් මෙම යුගයේ වර්ධනය වෙමින් පැවැති මහායාන බුදුදහමේ හා හින්දු දහමේ ආභාෂය විශාල වශයෙන් ඉවහල් වූ බව පෙනෙයි.

චෛත්‍ය ත්‍රිවිධාකාර බව සූත්‍රයන්හි සඳහන් නොවූවද එය අටුවාවන්හි සඳහන් වේ. එම ත්‍රිවිධ චෛත්‍යයන් පිළිබඳව බුදුන් වහන්සේම සඳහන් කළ බවද අටුවාවේ දැක්වෙයි. තවද "පූජාත පූජනීයානං" යන්නට අර්ථ සපයන අටුවාචාරීන් වහන්සේලා එම පූජනීය පුද්ගලයෝ නම් සියලු කෙලෙසුන්ගෙන් විනිර්මුක්ත බුදු, පසේබුදු හා මහරහත් උතුමන්ලා බව ප්‍රකාශ කරයි. එපමණක් නොව එබඳු විතරාගී උතුමන් වහන්සේලා සඳහන් කරන්නා වූ පූජාවන් බොහෝ කල්හි හිතසුව පිණිස පවතින බවද පෙන්වා දෙයි.

"ඒවං අප්ජනාජි තේසං පූජං දීඝරත්තං
නිකාය සුඛාය හෝතිතී වේදිතබ්බං."

දම්පියා අටුවා ගැටපදයේ සඳහන් සුමණ මාලාකාරයාගේ වස්තුව ඒ සඳහා දීම නිදසුනකි. එම අටුවාවේ දැක්වෙන අයුරින් සුමණ මාලාකරුවා බුදුන් පුදා ඇත්තේ ප්‍රතිපත්ති පූජාවෙන් නොව ආමිස පූජාවෙනි. එනම් සුවඳ මලිනි. එහෙත් අටුවාව කියන්නේ ඒ පූජාවේ බලමහිමයෙන් හේ සිය දහස් ගණන් කල්පවල දෙව්ලෙෝ, මිනිස් ලෝ සැප විඳ අවසන "මුණිස්වර" නම් පසේ බුදුවැ නිවන් පසක් කරගත් බවයි. එසේ කියා අටුවාව සඳහන් කරන්නේ ආමිස පූජාවේ අනුහස්ය. තවද ප්‍රතිපත්ති පූජාව ගැන කවර කතා දැයිද අටුවා කියති.

එසේම ආලාරකාලාම තාපසතුමා තරුණ සිදුහත් තව්සාට කළ පූජාවන් විවරණය කරන අටුවාව එකී තව්සාගේ උපස්ථායක ස්ත්‍රීන්, පුරුෂයන් විසින් ගෙන එන ලද ගාන්ධ මාලාදියෙන් යව මහා පුරුෂයන් වෙත පූජා කරවයි. බෝසත් තව්සා පුදනු ලැබූ බව අටුවාවේ සඳහන් වෙයි.

එසේම "පූජාරහෝ පූජයේන" යන ධම්මපද පාඨයට විවරණ සපයන අට්ඨකතා ඇදුරෝ වන්දනා මානාදියෙන් සිව්පසයෙන් බුද්ධාදී උතුමන් පිදීම ඉන් අදහස් වන බව කියති. එසේම "විමාන වත්ථුව" උපුටා දක්වන අටුවාව ඒ බුද්ධාදීන් ජීවමාන වුවද, පිරිනිවීයද සම සිතින් පුදන්නට, සම ඵල ලැබේ යැයිද චිත්ත ප්‍රසාදය නිසාම සත්ත්වයින් සුගතියට යන්නේ යයිද ප්‍රකාශ කර තිබේ.

මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ආකාරයට ලිච්ඡවී ජනපදයේ වජ්ජීන් විසින් රක්ෂා කරනු ලැබූ සප්ත අපරිහානිය ධර්මයන් අතරින් 7 වන පාලන මූලධර්මය විග්‍රහ කර බැලීම වටී. එහිදී බුදුන් වහන්සේ සඳහන් කරන්නේ වජ්ජීන් මෙම අපරිහානිය ධර්ම සප්තකය ආරක්ෂා කරන තුරු ඔවුන්ගේ දියුණුවම මිස පරිහානිය අපේක්ෂා නොකළ යුතු බවයි. එම 7 වන පාලන මූලධර්මය නම් "ආනන්දයනි, නුවර ඇතුළතත්, පිටතත් වජ්ජි රජුන්ගේ යම්, වජ්ජු චේති කෙනෙත් වෙත්නම් එයට වජ්ජි රජදරුවෝ යම්තාක් සත්කාර බහුමාන පූජාකරන්නාහු නම් එයට දුන්විරූ දැහැමි බලි බිලි (පුද පූජා) නොපිරිහෙළාන්නාහු නම් වෙනත් වජ්ජීන්ට වැඩි දියුණුවම කැමැති විය යුතුය. පිරිහීම කැමැති නොවිය යුතුය."

මෙහිදී "චේතිය" යනු කුමක්ද යන්න අර්ථ දක්වන අටුවාව විශාල මහනුවර තුළ සතුන් අරක්ගත් වාසස්ථාන චේතිය යයි සඳහන් වන බව කියති. (චේති වෘක්ෂ යන්න අර්ථ දක්වමින්ද අටුවාව කියන්නේ චේති වෘක්ෂ යනු සතුන් අරක්ගෙන සිටිතැයි මිනිසුන් වඳිනු ලබන ගස් කියාය.) මේවාට අවශ්‍ය බලි බිළි නියම ආකාරයෙන් කඩ නොකර පවත්වන කල්හි දේව ආරක්ෂාව සැලසෙන බව කියයි. එසේම ඒ තුළින් නූපන් දුක් නූපදින අතර උපන් රෝග පීඩා සමනය වන බවද කියයි.

මේ අනුව පැහැදිලි වන්නේ අද වන විට විවිධ නම්වලින්, විවිධ අරමුණු සඳහා විවිධ සංස්කෘතිකාංග ඒකරාශි වී පවත්වාගෙන එන බෞද්ධ ආගමික පුද පූජා හා විවිධ උත්සව මුල් බුදුසමය තුළින් අනුමත කළ ඒවා නොවන බවයි. එහෙත් අටුවා යුගයේ සිට අද දක්වා විවිධ අවධීන්හි විවිධ හේතුන් මත වර්ධනය වෙමින් බොහෝ කාලයක් තිස්සේ ප්‍රවේණිගතව පැවැත ආ මේ පුද පූජා හා උත්සව සාකල්‍යයෙන්ම බැහැර කිරීමටද අපට හැකියාවක් නොමැත. ඒ අනුව අප විසින් කළ යුතු වන්නේ අන්ධ භක්තියෙන් මේවායේ ඇලෙන්නේ, බැඳෙන්නේ නොමැතිව ආකස්වතී ශ්‍රද්ධාව ඇති බුද්ධිමත් බෞද්ධයන් වශයෙන් මේ මාහැඟි සංස්කෘතික දායාද අපේ අනාගත පරපුරට දායාද කිරීමයි.

**හර්ෂණ රංගන පෙරේරා**

# පසඟ පිහිටුවා වැඳිය යුත්තේ කවුරුන්ටද?



රූපවාහිනී වැඩසටහන්වලදී හා වෙනත් ප්‍රසිද්ධ ස්ථානවලදී නිතර දෙවේලේ දකින බොහෝ පිළිකුල් සහගත එමෙන්ම හෙළාදැකිය යුතු දර්ශනයක් තිබේ. එනම් ළමයින් වැනි බාලයින් ලවා අනුචිත වැඩිහිටියන්ට පසඟ පිහිටුවා වැන්දවීමයි. වන්දවා ගැනීමයි. රූපවාහිනී දනුම මිණුම වැඩසටහන්වලදී, වෙළෙන්දන් ආදී අනුචිත පුද්ගලයන්ට වැන්දවීම උදහරණ වේ. මෙවැනි අවස්ථාවල එම වැඩිහිටියන්ට ආචාර කිරීම සඳහා විවිධ ක්‍රම ඇතත් ගරුතර පූජ්‍ය පක්ෂයට, මව් දෙමව්පියන් හා ගරු කටයුතු නෑදෑයන්ට, වැඳුම් ලැබීමට සුදුසු ගුණවතුන්ට පමණක් කළ යුතු පසඟ පිහිටුවා ළමයින් ලවා වැන්දවීම හා වැඳුම් ලබාගැනීම වෙනත් අය ගැන තැනැත්තන් සඳහා නොකළ යුතු දෙයක් ලෙස අපි සිතමු. මෙය බොහෝවිට කරන්නේ වැඩිහිටියන්ට ගරු කළ යුතුය. පසඟ පිහිටුවා වැඳිය යුතුය යන කාරණාව මුල්කරගෙනයි.


මේ වැඩිහිටිකම ගැන බුදුරදුන් කීවේ කුමක්ද? අංගුත්තර නිකායේ, සමචිත්ත වග්ගයේ සඳහන් වන මේ උපදේශය මෙහිලා බෞද්ධයන් වූ අප අනුගමනය කළ යුතු පිළිවෙත පහදයි.

''එකල් මහා කච්චාන තෙරුන් වහන්සේ මධුරාවතී ගුන්දුවනයෙහි වසති. එසඳ කණ්ඩරායන බ්‍රාහ්මණයා කච්චාන තෙරුන් වෙත පැමිණ සතුටු සාමීචි නිමවා පැසක හිඳ මෙය සැල කළේය. 'භවත් කච්චාණ, ශ්‍රමණ කච්චාණ, ජරා ජීර්ණ, වයෝ වෘද්ධ, මහලු, කල් වයස්ගත බමුණන්ට නොවඳී. දැක හුනස්නෙන් නොනැගිටියි. ආසනයෙන් ආරාධනා නොකරයි කියා මා අසා ඇත. භවත් කච්චාන ඒ මේ කරුණ එහෙමමයි. භවත් කච්චාන, ජීර්ණ වෘද්ධි මහලු කල්වයස් පත් බමුණන් නොවඳී. දැක හුනස්නෙන් නොනැගිටියි. ආසනයක් නොදෙයි. භවත් කච්චාන ඒ වැඩේ හොඳ නැහැ.''

''බමුණ සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදළ වෘද්ධ භූමියකුත් දහර භූමියකුත් තිබේ. බමුණ, උපතින් අසූවක් හෝ අනූවක් හෝ අවුරුදු සියයක් හෝ ඇති මහල්ලෙක් සිටී. ඔහුත් කාම පරිභෝග කරයි. කම් සැප මැද වාසය කරයි. කාම පරිදහයක් කාම විතර්කවලින් පෙළෙයි. කම් සැප සෙවීමෙහි උත්සුක වෙයි. එවිට ඔහු බාලයාය යන සංඛ්‍යාවටම වැටෙයි.

බමුණ, තරුණ ලස්සන කළු කෙස් ඇති භද්‍ර යෞවනයෙන් යුත් ප්‍රථම වයසෙහි සිටි දහරයෙක් වෙයි. මොහු කම් කෙලෙස් පරිභෝජනය නොකරයි. කම් කෙලෙස් මැද වාසය නොකරයි. කාම පරිදාහයෙන් නොදැවෙයි. කාම විතර්කවලින් නොපෙළෙයි. කම් සැප සෙවීමෙහි උත්සුක නොවෙයි. ඒ පසමිතුරා ස්ථවිර යන සංඛ්‍යාවටම වැටෙයි.

**සමරසිංහ ගුණසේකර**



''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවහට ශෝකයක් නැත. බියකුත් නැත.''

# ගැහැනියක් වැන්දඹු වූ පසු වෙනත් පුරුෂයකු හා සරණයාම වරදක්ද?



විවාහකයන්ගේ අනියම් සම්බන්ධතා අපේ සමාජය තුළ කිසිසේත් පිළිගැනීමකට ලක් නොවන අතර එය අසම්මත දෙයක් ලෙස ඒකාන්ත වශයෙන්ම සමාජයේ ගර්හාවට භාජනය වේ.

නමුත් වැන්දඹු කාන්තාවක් එවැනිම බිරිඳ මියගිය හෝ බිරිඳ හැර ගිය පුරුෂයකු සමග සම්බන්ධතාවක් ඇතිකර ගැනීම අසාධාරණ නොවන දෙයක් ලෙස සමාජයේ විවිධ පුද්ගලයෝ නොයෙකුත් මත ඉදිරිපත් කරති. අපි අද එහෙම නම් කාම මිච්ඡාචාරය හා කාම සම්මාචාරය පිළිබඳ බුදු දහමේ දැක්වෙන ආකාරය ගැන සොයා බලමු.

පංච ශීලයෙහි එන තෙවන සිල්පදය වන්නේ "කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාධියාමි" යන්නය. මේ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා තිබීම ගිහියන් කොයි කාටත් ඉතා වැදගත් වනු ඇත.

මේ සිල්පදයෙහි සරල අරුත පරපුරුෂ හා පරදර සේවනයෙන් වැළකීම වේ. එබඳු වැරදි හැසිරීමක යෙදීම කාමයෙහි වරදවා හැසිරීමක් ලෙස සැලකේ.


කාමය යනු හැසිරිය හැකි දෙයකි. එසේත් නැත්නම් භුක්ති විඳිය හැකි, පරිභෝග කළ හැකි දෙයකි. එමෙන්ම කාමය ඇසුරු කළ හැක්කකි. ඒ අනුව සදාචාර සම්පන්න පුද්ගලයන් කාමය ඇසුරු කරන්නේ දහමට අනුකූලවය. එය කාමේසු මිච්ඡාචාර වේ. සදාචාර විරෝධී ලෙස කටයුතු කරන්නෝ ධර්ම විරෝධී ලෙස කාමය ඇසුරු කරති. කාමේසු මිච්ඡාචාරා යනු එයයි. රටක පවතින නීතියට අනුකූලව ස්වාමි භාර්යාවන් කාම සේවනයේ යෙදීම සදාචාර විරෝධී හෝ ධර්ම විරෝධී වන්නේ නැත.

ලෝකයේ මිනිසුන් විසින් කරනු ලබන වැරදි දෙවර්ගයක් තිබේ.

1. පඤ්ඤත්ති වජ්ජ
2. ලෝක වජ්ජ

පඤ්ඤත්ති වජ්ජ යනු පනවනු ලබන නීතිරීති, අණපනත්, සිල් පද වැනි දෑ උල්ලංඝනය කිරීමය.

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



ලෝක වජ්ජ යනු සම්මුති ලෝකයේ වරදක් ලෙස පිළිගනු ලබන දේ උල්ලංඝනය කිරීම වේ.

ඒ අනුව කාම මිච්ඡාචාරය මේ දෙවර්ගයටම අයත් වරදකි. විශේෂයෙන්ම බුදු දහමට අනුව කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිල්පදයක් තිබේ. එම සිල්පදය සමාදන් වූ කෙනකු එය උල්ලංඝනය කරන්නේ නම් ඔහු ඇය පඤ්ඤත්ති වජ්ජයට හසු වෙයි. එසේම කාම මිච්ඡාචාරය සදචාර සම්පන්න ක්‍රියාවක් ලෙස පිළිනොගැනෙන නිසා එය ලෝක වජ්ජයට හසුවීමද වැළැක්විය නොහැකිය.

කාම සේවනයේදී පුද්ගලයකුට එය නිදහසේ සිදුකළ හැකි එකම අයිතිය ඒ පුද්ගලයා ලබන නීතිමය ආවරණයයි. නීත්‍යනුකූල භාවයකින් තොරව සේවනය කරනු ලබන සියලුම කාමයන් කාම මිච්ඡාචාරය යටතට ගැනේ.

ඇතැම් කාන්තාවන් සහ පිරිමි තමන්ගේ ස්වාමියා හෝ බිරිඳ වෙන්වීම නිසා නැතහොත් මියයාම නිසා වෙනත් අයකු සමග සම්බන්ධතාවක් ඇතිකර ගැනීමට පෙළඹෙනු ඇත. මෙය අසරණ වූ කෙනකුට පිළිසරණ වීමක් ලෙස කෙනකු අර්ථ දක්වීමට පුළුවන. නමුත් එවැනි පිළිසරණක් ලබා දීම සඳහා ඔහු, ඇය මුලින්ම කළ යුත්තේ තමන්ගේ සම්බන්ධතාව නීතිමය රාමුවක් තුළට ගෙන ඒමය. එනම් ඔවුනොවුන් විවාහ වීමය.

ධර්මයට අනුව විවාහ ගිවිස ගෙන පමණක් සිටින යුවළකට වුවද, විවාහය ලියාපදිංචි කර අදාළ සිරිත් විරිත් ඉටු කිරීමට පෙර අඹුසැමියන් ලෙස එක්වීමට අවසර නැත. මෙකල බොහෝ තරුණ තරුණියන් එය පිළිනොගෙන කටයුතු කරන අතර එයද කාම මිච්ඡාචාර යටතට ගැනේ.

නීතිය උල්ලංඝනය කරන්නකුට නීතිය නොදැන සිටීම නිදහසට කාරණාවක් නොවේ. එසේම, ධර්ම විරෝධීව කටයුතු කරන්නකුට ධර්මය නොදැන හිඳීමද විපාක නොදී හිඳීමට හේතුවක් වන්නේ නැත. තමන් කරනු ලබන ක්‍රියාව පිළිබඳ දැනුවත් භාවය තිබෙනවා නම්, එසේ දැනුවත්කමින් යුතුව චේතනා පහළ කරගෙන ක්‍රියාව සිදුකරනවා නම් විපාකදායී කර්ම සඳහා අවශ්‍ය සියලු කරුණු එහි සම්පූර්ණ වී ඇත. එබැවින් ඒ තුළ සිදුවන පාපය වැළැක්විය නොහැකිය. පව, පවක් බව නොදන්නා තැනැත්තා අතින් එබඳු පව් වඩ වඩාත් සිදුවේ. ඒ, එය පවක් වශයෙන් නොව යහපත් දෙයක් ලෙස එම පුද්ගලයා විශ්වාස කරන නිසාය. ඔහුගේ දෘෂ්ටියට අනුව එම ක්‍රියාවේ ඇති නරක විපාක නොවැටහුණත් ක්‍රියාව සිදු කිරීමේදී ඒ සම්බන්ධ සිතිවිලි ඔහුගේ සිත තුළ හට ගන්නා බැවින් කර්ම විපාකදීම වැළැක්විය නොහැකිය.

**"චේතනාහං භික්ඛවේ**
**කම්මං වදාමි"** යනු බුද්ධ දේශනාවය.

එබැවින් කාම සේවනයේදී එම ක්‍රියාව සිදුකරන ලබන තැනැත්තාගේ හෘද සාක්ෂියට අනුව ඒ ක්‍රියාව තුළින් ඔහුගේ, ඇගේ සිතේ ඇති වුණු සිතිවිල්ල කුසලයක්ද, අකුසලයක්ද යන්න ඒ පුද්ගලයාටම තීරණය කළ හැකිය.


වඩාත්ම වටින්නේ ආත්ම වංචාවෙන් තොරව කාම සම්මාචාරයෙන් කටයුතු කිරීමය. එනම් යහපත් කාම සේවනයට පමණක් යොමු වීමය.

**පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව


මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk


## උතුම්ම දානය ධර්ම දානයයි

සකල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන මහනුවර ශ්‍රී දළද මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය මගින් මාසිකව නිකුත් කරනු ලබන ''දළද වරුණ'' බෞද්ධ සඟරාව මේ වනවිට සිය දස වසර සම්පූර්ණ කොට තිබීම අප කාගේත් සොම්නසට හේතුවෙයි. සෑම පුර පසළොස්වක දිනකම නිකුත් වන ''දළදා වරුණ'' සඟරාව සඳහා ඇති පාඨක ඉල්ලුම දිනෙන් දින වර්ධනය වූයේ සිතාගන්නටත් බැරි තරමටය. ''දළද වරුණ'' සඟරාවේ මූලික අරමුණ වූයේ බුදු දහම පිළිබඳ ඉතා සරල හා සුගම ලෙස බෞද්ධ ජනතාව තුළ නිවැරදි දැනුමක් හා අවබෝධයක් ඇති කරවමින් සාර ධර්මවලින් පිරිපුන් ගුණගරුක, ධර්මිෂ්ඨ සමාජයක් බිහිකරලීම සඳහා අඩිතාලම දැමීමටය. ඒ සඳහා අපට නිවැරදි අවවාද අනුශාසනා ලබාදෙමින් නිසි මග පෙන්වන ලද්දේ අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා දෙනම සහ දියවඩන නිලමේ විසින් බව මෙහිලා සනිටුහන් කරන්නේ ඉතාමත් බැතිබර හදිනි. මෑතකදී අපවත් වී වදළ අස්ගිරි පාර්ශ්වයේ මහානායක අතිගෞරවාර්හ උඩුගම සද්ධර්මකීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන නාහිමිපාණන්ගේ ශ්‍රී නාමයද මෙහිදී සිහිපත් කරන්නේ ඉතාමත් ගරු බහුමානයෙන් යුතුවය. එසේම මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ සහ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය මහෝපාධ්‍යාය ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථ දස්සාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේලා දෙනම අදටත් කුළුණුබර හදින් යුතුව ''දළද වරුණ'' සඳහා ලබාදෙන අවවාද අනුශාසනා හා මග පෙන්වීම අපට විශාල ශක්තියක් වී තිබේ. තවත් වසර දහයක කාලයක් බෞද්ධ ජනතාවට සේවය කිරීම සඳහා විශාල ප්‍රභූ පිරිසකගේ කැමැත්තෙන් තේරී පත්වූ නිලංග දැල දියවඩන නිලමේතුමා ''දළද වරුණ'' සඟරාවේ අනාගත චිරස්ථිතිය පිණිස අදටත් ඇප කැපවී සිටීම ඇත්තෙන්ම සතුට හා ශක්තිය දනවන්නකි.

ජනතාවගේ දැනුම් පිපාසය යම් පමණකින් හෝ නිවා සනසාලීමට ''දළද වරුණ''ට හැකිවූයේ ඔබ සැම එය කෙරෙහි දක්වූ අසීමිත දයාව හා ලෙන්ගතුකම නිසාමය. ධර්ම දානය තරම් උතුම් දානයක් තවත් නැතැයි දේශනා කළේ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසිනි. අපගේ අධිෂ්ඨානය හා අරමුණ වූයේද ධර්ම දානයෙන් ඔබගේ සිත සුවපත් කිරීමය.

එහිදී ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව බවට පත්වෙමින් ''දළද වරුණ'' මේ වනවිට ශ්‍රී ලංකාව තුළ වාර්තාවක්ද තබා ඇත. කිසිදු මුදලක් අය නොකොට නොමිලේ ධර්ම දානයක් ලෙස ලබාදෙන ''දළද වරුණ'' මේ තරම් සාර්ථකත්වයකට රැගෙන යන්නට උර දුන් සියලු දෙනාටම දළද සමිඳුන්ගේ ආශිර්වාදය නොමඳව හිමිවන බවද මෙහිදී සඳහන් කර සිටිනු කැමැත්තෙමු. ■

මෙවර අප බලාපොරොත්තු වන්නේ අපායෙහි උපදින සත්ත්වයන්ට යම රජු විසින් ලබාදෙන දඬුවම් විමසා බැලීමටයි. එක් සමයක බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක භික්ෂු පිරිස අමතා දේවදූතයන් තිදෙනකු පිළිබඳ කරුණු ඉගැන්වෙන දම් දෙසුමක් දේශනා කළහ. එය නම් කොට ඇත්තේ 'දේවදූත සූත්‍රය' ලෙසයි. එහි සඳහන් දේවදූතයන් තිදෙනා මෙසේය.


1. පළමු දේවදූතයා - වයසට යෑම (ජරා)
2. දේවන දේවදූතයා - ලෙඩවීම (ව්‍යාධි)
3. තේවන දේවදූතයා - මරණයට පත්වීම (මරණ)

මේ ලෝකයෙහි ඇතැමෙක් කයින්, වචනයෙන්, මනසින් යන තිදෙරින් දුශ්චරිත කොට ජීවිතයේ කෙළවර හෙවත් මරණින් පසු සැපයෙන් පහ වූ නපුරු ගති පැවතුම් ඇති විවසව පතිත වීම් ඇති නරකයෙහි උපදිති. එසේ නරකයෙහි උපදින සත්ත්වයන් නිරය පල්ලන් විසින් ඇදගෙන ගොස් යම රජු ඉදිරියේ දක්වත්. එසේ යම රජුට දක්වා ඔහු පිළිබඳ පැමිණිල්ල මෙසේ ඉදිරිපත් කරයි.

එනම් ''දේවයන් වහන්ස, මේ පුරුෂයා මව කෙරෙහි වරදවා පිළිපැද්දේය, පියාට මනාව නොපිළිපැද්දේය, ශ්‍රමණයන්ට මනාව නොපිළිපැද්දේය, රහතුන්ට මනාව නොපිළිපැද්දේය, කුල දෙටුවන් නොපිදුවේය. මොහුට දේවයන් වහන්සේ දඬුවම් කළ මැනව'' කියායි.

එවිට යම රජු ඔහුට දඬුවම් පැමිණවීමට පෙර ඔහු ජීවත්ව සිටි සමයේ මේ දේව දූතයන් තිදෙනා ඔහු විසින් දැක ඇද්දැයි විමසයි. ඔහුගේ පිළිතුර වනුයේ දැක නැති බවයි. එවිට යම රජු මේ දේව දූතයන් වෙන කවුරුත් නොව ජරා, ව්‍යාධි, මරණ යන ජීවිතයේ මුහුණපාන ස්වභාව සංසිද්ධීන් බව ඔහුට පෙන්වා දෙයි. ඔහුට ජීවිතයේ යථාර්ථ තේරුම් යන්නේ එවිටය. එහෙත් ඔහු ඒ වනවිටත් ප්‍රමාද බැවින් ඔහු කළ වරදට දඬුවම් පමුණුවන ලෙස නිරය පල්ලන්ට උපදෙස් දෙයි.

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය



# අපා

# දඬු

## ලැබෙන හැ

මෙවර අප බලාපොරොත්තු වන්නේ අපායෙහි උපදින සත්ත්වයන්ට යම රජු විසින් ලබාදෙන දඬුවම් විමසා බැලීමටයි. එක් සමයක බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක භික්ෂු පිරිස අමතා දේවදූතයන් තිදෙනකු පිළිබඳ කරුණු ඉගැන්වෙන දම් දෙසුමක් දේශනා කළහ. එය නම් කොට ඇත්තේ 'දේවදූත සූත්‍රය' ලෙසයි. එහි සඳහන් දේවදූතයන් තිදෙනා මෙසේය.

1. පළමු දේවදූතයා - වයසට යෑම (ජරා)
2. දේවන දේවදූතයා - ලෙඩවීම (ව්‍යාධි)
3. තේවන දේවදූතයා - මරණයට පත්වීම (මරණ)

මේ ලෝකයෙහි ඇතැමෙක් කයින්, වචනයෙන්, මනසින් යන තිදෙරින් දුශ්චරිත කොට ජීවිතයේ කෙළවර හෙවත් මරණින් පසු සැපයෙන් පහ වූ නපුරු ගති පැවතුම් ඇති විවසව පතිත වීම් ඇති නරකයෙහි උපදිති. එසේ නරකයෙහි උපදින සත්ත්වයන් නිරය පල්ලන් විසින් ඇදගෙන ගොස් යම රජු ඉදිරියේ දක්වත්. එසේ යම රජුට දක්වා ඔහු පිළිබඳ පැමිණිල්ල මෙසේ ඉදිරිපත් කරයි.

එනම් ''දේවයන් වහන්ස, මේ පුරුෂයා මව කෙරෙහි වරදවා පිළිපැද්දේය, පියාට මනාව නොපිළිපැද්දේය, ශ්‍රමණයන්ට මනාව නොපිළිපැද්දේය, රහතුන්ට මනාව නොපිළිපැද්දේය, කුල දෙටුවන් නොපිදුවේය. මොහුට දේවයන් වහන්සේ දඬුවම් කළ මැනව'' කියායි.

එවිට යම රජු ඔහුට දඬුවම් පැමිණවීමට පෙර ඔහු ජීවත්ව සිටි සමයේ මේ දේව දූතයන් තිදෙනා ඔහු විසින් දැක ඇද්දැයි විමසයි. ඔහුගේ පිළිතුර වනුයේ දැක නැති බවයි. එවිට යම රජු මේ දේව දූතයන් වෙන කවුරුත් නොව ජරා, ව්‍යාධි, මරණ යන ජීවිතයේ මුහුණපාන ස්වභාව සංසිද්ධීන් බව ඔහුට පෙන්වා දෙයි. ඔහුට ජීවිතයේ යථාර්ථ තේරුම් යන්නේ එවිටය. එහෙත් ඔහු ඒ වනවිටත් ප්‍රමාද බැවින් ඔහු කළ වරදට දඬුවම් පමුණුවන ලෙස නිරය පල්ලන්ට උපදෙස් දෙයි.

### නිරය පල්ලන්ගේ දඬුවම්

ඔහුට නිරය පල්ලයෝ පඤ්චවිධ බන්ධන නම් වූ වධයක් කරති. එනම්, රත්වූ යකඩ උලක් අතෙහි ගසත්, රත්වූ යකඩ උලක් දෙවැනි අතෙහි ගසත්, රත්වූ යකඩ උලක් පයෙහි ගසත්, රත්වූ යකඩ උලක් දෙවෙනි පාදයෙහි ගසත්. රත්වූ යකඩ උලක් පපුව මැද ගසත්. එහි හෙතෙම දුක්වූ, තියුණු වූ, කෲර වූ වේදනාවන් විඳි යම්තාක් ඒ පාප කර්මය විනාශ නොවේද, ඒ තාක් කලුරිය නොකෙරෙයි. නිරයපාලයෝ ඔහු බිම පෙරලා කෙටේරිවලින් සසිත්.

ඔහු නිරයපාලයෝ පා උඩුකුරු කොට, හිස යටිකොට තබා වෑවලින් සසිත්. ඔහු නිරයපාලයෝ රථයෙහි යොදා, ගින්නෙන් දිළිසෙන්නා වූ, වෙසෙසින් ඇවිල පවත්නා වූ, ගිනි සහිත වූ භූමියෙහි ඉස්සරහට යැමද කරවත්, අස්සට යැමද කරවත්. නිරය පාලකයෝ ඔහු, ගින්නෙන් දිළිසෙන්නා වූ, වෙසෙසින් ඇවිළ පවත්නා වූ, ගිනි සහිත වූ, මහත් වූ මහා කූළුගෙයක් පමණ වූ, අඟුරු පව්වට නැංවීමද කරවත්. බැස්වීමද කරවත්. ඔහු නිරයපාලයෝ පා උඩුකුරු කොට, හිස යටිකුරු කොට බුබුලු නැග පැසෙන්නා වූ යකඩ හැලියක දමත්. ඔහු එහි පෙන නගමින් පැසෙයි. ඔහු එහි පෙන නගමින් පැසී, වරක් උඩට එයි. වරක් යටට යයි. වරක් හරහට යයි. ඔහු එහි දුක් වූ, දරුණු වූ, කටුක වූ වේදනාවන් විඳියි. යම්තාක් ඒ පාප කර්මය නොගෙවේද, ඒ තාක් කලුරිය නොකරයි. යමපල්ලෝ ඔහු මහා නරකයෙහි දමත්.


ඒ මහා නරකය සිව් කොනක් ඇත්තේය. සිව් දෙරටුවක් ඇත්තේය. කොටස් වශයෙන් බෙදන ලද්දේය. එසේම ප්‍රමාණ කරන ලද්දේය. යකඩ ප්‍රාකාරයකින් වට කරන ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය. ඒ නිරයෙහි බිම යකඩයෙන්ම කරන ලදී. දැල්වෙන ගින්නෙන් යුක්තය. හැමකල්හි හාත්පසින් සියක් යොදුනක් ගින්න පැතිරගෙන සිටී.

### යම රජුගේ සිතිවිල්ල

පෙර කාලයෙහි යම රජුට මෙබඳු අදහසක් විය. ''මේ ලෝකයෙහි යම් කෙනෙක් ළාමක වූ කර්මයක් කරත්ද, ඔවුහු මෙබඳු වූ නොයෙක්


පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි ෙ

#  යේ
# ුවම්
## ැටි මෙන්න



වධ කරනු ලබත්. මම මිනිස් බවක් ලබන්නේ නම්, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ වූ, තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපදින්නාහු නම්, ඒ භාග්‍යවතුන් වහන්සේ පයිරුපාසානය කරන්නේ නම් (ඇසුරු කරන්නේ නම්) මට ඒ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසත් නම්, මමද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය දැනගන්නේ නම් යහපති'' කියායි.

මේ තොරතුරු බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ උන්වහන්සේගේම නුවණිනි. ඒ බව උන්වහන්සේ දේශනා කරන්නේ මෙසේය. ''මම එය අන්‍ය වූ ශ්‍රමණයකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා මෙසේ නොකියමි. යමක් මා විසින් තමාම අවබෝධ කරන ලද්දේද, තමාම දක්නා ලද්දේද, තමාම දැනගන්නා ලද්දේද, එය මම කියමි'' යි වදාළ සේක. දේවදූතයන්



විසින් චෝදනා කරන ලද යම් මනුෂ්‍ය කෙනෙක් ප්‍රමාද වෙත්ද, ළාමක වූ ශරීරයක් ඇති බවට පැමිණ බොහෝ කාලයක් මුළුල්ලෙහි ශෝක කරත්.

මේ ලෝකයෙහි දේවදූතයන් විසින් චෝදනා කරන ලද්දා වූ, පණ්ඩිත වූ යම් සත්පුරුෂ කෙනෙක් වෙත්ද, ඔවුහු කිසි කලකත් ආර්ය ධර්මයෙහි ප්‍රමාද නොවෙත්. ජාතියට හා ජරා මරණයට කරුණු වූ, තෘෂ්ණා දෘෂ්ටීන් දැඩිකොට ගැනීමෙහි බිය දැක, ජාති මරණ සංඛ්‍යාත නිර්වාණයෙහි උපාදන වශයෙන් නොගෙන මිදෙත්, අප්‍රමාණ විහරණ ඇත්තා වූ, සුවපත් වූ මේ ආත්මයෙහිම නිවුණා වූ, සියලු වෛර, භය ඉක්ම වූ, ඒ සත්පුරුෂයෝ වනාහි සියලු දුක් ඉක්ම වූවාහුය.

වරක් බුදුරජාණන් වහන්සේ සසරින් එතෙර වීමේ මාර්ගය මේ බඹයක් පමණ වූ ශරීරය තුළම පවතින බව දේශනා කළහ. මෙම දම් දෙසුමෙන් අර්ථවත් කරන්නේ එයයි. මේ ඝෝර සසරින් මිදීමට අවශ්‍ය කරන අවබෝධය ලබාදීම සඳහා දෙවි දෙවියන් විසින් එවන දූතයන් තිදෙනෙකි. ජාති, ජරා හා මරණ අප කොතෙකුත් උපත් දැක ඇත. වයසට ගිය වූවන්ද කොතෙකුත් දැක ඇත. එමෙන්ම මරණයට පත්වූවන්ද කොතෙකුත් දැක ඇත. එහෙත් අප මේවා දේව දූතයන් ලෙස සිතුවාද? නැත. ඒ අප තවමත් මේ කාම ලෝකයේ කාමයෙන් වෙලී, මත්ව සිටින නිසාය. යමෙක් මේ පිළිබඳ අවබෝධයෙන් සිතා කටයුතු කරන්නේ නම් ඔහු යම රජු පමණක් නොව මරුවාද පරාජය කරන්නෙකි. එසේ නැති වූ කල යම රජු ප්‍රශ්න විචාරක පුරුෂයා මෙන් බියට තැති ගැනීමට පත්ව තියුණු වූ, කටුක වූ දුක් විඳියි. මෙසේ ප්‍රමාද වූවන්ට දඬුවම් නියම කරන යම රජුද සිතන්නේ තමාද සම්බුදු කෙනෙකු දැක උන්වහන්සේගේ දහම අනුගමනය කරන්නේ නම් මහත් භාග්‍යයක් ලෙසය. එබැවින් කුමට ප්‍රමාද වන්නේද? උතුම් දහමක් පවතින කාලයක ඉපදීමට භාග්‍යවන්ත වූ අප කුමට ප්‍රමාද වී නිරයට යන්නේද?

**පූජ්‍ය මහරඹෑවේ පාලිත හිමි**

කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# මේ කියන අය ඔබ හඳුනනවාද?

බුදුරජාණන් වහන්සේ පුද්ගල විභේදනයන් තුනක් පිළිබඳව කළ වටිනා දේශනාවක් අංගුත්තර නිකායෙහි තිකනිපාතන්තර්ගත රථකාර වර්ගයෙහි නිරාස සූත්‍රයෙහි සඳහන් වෙයි. මේ ලෝකයෙහි නිරාස ආසංස හා විගතාස යනුවෙන් පුද්ගලයන් තිදෙනෙක් විද්‍යමාන වන බව දේශනා කරන බුදුරජාණන් වහන්සේ ඊට සමරූපීව භික්ෂු සමාජය තුළද එවැනිම භික්ෂූන් තිදෙනෙක් විද්‍යමාන වන බව දේශනා කොට ඇත. එම සූත්‍රයෙහි සඳහන් අයුරින් ගිහි පුද්ගලයන් හා භික්ෂූන් අතර ඇති පුද්ගල විභේදනයන් මෙසේය.

ගිහි පුද්ගල විභේදනයන්, එම සූත්‍රයෙහි දක්වා ඇත්තේ මෙසේය.

මහණෙනි, ලෝකයෙහි පුද්ගලයෝ තිදෙනෙක් ඇත්තාහු වෙත්. විද්‍යමාන වෙත්. ඔවුහු කවරහුද යත්, නිරාස ආසංසත හා විගතාස යනුවෙනි.

1. අපේක්ෂා රහිත පුද්ගලයා (නිරාසො)
2. අපේක්ෂා සහිත පුද්ගලයා (ආසංසො)
3. අපේක්ෂා පහ කළ පුද්ගලයා (විගතාසො) යනුවෙනි.

අපේක්ෂා රහිත පුද්ගලයා හැඟීම් හෙවත් චරිත ලක්ෂණයන් බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ මෙසේය.

මහණෙනි, අපේක්ෂා රහිත පුද්ගලයාගේ හැඟීම් මෙසේය. මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් චණ්ඩාල කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ නළකාර (කුළුපොතු කපන) කුලයෙහි හෝ, කම්කරු කුලයෙහි හෝ පරමල් ඉවත ලන කුලයෙහි හෝ දිළිඳු වූ ස්වල්ප ආහාරපාන ඇති, දුක් පැවතුම් ඇති, යම් තැනෙක්හි දුකසේ කෑම, ඇඳීම ආදිය ලබයිද, එබඳු තැනෙක්හි උපන්නේ වෙයිද, හෙතෙම අවලක්ෂණ වූයේ, අප්‍රිය දැකුම් ඇත්තේ මිටි වූයේ, බොහෝ ආබාධ ඇත්තේ, කණෙක් හෝ කුණෙක් හෝ, කොරෙක් හෝ, පක්ෂයක් පණ නැතියෙන් හෝ වූයේ ආහාර, පාන, වස්ත්‍ර, යානා, මල් ගඳවිලවුන්, සේනාසන, තෙල්, පහන් නොලබන්නේ වෙයිද, හෙතෙම, මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිශේඛයෙන් අභිෂේක කරන ලද්දේ යයි අසන්නේය. එහෙත් ඔහුට මාද ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රිභිෂේකයෙන් කවදා අභිෂේක කරද්ද යන අපේක්ෂාව (බලාපොරොත්තුව) ඇති නොවේ. මෙබඳු වූ හැඟීම් ඇති පුද්ගලයා නිරාස හෙවත් අපේක්ෂා රහිත පුද්ගලයාය. අපේක්ෂා සහිත පුද්ගලයාගේ හැඟීම් හෙවත් චරිත ලක්ෂණයන් බුදුරජාණන් වහන්සේ හඳුන්වා ඇත්තේ මෙසේය.

මහණෙනි, අපේක්ෂා සහිත පුද්ගලයාගේ හැඟීම් මෙසේය. මේ ලෝකයෙහි ඔටුණු පලන් ක්ෂත්‍රිය රජකුගේ අභිෂේකයට සුදුසුව, සුදුසු වියට පැමිණියා වූ අභිෂේක නොකරන ලද වැඩිමහලු පුතෙක් වෙයිද, හෙතෙම මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිෂේකයෙන් අභිෂේක කරන ලදැයි අසන්නේ වෙයිද, ඔහුට එසේ මාද ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂේකයෙන් කවදා අභිෂේක කරද්දැයි සිතෙන්නේය. මෙබඳු වූ හැඟීම් ඇති පුද්ගලයා ආසංසත හෙවත් අපේක්ෂා සහිත පුද්ගලයාය.

මහණෙනි, පහවූ අපේක්ෂා ඇති පුද්ගලයාගේ හැඟීම් මෙසේය. මේ ලෝකයෙහි අභිෂේක කරන ලද්ද වූ ක්ෂත්‍රිය රජෙක් වෙයිද, හෙතෙම මෙනම් ක්ෂත්‍රිය තෙමේ ක්ෂත්‍රියයන් විසින් ක්ෂත්‍රියාභිෂේකයෙන් අභිෂේක කරන ලදැයි අසන්නේ

වෙයිද ඔහුට මෙසේ මා ද ක්ෂත්‍රියෝ ක්ෂත්‍රියාභිෂේකයෙන් කවද අභිෂේක කරන්නාහුදැයි නොසිතන්නේය. ඊට හේතුව අභිෂේක වීමට පෙර අභිෂේක වීමේ ආශාවක් වීද එම ආශාව දැන් සංසිඳී ඇත. ඔහුට නැවත අභිෂේක වීමේ ආශාවක් නැත. මෙම පුද්ගලයා විගතාස හෙවත් පහකළ අපේක්ෂා ඇති පුද්ගලයාය. මෙම පුද්ගලයන් තිදෙනාට සමාන භික්ෂූන් තිදෙනෙක්ද පැවිදි සමාජය තුළ වාසය කරන බව බුදුරජාණන් වහන්සේ ඉහත කී පුද්ගලයන් තිදෙනාට උපමා වන සේ දේශනා කර ඇත්තේ මෙසේය.


මහණෙනි, භික්ෂූන් අතරද පුද්ගලයෝ තිදෙනෙක් විද්‍යමාන වෙයි. අපේක්ෂා රහිත භික්ෂුව (නිරාස), අපේක්ෂා සහිත භික්ෂුව (ආසංස) හා අපේක්ෂා පහකළ භික්ෂුව යනුවෙනි. (විගතාස)

අපේක්ෂා රහිත හෙවත් නිරාස භික්ෂුවගේ පැවතුම් මෙසේය.

මහණෙනි, අපේක්ෂා රහිත භික්ෂුවගේ පැවතුම් හෙවත් හැඟීම් මෙසේය. මහණෙනි, මේ ශාසනයේ ඇතැම් භික්ෂුවක් දුශ්ශීල වෙයිද, පාපධර්ම ඇත්තේ වෙයිද, අපිරිසිදු කාය කර්මාදිය ඇත්තේ වෙයිද, සැක කළ යුතු පැවතුම් ඇත්තේ වෙයිද, සැඟවුණු ක්‍රියා ඇත්තේ වෙයිද, බ්‍රහ්මචාරියෙකැයි අඟවන්නා වූ අශ්‍රමණයෙන් වෙයිද, බ්‍රහ්මචාරියෙකැයි අඟවන්නා වූ අබ්‍රහ්මචාරියෙක් වෙයිද, ඇතුළත කෙලෙස් කුණෙන් කුණු වූයේ වෙයිද, රාගාදියෙන් තෙත්වූයේ වෙයිද, හටගත් රාගාදී කුණු කසළ ඇත්තේද, හෙතෙමේ අසවල් භික්ෂු තෙම ආශ්‍රවයක් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අන්තර්ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහි විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේ යැයි යන්න අසන්නේද, ඔහුට එබඳු අපේක්ෂාවක් හෙවත්, මමද ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධියත්, අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහි විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ වාසය කරන්නේ නම් යෙහෙකි, යන අපේක්ෂාව නූපදින්නේය. මහණෙනි, මේ භික්ෂුව නිරාස හෙවත් අපේක්ෂා රහිත භික්ෂුව යැයි කියනු ලැබේ.

අපේක්ෂා සහිත භික්ෂුවගේ පැවතුම් හෙවත් හැඟීම් මෙසේය. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ සිල්වත් වේද, යහපත් ධර්ම ඇත්තේ වේද හෙතෙම, අසවල් භික්ෂු තෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රිව රහිත අර්හත් ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහි විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණී වාසය කෙරේ යැයි යන්න අසන්නේද හෙතෙමේද ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නෙම් යැයි උත්සුක වන්නේය, අදහස් වන්නේය. මහණෙනි, මේ භික්ෂුව ආසංස හෙවත් අපේක්ෂා සහිත භික්ෂුව යයි කියනු ලැබේ.

**ශාක්‍ය ඉඳුවර ගුණසේකර**



## මල්වතු විහාරයේ කඨින පින්කම නොවැම්බර් 21/22 දිනවල

**මහනුවර** මල්වතු මහා විහාරයීය සංඝරාජ ගුණානුස්මරණ සමිතිය, සංඝරාජ ගුණානුස්මරණ කාන්තා සමිතිය, සංඝරාජ වස්දන සංග්‍රහ සමිතිය, අනුශාසක මල්වතු මහා විහාරයීය මහෝපාධ්‍ය, අග්ගමහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද නාහිමිගේ අනුශාසකත්වයෙන් හා සංඝරාජ දහම් පාසලේ සහභාගිත්වයෙන් පවත්වනු ලබන මල්වතු මහා විහාරයේ කඨින පින්කම නොවැම්බර් 21-22 දිනයන්හි සිදුකෙරේ. නොවැම්බර් මස 22 වැනිදාට යෙදී ඇති අලුත්ගම ධම්මානන්ද නාහිමිපාණන්ගේ සියවෙනි ජන්මෝත්සවයට සමගාමීව හැත්තෑ දෙවෙනි වතාවටත් පැවැත්වෙන කඨින පින්කමේ කඨින චීවර තුනක් මල්වතු මහා විහාරයට, පෝයමලුව විහාරය, මහානායක මාහිමි නිල ආරාමයට පූජා කෙරේ. මෙම කඨින චීවර මෙදින පාන්දර මල්වතු මහා විහාරය වෙත මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ සිට වැඩමවාගෙන එනු ඇත. 21 වෙනි දින ලේ දන්දීමේ සහ ගවයකුට අභයදානය දීමේ වැඩ සටහනක් සංඝරාජ දහම් පාසල් භූමියේදී සිදුකෙරේ. කඨින චීවර පූජාව මහනුවර එල්. එච්. චන්ද්‍රසේකර මහතා ප්‍රධාන පවුලේ පිරිසත්, මහින්ද මුණසිංහ මහතා ප්‍රධාන පවුලේ පිරිසත් සම්බන්ධව සිදුකෙරේ.

## ගෙවුණු වසරේ හොඳම පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිඵලය මහනුවර අස්ගිරි මහා විහාර පිරිවෙනට

**පිරිවෙන්** අධ්‍යාපනයේ 2014-2015 වසරේ ප්‍රාචීන විභාගයේ උසස්ම ප්‍රතිඵලය මහනුවර අස්ගිරි මහා විහාර පිරිවෙන හිමිකරගෙන ඇත. ප්‍රතිඵලය අනුව ප්‍රාචීන ප්‍රාරම්භය, ප්‍රාචීන මධ්‍යම, ප්‍රාචීන අවසාන (පණ්ඩිත) යන විභාගත්‍රයේම සමස්ත ප්‍රතිඵලය අස්ගිරි මහා විහාර පිරිවෙන ලබාගෙන ඇත. ප්‍රථම වරට ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රාචීන පණ්ඩිත විභාග සමතුන් සිව්දෙනකු බිහි කිරීමට සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

මේ අතර ප්‍රාචීන මධ්‍යම විභාගයේ පළමුවන ස්ථානය ලබා සමස්ත ලංකා ප්‍රතිඵලය අස්ගිරිය මහා විහාර පිරිවෙනේ ධර්ම ශාස්ත්‍රය හදාරණ කටුපොත චන්දජෝති හිමි ලබාගෙන සමස්ත ලංකා විභාග වාර්තාවක් පිහිටුවා ඇත. තවද වර්ෂ 213-2014 වර්ෂයේ පවත්වන ලද සමස්ත ලංකා පාරිවේනික භාෂා හා සාහිත්‍ය තරගවලින්ද ප්‍රථම ස්ථානය ලබාගත් අස්ගිරි මහා විහාර පිරිවෙන පිරිවෙන් අධ්‍යාපනයේ විභාග ප්‍රතිඵල අතින් පසුගිය දශක තුන තුළ උසස් ප්‍රතිඵල සටහන් කර ඇති බව පිරිවෙනේ වාර්ෂික අධ්‍යාපන ප්‍රගති වාර්තාවලින් ප්‍රකාශිතය. අස්ගිරිය මහා විහාර පිරිවෙනේ අධ්‍යාපන තත්ත්වය අද උසස් මට්ටමකට පත්කිරීමෙහිලා අස්ගිරිය මහා විහාර කාරක මහා සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද හිමි පරිවේණාධිපති වශයෙන් ඉටුකරන සේවයද බොහෝ දෙනකුගේ පැසසුමට ලක්ව තිබේ.


**කේ. බණ්ඩාරනායක**

# භාවනාවෙන් ලැබෙන කුසල්

ධම්ම පදයේ යමක වග්ගයේ එන "මනෝ පුබ්බංග මා ධම්මා" යන ගාථාවට අනුව කරන ලද කර්මයන්ට පෙර පසු නොවී විපාක ගෙනදේ. එබැවින් භාවනා කරන තැනැත්තාටද එසැණින්ම අනුසස් ලැබේ.

සමථ භාවනාව වඩන්නකුට සංසාරික වශයෙන් සැප ආනිශංස ලබාදීමට හේතුවන පුණ්‍ය සංස්කරණයන්ගේ එකතුවකුත් මෙලොව වශයෙන් කෙලෙස් යහපත් කිරීමේ හැකියාවකුත් ලැබේ. විදර්ශනා භාවනාව වඩන යෝග ාවචරයාට කුසල සංස්කරණයක් මෙන්ම කෙලෙස් කපා හරින ප්‍රඥුවකුත් වර්ධනය වෙයි.

ආධුනික යෝගාවචරයකුට මූලික වශයෙන් ලැබෙන්නේ චිත්ත සංසිද්ධිය සහ කාය පස්සද්ධියයි. එනම් සිතේ සංසිඳුණු බව හා කයේ සංසිඳුණු බව නිසා දැනෙන සුවයයි. මෛත්‍රී භාවනාව කරන්නෙකුට සිත එකඟ වීමත් සමගම සුළු කාල පරාසයකට හෝ මේ සුවයක් අත්විඳිය හැකිය. සිතට මහා සැහැල්ලුවක් දැනුණා, ගතට මහා සැහැල්ලුවක් දැනුණායි ආධුනික යෝගාවචරයා කියන්නේ මේ නිසාය.



සමාධිමය මට්ටමකින් යුතු මෛත්‍රී භාවනාව වඩන්නාට පහත ආනිශංස හිමිවේ.

1. සුඛං සුපති - (සුවසේ නින්ද යයි.)

බොහෝ දෙනාට සිතේ තිබෙන ප්‍රශ්න කරදර නිසා සිත නිරතුරුවම අවුල් වූ ස්වභාවයකින් පවතී. මානසික ඒකාග්‍රතාවක් රහිත නිසා සිතේ ඇතිවන විවිධ අරමුණු ඔස්සේ නිතරම සිත ගමන් කරයි. අතීතයේ සිදුවූ දෙයක් හෝ වර්තමානයේ සිදුවන හෝ අනාගතයේ විය හැකි යැයි සිතන දේ සිතෙහි වැඩ කරන නිසා වැඩිදෙනාගේ මනස එක්තැන් කරගත නොහැකිය.

බුද්ධ දේශනාවට අනුව විවිධ බලාපොරොත්තු ඔස්සේ සීමාරහිතව ගමන් කරන්නාට සුවදායී නින්දක් නොලැබේ. විවිධ අරමුණු නිසා ඔහුගේ සිත නිරන්තරයෙන් බියෙන් හා තැති ගැනීමෙන් පීඩාවට පත්වේ. එබැවින් නින්දට සැරසුණත් පහසු සහ ඉක්මන් නින්දක් ඔහු කරා නොයේ. නමුත් සන්සුන් සිතක් ඇත්තාට සිතට පහසුවක් දැනේ. නින්ද නොයෑම, තිගැස්සී නැවත නැවත ඇහැරීම, නින්ද යාමත් පෙර බිය ඇතිවීම, හිසරදය හා විවිධ කායික අපහසුතා සන්සුන් මනස ඇතියාට ඇති නොවේ. ඔහු ඉතා සුවසේ කෙටි කාලයකදී පහසු නින්දකට වැටේ.

2. සුඛං පටිබුජ්ඣති - (සුවසේ පිබිදෙයි.)

ඇතැම් තැනැත්තෝ නින්දෙන් පිබිදීමේදී බයට පත්වී, තැතිගෙන කෑ ගසමින්, දත්මිටිකමින් අවදි වනු දැකිය හැකිය. නමුත් යෝගාවචරයා ඒ කිසිදු අපහසුවකින් තොරව ඉතා සුවසේ මනා සිහියකින් යුතුව අවදි වෙයි. ඇතැමකුට නින්දට යනවිට නිදගත් ස්ථානය, නිදගත් ස්වරූපය, නින්දට යන ස්ථානය පිළිබඳ අවබෝධය නැතිවම නින්දට ගොස් එවැනිම සිහිමුලා ගතියකින්ම අවදි වන ස්වභාවයක් ඇත. නමුත් මෛත්‍රී භාවනාව වඩන තැනැත්තා නිතරම මෛත්‍රිය වඩන නිසා කල් යත්ම භාවනා මානසිකත්වයෙන්ම නින්දට ගොස් භාවනා මනසිකාරයෙන් යුතුවම අවදි වේ. මම වෛර නැත්තෙක් වෙම්වායි හෙතෙම නින්දට ගියේද ඔහු අවදි වන්නේ ඊළඟ පියවර සිහි නංවා ගෙනය.

3. න පාපකං සුපිනං පස්සති - (පාපී සිහින නොදකී)

සිහින දැකීම බොහෝ දෙනාට සාමාන්‍ය දෙයකි. එහිදී ඇතැමෙක් සුබ සිහින දකින අතර ඇතැමෙක්

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

අසුබ සිහින දකී. සමහරු නින්දේදීම බියෙන් තැතිගෙන කෑ ගැසීම, අතපය දරදඬු වීම, විවිධ අපහසුතාවන්ට පත්වනුද පෙනේ. නමුත් මෛත්‍රී භාවනාව වඩන්නාට එවැනි විකෘති සිහින නොපෙනේ.

බොහෝ විට යහපත් වූ සුබ සිහින පමණක් දකී. ඇතැම් විට සිහින පෙනීමට හේතුවන තමන්ට විරුද්ධව කටයුතු කරන තමාගේ අයහපත බලාපොරොත්තු වන යක්ෂ ආදී අමනුෂ්‍ය කොටස්වල හෝ තමන්ට විරුද්ධ දෙවි දේවතාවන්ගේ බලපෑම් වැළකේ.

4. මනුස්සානං පියෝ හෝති (මනුෂ්‍යයන්ට ප්‍රිය වේ.)

මෛත්‍රිය වඩන්නා නිරතුරුවම අන්‍ය සත්ත්වයන්ගේ මිතුරු බවම යහපතම බලාපොරොත්තු වන්නෙකි. එබැවින් සියල්ලෝ ඔහු ප්‍රිය කරයි. එම නිසා හිංසා පීඩා, කරදර කරන, අයහපත පතන පිරිස් ඇති නොවේ. ඔහුගේ මිත්‍රශීලී බව නිසා තරහකරුවන් නැතිවේ. එබැවින් බොහෝ මිනිසුන්ට ප්‍රිය තැනැත්තෙක් වෙයි.

5. අමනුස්සානං පියෝ හෝති (අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි.)

මෛත්‍රී භාවනාව වැඩීමේදී සියලු දෙවියන්ට සියලු අමනුෂ්‍යයින්ට, සියලු විනිපාසිකයින්ට ආදී විවිධ සත්ත්ව කොට්ඨාසවලට මෛත්‍රිය පතුරුවන නිසා ඒ සියල්ලෝද යෝගාවචරයා කෙරෙහි මෛත්‍රී ඇත්තෝම වෙති.

තලගුරු වෙහෙර ගල්ලෙනෙහි විසූ මහරහතන් වහන්සේ වැනි අය කෙරෙහි දෙවි දේවතාවුන් වහන්සේලා ප්‍රසාදය පළ කිරීම උදාහරණ හැටියට දැක්විය හැකිය. විවිධ රහතුන් වහන්සේලාට සමහර අමනුෂ්‍ය කොට්ඨාසයන්ගෙන් සත්කාර සම්මාන ලැබීම උදාහරණය. කරණීය මෙත්ත සූත්‍රය දේශනා කිරීමෙන් සිදුවූයේද මෙයයි.

6. දේවතා රක්ඛන්ති (දෙවියන්ගේ රැකවරණය ලැබේ.)

කුසල කර්මයන්හි නියුතු ගිහි-පැවිදි දෙපිරිසගේම සිතෙහි උපදින පුණ්‍ය බලය අනුමෝදන්වීමට දෙවි දේවතාවුන් කැමැත්ත දක්වයි. එමනිසා එවැනි පිරිසට මෙකී දෙවි දේවතාවුන් වහන්සේලාගේ ආරක්ෂාව හිමිවේ. භාවනා කිරීමෙන් හා පින් අනුමෝදන් කිරීමෙන් දිව්‍ය උත්පත්ති ලබා සිටින දෙවි දේවතාවුන් වහන්සේලාගේද සමගිය වර්ධනය වේ. එමනිසා එවැනි දෙවි දේවතාවුන් වහන්සේලා නිරතුරුවම ආරක්ෂාව සලසති. විශාඛා මහරහතන් වහන්සේගේ කතාව ඊට හොඳම උදාහරණයක් දක්වයි. උන්වහන්සේ පැලලුප් නුවර සිට ලංකාවේ සිතුල්පව්ව වෙහෙරට බණ අසන්නට වැඩම කළ විට වැඩ හුන් ගල්ලෙන ඉදිරිපස සිටි ඉදිරිස වෘක්ෂයේ වාසය කළ දෙවියන්ගේ ආරාධනයෙනි පිරිනිවන් පානා තුරුම මෛත්‍රී වඩමින් එහිම වාසය කළහ.

7. නාස්ස අග්ගිවා විසංවා සත්ථං කමති (ගින්නෙන් හෝ වසවිෂවලින් හෝ අවිආයුධවලින් හිංසාවක් නොවේ.)

මෛත්‍රී භාවනාව වඩන්නාට මෛත්‍රී සිතින් යුතුව කල්ගත කරන කාල පරාසය තුළදී ගිනි තැබීමක් හෝ වස විෂ ශරීරගත කිරීමක් හෝ තියුණු අවි ආයුධවලින් පහර දීමක් සිදු කළද කිසිදු හානියක් නොවේ. නමුත් අලුතින් භාවනාව ආරම්භ කළ ආධුනිකයාට නොව සමාධිමය මට්ටමින් යුතු තැනැත්තාට විශේෂ කොට මෙය බලපායි. උත්තරා උපාසිකාවට මෙන් ශරීරයට ගිනි තැබුවද ගින් දැල් ඇති නොවේ. චුල්ල සීව හිමියන්ට මෙන් වස විෂ ශරීරගත නොවේ.

8. අසම්මූල්හෝ කාලං කරෝති (සිහි මුලා නොවී මිය යයි.)

නිතර කුසල් අරමුණක සිත වැඩීම නිසා බොහෝ කුසල් රැස් කළ තැනැත්තකු බවට පත්වෙයි. සිහි නුවණ වඩා හොඳින් වර්ධනය කළ අයකුද වෙයි. මේ නිසා මරණාසන්න



අවස්ථාවේදී පවා වඩන ලද භාවනා මනස්කාරය, නැවත නැවතත් සිහියට නැගේ. එමනිසා බොහෝ පින් කළ අයකු වශයෙන් සතුටින් යුතුව සිහි මුලා නොවී මරණයට පත්වේ. මෙතෙක් සාකච්ඡා කළ කරුණුද මෙලොව වශයෙන් විපාක දෙන ඒවාය.

9. උත්තරිම අප්පටි විජ්ඣමානෝ (රහත් නොවුණේ නම් බ්‍රහ්ම ලෝකයේ උපදී.)

යමෙක් ධ්‍යාන මට්ටමේ දක්වා සිත වර්ධනය කළේ සම් මරණාසන්න කාලයේදී ඔහුගේ මරණයට ආසන්න වූ සිත ධ්‍යාන ගතවී නම් ඒ ඒ ධ්‍යාන මට්ටමට ගැළපෙන මට්ටමින් අදාළ බ්‍රහ්ම ලෝකයක උපදී. විශේෂයෙන් පළමු, දෙවැනි ආදී ධ්‍යාන මට්ටම් මේ සඳහා උපකාර වෙයි.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැලණිය**

“අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය”



# විරූපී ප්‍රේතිය

## ප්‍රේත වස්තුවේ එන කතාවක්

දිනක් සාරිපුත්ත මහරහතන් වහන්සේ පාත්‍ර සිවුරු ගෙන පිණ්ඩපාතය සඳහා වැඩම කරද්දී ඇගේ නූල් පටක් වත් නැති, නහරවැල් පෑදුණු, ඉල ඇට ඉලිප්පී තියෙන කෙට්ටු සිරුරක් ඇති විරූපී ප්‍රේතියක් උන්වහන්සේ ඉදිරියේ පෙනී සිට මෙහෙම කිව්වා.

"අනේ ස්වාමීනි, මම මීට කලින් ආත්ම භාවවල ඔබවහන්සේගේ වැදූ අම්මා වෙලා ඉපදිලා ඉඳලා තියෙනවා. එහෙව් මම අකුසල් කළ නිසා දැන් ප්‍රේත ලෝකයේ ඉපදිලා කුසගින්දරෙන් පීඩා විඳිනවා. අනේ පුතණුවන් වහන්ස, දානයක දෙන සේක්වා. දානයක් දී ඒ පින මට අනුමෝදන් කරන සේක්වා" කියලා.

සාරිපුත්ත මහරහතන් වහන්සේ ඒ ප්‍රේතියගෙන් ඇහුවා, "ප්‍රේතිය, මේ තාක් කල් ප්‍රේත ලෝකයේ සිටිද්දී අනුභව කළේ මොනවාද?" කියලා.


"අනේ ස්වාමීනි, මිනිසුන් බැහැර කරපු, කාරලා වීසි කරපු කෙළ, සොටු, සෙම, පිළිස්සෙන මළසිරුරුවලින් උතුරන වුරුණු තෙල්, දරුවන් වදද්දී ගලන ගැබ් මළ, තුවාලවලින් වැගිරෙන ලේ, සැරව, නාසය, හිස ආදිය කැපුණු විට ගලන ලේ, ස්ත්‍රී පුරුෂ ශරීරවලින් ගලන වෙනත් අසූචි වර්ග තමයි බඩගින්දර ඉවසගන්න බැරි නිසාම ආහාරයට ගන්නේ."

"අනේ ස්වාමීනි, ඒ විතරක් නොවෙයි, මට ඉන්න තැනක් නැහැ. අමු සොහොනේ ඇඳම තමයි පිහිට කරගෙන ඉන්නේ" කියලා.

සාරිපුත්ත මහරහතන් වහන්සේ පෙර ආත්ම භවයන්හි මෑණියන්ව සිටි ඒ ප්‍රේතිය කෙරේ කරුණාවෙන් මුගලන් මහරහතන් වහන්සේද, අනුරුද්ධ, කප්පින යන මහරහතන් වහන්සේලාද සමගින් හතරැස් කුටියක් හදලා සතර දිගින් වඩින සංඝයා උදෙසා පූජා කළා. ආහාරපාන ආදිය අනෙක් ස්වාමීන් වහන්සේලාට පූජා කරලා පෙර ආත්ම භවයක මව වූ ප්‍රේතියට අනුමෝදන් කළා.

ඒ පින් අනුමෝදන් කළ සැණින් පුණ්‍ය විපාක පහළ වුණා. ඒ ප්‍රේතියට භෝජන, වස්ත්‍ර, පැන් ආදී සැප සම්පත් පහළ වුණා. නහරවැල් පෑදී, ඉල ඇට ඉලිප්පී තිබුණු විරූපී කෙට්ටු සිරුර පිරිසිදු වුණා. දෙව් දුවක් මෙන් විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසුණා. ඒ තමයි දානයෙහි විපාක.

**ගලිගමුවේ ඥාණදීප හිමි**
**(සාරිපුත්ත ථේරස්ස මාතු ප්‍රේත වත්ථු ඇසුරෙනි**



# වෛරී සිත පසුතැවිල්ලට හේතුවන අයුරු දැක්වෙන

# ඡද්දන්ත ජාතකය

අතිශය ගැඹුරු මහාසාගරය පරදන කරුණාගුණ ඇති, මහාමේරුපර්වතය සේ නොසෙල්වෙන මෛත්‍රී ගුණ ඇති, තථාගත සම්මාසම්බුදුරජාණන්වහන්සේ ජේතනාරාමයෙහි වැඩසිටින සමයෙහි එක් ළදරු මෙහෙණින්වහන්සේ නමක් අරභයා මෙම ජාතක කථාව දේශනා කොට වදාළ සේක.

සැවැත්නුවර වසන එක් කුලදුවක් ගිහිගෙයි විසීමෙහි ආදීනව දැක පැවිදිව සෙසු මෙහෙණින්වහන්සේ සමඟ බණ ඇසීම සඳහා තිලෝගුරු බුදුරජාණන්වහන්සේ ධර්මාසනයේ වැඩහිඳ ධර්මදේශනා කරන, දම්සභා මණ්ඩපයට පිවිස බුදුරජාණන්වහන්සේගේ අපිරිමිත රූසිරිය බලා වැඳ නමස්කාර කොට, "මා මේ උත්තමයාට පාදපරිචාරිකාවක් වශයෙන් විසූ කෙනෙක්දැයි" සිතුවාය. එසැණින්ම මෙහෙණින්වහන්සේට ජාතිස්මරණඥානය පහළ විය. "මම මේ රුවින් අග්‍රප්‍රාප්ත මහාපුරුෂයාට ඡද්දන්ත හස්තිරාජව උපන් කාලයෙහි බිරිඳව උපන්නෙමි, මෙබඳු සැප ලදිමි"යි ජාතිස්මරණඥානයෙන් දැක ප්‍රීතිප්‍රමෝදයට පත්වූවාය. උපන් ප්‍රීතිය නිසා මහත් සේ සිනාසී මෙසේ සිතුවාය. "පාදපරිචාරිකාවන් අතරෙහි තමාගේ වල්ලභයාට හිතවත් අදහස් ඇත්තවුන් ද, අහිතවත් අදහස් ඇත්තවුන් ද යන දෙකොටසක් වෙති. මේ දෙකින් ඇත්රජව උපන් මහෝත්තමයාට කෙලෙස විසුවේදැයි" සිතන්නී, එකල යම් දෝෂයක් සිතෙහි ඇති වී ඡද්දන්ත නම් ඇත්රජහු සෝණුත්තර නම් වැද්දෙකු ලවා විෂ පෙවූ හීයකින් විදවා ජීවිතය විනාශ කළ අයුරු දුටුවාය. ඉක්බිති මෑත කාලයේ කළ තදකම් සිතා ශෝක ඉපදී හදවත උණුවිය. ශෝකය දරාගත නොහැකිව ආශ්වාස, ප්‍රාශ්වාස සුසුම්ලමින් මහ හඬින් හැඬුවාය. එවිට බුදුරජාණන්වහන්සේට සිනහවක් පහළ විය. එවිට සිනාසුණු කරුණ කුමක්දැයි අවශේෂ භික්ෂූන්වහන්සේ විචාළහ. එවිට මහණෙනි, මේ මෙහෙණිය පෙර එක් ජන්මයෙක්හි මට කළ තදකමක් සිතා හැඬුවායැයි වදාළෙන්, ඒ අතීත කථාව කුමක්දැයි විමසූ කෙණෙහි මෙම ඡද්දන්ත ජාතකය දේශනා කොට වදාළ සේක.

පෙර කල හිමාල පර්වත සමීපයේ සදත්දහතලා නම් මහවනයෙහි සද්දන්ත කුලයෙහි උපන් ඍද්ධිමත් ආකාශයෙන් ගමන් යා හැකි අටදහසක් පමණ ඇත්රැලක් විසූහ. එකල්හි පුරන ලද පාරමිතා ඇති මහාබෝසතාණන්වහන්සේ, යූථපති නම් ඇත්රජුට පුත්ව උපන්නේය. හෙතෙම රිදී පර්වතයක් සේ සුදුපැහැ ශරීරයෙන් යුක්ත විය. වැඩිවිය පැමිණි ඔහු, අටඅසූරියන් පමණ උසින් ද, විසිඑක් රියන් පමණ දිගින් ද යුක්ත විය. පනස්අට රියන් දිග ඇති සොඬින් සමන්විත විය. ඔහුගේ දළ වට පසළොස්රියන් පමණය. දිගින් තිස්රියන් පමණය. සවණක්රැස් විහිදෙන්නේය. අටදහසක් පමණ ඇතුන් පිරිවරා ගොස් පසේබුදුරජාණන්වහන්සේට පූජා කරන්නේය. මේ ඇත්රජුට චුල්ලසුභද්‍රාය, මහාසුභද්‍රාය යන ඇතින්නියෝ දෙදෙනෙක් අගමෙහෙසුන් වූහ.

මේ ඇත්රජු ඡද්දන්ත කුලයෙහි අටදහසක් ඇතුන් පිරිවරා ගුහාවෙක විසීය. ඡද්දන්ත නම් විල්තෙර දියපරඬලා, සෙවෙල් ආදිය කිසිවක් නැත්තේය. නිල්වූ ජලයම ඇත්තේය. ජලයට අනතුරුව හෙල්මැලි වනය, නිලුපුල් වනය, ඒ වටකොට රතුපුල් වනය විය. ඊට අනතුරුව හෙල්මැලි පියුම් ආදී මහාමිශ්‍ර වනය පිහිටියේය. ඒ මහාමිශ්‍ර වනය වටා රත්හෙල් වනය පිහිටියේය. අන්තයෙහි නිල්මල්, රන්වන්මල්, සුදුමල් පිපෙන මනා වූ සුවඳ ඇති පියුම් මලින් ගැවසුණු කුඩා ගස් ඇති වනය විය. ඉක්බිති යොදුන් පමණ පළල ඇති මහා මෑ වනය ද, ඊට ඉක්බිති මුං වනය ද, ඊට අනතුරුව තියඹරා වනය ද විය. ඊට ඉක්බිති යොදුනක් පමණ පළල කැකිරි වනය ද, ඊට ඉක්බිති කොමඩු වනය ද, ඉන් ඉක්බිති උක් වනය ද, ඊට ඉක්බිති කෙසෙල් වනය ද, ඊට පසු කොස් වනය ද, ඊට ඉක්බිති තියඹරා වනය ද, ඊට ඉක්බිති ගිවුලු වනය ද, ඊට ඉක්බිති අඹ වනය ද, ඉන් පසු සියලු වෘක්ෂ වලින් ගැවසීගත් මහාමිශ්‍ර වනය ද විය. ඊට පසු මහා හුණ වනය විය.

ඉන් අනතුරුව චුල්ලකාල නම් පර්වතය පිහිටියේය. ඉක්බිති පර්වතය මහාකාල පර්වතය ද, ඊට ඉක්බිති උදකපාර්ශව නම් පර්වතය ද, ඊට ඉක්බිති චන්‍ද්‍රපාර්ශව පර්වතය ද, ඊට ඉක්බිති සූර්ය පර්වතය ද, ඉන් පසු මණිපාර්ශව පර්වතය ද පිහිටියේය. මෙසේ පර්වතයෝ සත්දෙන සද්දන්ත විල වටා පිහිටියාහ. ඇතුළු කෙළවර සිටි ස්වර්ණ පර්වතය උසින් සත්යොදුන් පමණය. සදත්විල වටකොට පාත්‍ර මෝවිටක් මෙන් සිටියේය. ඒ පර්වයේ ඇතුලත පිටත ඝනරත්මය විය. එයින් නික්මුණු රත්වන් රැස් දහර නිසා සදත් විල හැම විටම හිරුමඬලක් මෙන් බබළන්නේය.

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

ඉක්බිතිව සිටි පර්වතය උසින් සයොදුනක් පමණ ඇත්තේය. තුන්වන පර්වතය ද පස් යොදුනක් පමණ උසය. ඊට අනතුරුව පර්වතය උසින් සතර යොදුන් පමණය. ඊට ඉක්බිති තුන් යොදුන් පමණය. ඊට ඉක්බිති පර්වතය දෙයොදුන් පමණය. ඊට ඉක්බිතිව පිහිටි චූල්ලකාල පර්වතය යොදුනක් පමණ වූයේය.

වළලු සතකින් සමන්විත ඡද්දන්ත විලට ඊසාන කොණෙහි මහත් නුග ගසෙක් පිහිටියේය. එහි කද වට පස්යොදුන් පමණය. උසින් සත්යොදුන් පමණය. සතරදිගට ගිය ශාඛාවන් සයොදුන් පමණය. උඩට නැගි ශාඛාව දසයොදුන් පමණ ඇත්තේය. ඒ නිග්‍රෝධ වෘක්ෂයේ මුල පටන් ශාඛාග්‍රය දක්වා උසින් තෙලෙස්යොදුනක් පමණය. සතරදිග ශාඛාවන්ගේ ඇක අතුඅගට සතරදොළොස් යොදුන් පමණය. මෙය අටදහසක් අරළුවෙන් සැරසුනේය. මඩුළු ඉදුණිල් මිණි පර්වතයක් සේ ශෝභාමත්ය.

ඡද්දන්ත විලට බස්නාහිර ස්වර්ණ පාර්ශවයෙහි රන් ගල්ගුහාවෙහි ඡද්දන්ත නම් හස්තිරාජයා වර්ෂා කාලයෙහි අටදහසක් ඇතුන් පිරිවරා සිටියෝය. ග්‍රීෂ්ම කාලයේ දියබිඳු මුසුවූ පවන් විදිමින් අටදහසක් ඇතුන් පිරිවරා නුගරුක අසුඅස්සෙහි සිටින්නාහ. මෙසේ වනසිරි විඳි ඇත්රජුට සල්වනයේ මල් පිපී සිටින්නේය. ගිමන් කල්හි දවස් හරිනට සැපයයි දැන්වූහ. එකණෙහි ඇත්රජ සල්වනයෙහි කෙළනට යම්හයි කියා ගොස් ඒ ඇත්රජතෙම මහාසල්රුකක් දළින් තැලේයැයි සිතා කුම්භස්තලයෙහි පහලෙහිය. එකල්හි යටිසුළඟට සිටි චුල්ලසුභද්‍රා නම් ඇතින්න ඇඟ දූමරොටු, පරඬල, තුනුදිම්, කදලු ආදිය වැටුණේය. උඩුසුළඟට සිටි මහාසුභද්‍රාවන් ඇඟ මල් රොන් සමඟ පෙති වගුලේය. එවිට චුල්ල සුභද්‍රා සිතන්නේ මාගේ සෙනෙහි ඇති බිරිඳ ඇඟමස් කෙසරු රොන් සලා මල්පෙති විසිරූහ. මාගේ ශරීරයේ මරාටු, පරඬලා කුරුකුහුඹු කසළ ලූහයි නිස්කාරණයේ වෛර බැන්දේය.


නැවත දවසක ඇත් රජු නාවන පිණිස පිරිවර ඇතුන් සමඟ ගොස් ඡද්දන්ත විලට බටහ. එවිට නහඹු ඇත් දෙදෙනෙක් සොඬින් සුවඳ හොටම්ටි ගෙන උලා නැවූහ. එරජු දෙනෙත් ගොඩනැගි මහබෝසතාණෝ සමීපයේ සිටියාහ. ඉක්බිති අටදහසක් පමණ මතැත්හු සදත්විලට බැස දියකෙළි කෙළ ඒ විලින් නොයෙක් වර්ණයෙන් මල්ගෙනැවිත් රිදී දාගැබක් සරහන කලක් මෙන් මහාබෝසතුන් සරසා, ඉක්බිති ඇතින්නියන් සැරසූහ. එවිගස දියකෙළින එක් ඇතෙකු සත්ගුමු මහපියුමක් මා බල බලා සිටිය දී තමන්ගේ ප්‍රිය භාර්යාවට දුන්නේය. මට නුදුන්නේ යැයි නැවතත් බෝධිසත්වයන් කෙරෙහි වෛර බැන්දාහ.

නැවත එක් දවසක් මිහිරි පොකුරු මී හා එක්ව පන්සීයක් පසේබුදුවරයන්වහන්සේලා වළඳවන බෝධිසත්වයන් දැක චුල්ල සුභද්‍රාවෝ තමන් ලද පලාඵල හා පොකුරු මී පසේ බුදුවරයන්වහන්සේට දන් දී මෙසේ ප්‍රාර්ථනා කරන්නී, "මේ ආත්මභාවයෙන් චුතව මඩරාජකුලයෙහි උපත ලැබ, සුභද්‍රා රාජකන්‍යාව වැඩිවියට පැමිණ බරණැස් රජුට අගමෙහෙසුන්ව ප්‍රිය වචන වඩන්නෙමි. ඒ රජු වසඟ කොට මා කීවා කරන පරිද්දෙන් මට නතුකරවා ගෙන ඔහු හට කියා එක් වැදි පුත්‍රයෙකු යවා මේ ඇත්රජහු විෂ පෙවූ හීයකින් විද ජීවිතය විනාශයට පමුණුවා සවණක් රැස් විහිදුවන දළ සඟල ගෙන්වා ගන්නට සමර්ථ වෙම්වයි" කියා ප්‍රාර්ථනා කළාය.


එතැන් පටන් ගොදුරු නොකා ඊර්ෂ්‍යාවෙන් වියලී නොබෝ කලකින් කාලක්‍රියා කොට මධුරජුගේ අගමෙහෙසුන්ගේ කුස පිළිසිඳගත්හ. උපන්නා වූ බිසොවුන්ට සුභද්‍රා යැයි නම් තැබූහ. කෙමෙන් වැඩිවිය පැමිණි පසු බරණැස් රජුට පාවා දුන්හ. ඇය රජ හට සොළොස් දහසක් පුරගනන්ට ප්‍රධානව ජාතිස්මරණඥානය ලැබී වාසය කරන්නීය. ඇය එක් දවසක් මෙසේ සිතුවාය. මගේ ප්‍රාර්ථනාව සමෘද්ධ විය. දැන් වනාහි ඇත්රජහු බිඳහෙළවා දළ සඟල ගෙන්වා ගනිමියි සිතා බොරු ලෙඩ කියා සියලු ශරීරයේ තෙල් ගල්වා කිලිටි වස්ත්‍ර ඇඳ රෝගී වෙසක් දක්වා යහනෙහි වැදහොත්තීය. එකණෙහි රජතුමා සුභද්‍රා දේවිය කොයිදැයි විමසා ලෙඩවී ඇතැයි අසා සිරියහන් ගබඩාවට ගොස් මෙලෙස විමසීය. දේවියනි, ඔබගේ ශරීරය පඩුවන්පැහැව ගොසින් ශෝකාතුර වූයේය.

ඇස් සඟල මල්දමක් මෙන් මලානිකය. මීට කාරණා කිමෙක් ද? එබස් ඇසූ බිසව, රජතුමනි, හීනයක් දැක දොලක් උපන්නේය. ඒ දොල ලබාගත හැක්කක් නොවේ. නොලද්දේ වී නම් ජීවිතය පවතින්නේ ද නැත. ඒ ඇසූ රජු, මිනිස් ලොව ඇති යම් සැපතක් ඇත්නම් එය බොහෝ කොට ඇත. එබැවින් ඔබ කී යමක් වේ නම් එය ලබා දෙමි. ශෝක නොකරන්න. එවිට බිසව නොලද දොලදුක නොකියමි. නුඹවහන්සේගේ විජිතයෙහි යම් පමණ වැදිකෙනෙක් ඇත්ද, ඔවුන් හැම රැස්කළ මැනව. එකල්හි මේ දොළ නුඹවහන්සේට කියමි. එවිට රජතුමා යහපතැයි ගිවිස තුන්සියයක් පමණ යොදුන් කසීරට යම් පමණ වැදිපුත්‍රයන් ඇත්ද, ඒ හැම රැස්කරවයි නියෝග කළහ. සියලු දෙනා රැස්වූ පසු සැටදහසක් පමණ වූහ.

රජු ඔවුන් ආ බව බිසවට දන්වා, දේවියනි, රැස්වූ සැටදහසක් පමණ වැද්දන් හට ඔබේ කවර කාර්යයක් නමුත් සාදාලන්නට



හැකිය. වනය පුරා සිටින සත්වයන් දනිති. එවිට බිසව වැදිපුත්‍රයන්ට මෙසේ කියන්නීය, හාත්පසින් රැස්වූ වැදිපුත්‍රයනි, සවණක් රැස් විහිදන දළසඟලක් ඇති ඇත්රජහු සිහිනෙන් දුටිමි. ඔහුගේ දළ ලද්දේ නම් ජීවත් වෙමි. නොලද්දේ නම් මගේ ජීවිතය නොතිබෙයි. එබස් ඇසූ වැදිපුත්‍රයෝ එවන් ඇතෙකු අප දන්නේ නැත. එබැවින් නුඹවහන්සේ දුටුසැටි කිව මැනව. දේවියනි, සතර දිගට සතර අතට කවර දිගක ඇත්දැයි දන්නේදැයි විමසීය. එවිට සුභද්‍රාවෝ රැස්වූ වැදිසමූහයා බලා ඔවුන් අතුරෙන් පැතිර සිටිනා පතුල් ඇති මහත් වූ තඹවන් දැළිරැවුල් ඇති පඩුවන් ඇස් ඇති අවලක්ෂණ රූ ඇති පිළිකුල් වෙස් ඇති, මහාබෝධිසත්වයන්ට ජන්මාන්තරයෙන් වෛරී වූ, සෝණුත්තර වැදිපුත් දැක මේ කටයුත්තට ඔහු සුදුසුයැයි දන්වා, ඔහු කැඳවාගෙන සත්මහල් ප්‍රාසාදයට ගොස්, හිමවතට අත දිගු කොට ඇත්රජු වසන තැන දක්වා, වැදිපුත්‍රයනි, මේ නුවරට ඉදුරාම උතුරු දිග බොහෝ ගම්නියම්ගම් ගෙවා ගිය විට චුල්ලකාල, මහාකාල පර්වත ඉක්මවූ විට සත්වන ස්වර්ණකාල පර්වතයක් ඇත. ඒ සිට නොයෙක් රුක්මුදුන්හි බඹරවැලක්ගේ වීදික ස්ථානයක් වැනිය. මෙහි සත්යොදුන් උස ඇති පර්වත ශිඛරයට පැනනැගී ප්‍රාන්ත භූමිය බලව. ඡද්දන්ත විල ද ඒ වටා සිටි රත්පියුම්, හෙළපියුම් වනයෙන් සැදි වනය අවසන් කොට විලට ඊසාන කොණෙහි දිළිසෙන නුගගසක් ඇත.



ඒ රුක්මුල්හි රිදී පර්වතයක් බබළන්නාක් මෙන් සවණක් රැස් විහිදන දළ ඇති අනෙක් හස්තීන් විසින් මැඩපැමිණිය නොහැකි ඡද්දන්ත නම් හස්තිරාජ තෙම ගිම්සමයෙහි සිහිල් පවන් විඳිමින් සිටින්නේය. මොහු මටසිලිටු දළ ඇතිව පවනට බඳු වේගයෙන් ගොස් අනෙක් අටදහසක් පමණ හස්තීන් රැකවල්ලාගෙන ඇත. මහත් කොට නාසාවාතයන් හරිමින් ගිගුරවමින් වනය එකනින්නාද කොට සොයන්නාහ.

සෝණුත්තර නම් වැදිපුත්තෙම යහපතැයි කියා ඇත්රජු යන එන තැන් සිටිනා තැන් විමසා බිසොවුන් වැඳ පිටත්විය. එවිට සුභද්‍රා තෙම වැදිපුත්‍රයාගේ බිරිඳට වියදම් දී සෝණුත්තරට සමුදුන්නේය. වැදිතෙම රජුට වැඳ අවසර ගෙන වනයට වැද සුභද්‍රා දේවිය කී බස් අනුව ඡද්දන්ත නම් ඇත්රජහු සොයා සත්අවුරුදු සත් මස් සත්දවසකින් සදත්විල සමීපයට ගොස් බෝධිසත්වයන් වසන පෙදෙස දැක, මෙතැන්හි වළක් ගසා ඇත්රජහු විද ජීවිත විනාශ කොට දළ කපාගනිමියි නිශ්චය කොට, වනයට වැද ඇතුන් දියකෙළියට ගිය කල්හි ඇත්රජු මෙපමණ දවස් ඉන්නා තැන් උදැල්ලකින් කැණ දිය ඉසුරුවා කණු සිටුවා ඒ පෝරුව මත මධ්‍යයෙහි හී දණ්ඩක් යන තරම් සිදුරක් කොට වැලිපස් කසළ ආදිය නොදැනෙනා පරිද්දෙන් වසා තමා යන විටම මගක් ඉවතින් තබා ඇත් රජුගේ ඇගෙන් වැහෙන දියබිඳු හරහා හීදණ්ඩක් යන හිදැසින් වැදිපුත්‍රයාගේ ඇඟ වැටුණේය. වැදිපුත් ඒ සලකුණෙන් ඇතුට මහසැරයකින් විද්දේය. එම හීය බෝධිසත්වයන්ගේ පපුකැන්, අතුනුබහන් සිද නාභියෙන් අහසට නැගුණේය. සිදුරුව ගිය තැන්වලින්, රිදී කළයකින් රතුදිය වැහෙන්නාක් මෙන් ලේ වැගුරුණේය. මහත් වේදනාවන් ඇතිව ඇත්රජතෙම නාද කරමින් කුංචනාද කළේය. සියලු ඇත්තු ගුගුරා පැනනැංගාහ. ඡද්දන්ත නම් ඇත් රජහු සැරපහර ලැබ වේදනාවෙන් සිටිනු දැක, පසමිතුරු අල්වාගනිමියි සැහැසි වී වේරම්භවාතයක් සේ ඇලලී ගිය අහස් කුස දුවන වළාකුල් මෙන් සතර දිග සුණුවිසුණු කෙරෙමින් බලන්නට පටන් ගත්හ.

එවිට ඇත්සමූහයා විසිරුණු බව දැක සුභද්‍රා ඇතින්නිය විසින් ඇඟවතුරුවා ගන්නා ලදින් මදක් සිට වේදනාව නිසා ඇත්රජු ඊ දණ්ඩ ආ තැන් විමසනුයේ නැගෙනහිර ආදියෙන් ආයේනම් කුම්භස්තලය සිද නික්මෙයි. සොඳුර අටදහසක් පමණ මාගේ පසමිතුරු අල්වමියි දිවපුවාහයි කීවේය. ඒ ඇසූ සුභද්‍රා තෙම නුඹවහන්සේ කරා ඉවසා සිටියෙමි. ඊට ක්ෂමා කරවයි කී විට මහබෝසතාණන් තුන්යලක් පැදකුණු කොට වැඳ මේ දිග බලමි. අහසට නැගි කල්හි භූමිය පයින් පා කළේය. එවිට පුවරුව කැඩීබැඳී ගියේය. ධවල වූ සොඬ දිගු කොට විමසන්නා වූ මහබෝසතුන්ගේ වේදනාවෙන් පීඩිතව අර්හත් ධජය නම් සත්කාර ගරුකාර කටයුතුය. එබැවින් මොහු මැරිය යුතු නොවේ. ඒ සෝණුත්තර නම් වැදිපුත් සොඬින් ඔසවා මෙසේ කියයි. රාගාදී කසටින් කිළිටි වූ දැනීමක් නැති යමෙක් කසාවස්ත්‍රය දරා නම් වදුරන් පෙරෙව් සිංහචර්මයක් මෙන් ඊට යෝග්‍ය නොවන්නේය. යම් පුද්ගලයෙක් රාගාදී කසල දුරු කළේද සිල්රැකීමේ භාවනා කිරීමේ අප්‍රමාද ද ඉන්ද්‍රිය රැකීමෙහි යුක්ත ද එසේ වූ පුද්ගල තෙමේ බුද්ධාදීන් විසින් දැරිය යුතු අරහත් ධජය දරන්නට නිසි යැයි කියා ඇතෙකු වුවත් මැරිය යුතු නොවන්නේය.

ඔහු කෙරේ කෝප දුරු කොට ඔබ මා විදින්නට හේතු කුමක්දැයි ඇසූ විට, වැදිපුත්‍රයා කසී රජුගේ සුභද්‍රා නම් අගබිසවක් ඇත. ඕතොම සිහිනෙන් තොප දැක සවණක් රැස් විහිදෙන මේ දළ දෙකෙන් පළඳනා කරන්නට උවමනායැයි දොල බැඳ රජුට දන්වා එරට වැදිපුත්‍රයන් ගෙන්වා මාව නිසියැයි තෝරාගෙන මංසලකුණු කියා එවන ලදී. එබස් ඇසූ මහබෝසතාණන් මේ චුල්ලසුභද්‍රාවන්ගේ මෙහෙවරක් යැයි සිතා තමාට මාගේ දළෙන් ප්‍රයෝජන නැත. මා මරවනු පිණිස මොහු එව්වේයැයි කියා මගේ පියාණන්, මුත්තණුවන් දළ නොනස්නා පිණිස තිබූ බව දැන මගේ දළ දෙක ගෙන එවැයි කී තැනැත්තී මා කළ යම් වරදක් සිතෙහි තබාගෙන වෛරම සිද්ධ කොට රෞද්‍ර ක්‍රියාවකට උත්සාහ කරයි. මා නොමියෙන තෙක් දළ කපාගනිවයි කීහ. එබස් ඇසූ වැදිපුත්, එතැනින් නැගී කීයතක් රැගෙන මහබෝසතාණන් සමීපයට ගියේය. අසූරියන් පමණ උස ඇති දළ තිබූ හෙයින් අත දිගු කරන්නට නොහැකිව බෝධිසත්වයන් ශරීරය නමා වැදහොත්තේය. වැදිපුත්‍රයා රිදීදමක් වන් සොඬමත නැගී දළ කපන්නට වන්නේය. බෝසතාණන්ට වේදනා උපන්නේය.

සෝණුත්තර වැදිපුත්‍රයා අනෙක් ඇත් කෙනෙකුන්ට නැති ආශ්චර්යමත් වූ ඒ දළ දෙක්හි රන්වන් වූ හාත්පසින් වනලැහැබ බබුළුවා සත්දවසක් ඇතුළත බරණැස් නුවරට පැමිණියේය. සවණක් රැස් බබළන ඡද්දන්ත ඇතුගේ දළ දෙක ගෙනාමි. නුවර සැරසුව මැනැවයි කී කල්හි සැරසුව කල්හි සෝණුත්තර වැදිතෙමේ නුවරට ගොස් ප්‍රාසාදයට නැගී දළ දෙක බිසොවුන්ට දී බිසොවුන්වහන්ස, නුඹවහන්සේට පූර්ව ජාතියෙහි ස්වාමී වූ ඇත්රජු කළ වරදක් සිත්හි තබා වෛර බැඳ මරවන්නට සිතූ පරිද්දෙන් මළ නියාව දත මැනව. ඔහුගේ දළ වේදැයි දුන්නේය. මහාබෝසත්වයන් සවණක්රැස් විහිදී දළ සඟල මිණිතල්වැටක තබා තමාගේ කළවා මත්තේ තබාගෙන පූර්ව ජාතියෙහි තමාගේ ස්වාමීහුගේ දළ බලමින් මෙබඳු රුසිරියෙන් දිළිසෙන ඇත්රජහු විෂ පෙවූ හීයකින් විද ජීවිත විනාශ කොට මෙය ගෙන්වන ලද මා කළ දේ නපුරැයි සිතා බෝධිසත්වයන්ගේ ගුණ සිහිකරමින් ශෝකයට පත් විය. එයින් හෘදය වස්තුව පැළී එදවස්හිම කාලක්‍රියා කළාය.

මේ බව දත් බුදුරජාණන්වහන්සේ සිවුවනක් පර්ෂදයෙහි වැඩහිඳ සිනහා පහළ කළ සේක. සර්වඥයෝ නම් නිකරුණේ සිනහ පහළ නොකරති. නුඹවහන්සේ සිනහ පහළ කළේ කවරක් නිසාදැයි භික්ෂූන්වහන්සේ බුදුන්ගෙන් විචාළහ. සිනාසුණු කාරණා වදාරන බුදුරජාණන්වහන්සේ, මහණෙනි, මේ ළදරු බාල මෙහෙණිය, පෙර එක් ජන්මයෙක්හි මට පාදචාරිකාවක්ව උපන්නී, සන්තෝෂයෙන් සිනාසී තමා කළ තදකමක් දැක හඬාපු කාරණය දැක සිනා පහළ කළෙමියි කියා ඡද්දන්ත ජාතකය දේශනා කොට වදාළ සේක. දේශනාව අසා බොහෝ සත්වයෝ සතරමග සතරඵලයට පැමිණියාහ. ළදරු මෙහෙණි තෙම තමා වසන වෙහෙරට ගොස් ධ්‍යාන භාවනා කොට රහත් වූහ. එසමයෙහි සෝණුත්තර නම් වැදිපුත්‍රයා ලවා ඡද්දන්ත ඇතුගේ දළ කැප්පවූ සුභද්‍රා නම් දැන් මේ සිනා සී ඇඩූ මෙහෙණිය වන්නේය. බිසොවුන් කී පරිදි අටළොස් රියන් ගෙවා පර්වත වළලු සතක් පැන ගොස් ඡද්දන්ත ඇත්රජුගේ දළ ගෙනා සෝණුත්තර නම් දේවදත්ත ස්ථවිරයන්වහන්සේය. එසමයෙහි සියතින් දළ කපා දුන් ඇත්රජු නම් බුදු වූ මම ම වේ යැයි වදාළ සේක.

ඡද්දන්ත ජාතකයෙන් හෙළිවන පරිදි වෛරයෙන් සිත පුරවා ගැනීම වනාහි පසුතැවිල්ලට මෙන්ම දුකට ද හේතු වේ.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදි කිසිවකුට ඔහු බේරාගත නොහැක.


# සදහම් ප්‍රහේලිකා අංක - 89



ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 89, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය නොවැම්බර් මස 15 වැනිදාය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.



### ▶ හරහට

1. සිව් පසයට අයත්ය.
4. බුදුන් වහන්සේ ආයු සංස්කාරය කළේ මෙම චෛත්‍යය අසලදීය.
5. මෙය සංසාරයට උපමා කෙරේ.
9. සැප යන අර්ථය ගෙන දේ.
11. සියලු දේට මුල්වන්නේ මෙයයි.
12. ගාලු දිසාවේ පිහිටි දර්ශනීය ගඟකි.

### ▼ පහළට

2. ජාතික වෘක්ෂය.
3. ප්‍රකට ජාතක කතාවකි.
4. ජී. බී. සේනානායක ලියූ නවකතාවකි.
6. මෙය ඇතාට අභිමානය ගෙන දෙයි.
7. බුදුන් වහන්සේ තමා කව්දැයි පැහැදිලි කළේ මෙම ආජීවකයාටය.
8. බුදුන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයායි.
9. ජනප්‍රිය කාව්‍ය ග්‍රන්ථයකි.
10. සිදුහත් කුමරු බුදුවන බව මුලින්ම පැවසූ තවුසා.

### ප්‍රහේලිකා අංක 88 ජයග්‍රාහී වාසනාවන්තයින්

- ජී. එච්. පියසිලි, 370, අම්පිටිය, මහනුවර.
- සුනේත්‍රා මල්කාන්ති, 264/2, ඉහකැටිය, උණුවින්න.
- එච්. එන්. පාලමකුඹුර, 4/1, වළල, මැණික්හින්න.

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහයකට ආසන්න කාලයක් තිස්සේ "දළද වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළද මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළද වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

ථෙරවාද බුදු දහමට අනුව අන්තරාභවය පිළිබඳ වූ සෘජු සංකල්පයක් පැහැදිලි නොවේ. සම්බුද්ධ දේශිත ධර්මය හා විනය ක්ෂීණාස්‍රවයන් වහන්සේලා විසින් යුගානුසාරීව සුරක්ෂිකරණය කළේද, කල්යත්ම පුබ්බසෙලීය, සම්මිතිය හා යොගාචරිය ආදී නිකායාන්තරික මතවාද හා ථෙරිය න්‍යාය ගැටුණි. ඒ නිසාවෙන් කිසියම් තැනෙක මුල් බුදු සමය හා සංසන්දනයෙහිදී ඇතැම් විසංවාදී දර්ශනික ගැටලුද උද්ගත වුණි. අන්තරාභවික සංකල්පයද එබන්දක් සේ හඟිමි.

කෙසේවතුදු අද්‍යතනයෙහිද විශ්විය ඥානාවලිය හා සසඳමින් සමයාන්තර ඥානපටලයෙන් හා ධර්ම විනය පරිභවයෙන් හෙබි ඇතැම් බහුශ්‍රැත ධර්මධරයහුද අන්තරාභවයන් වෙතියි තර්කානුසාරීව නිගමනය කෙරෙති. විද්‍යා වූ සාංදෘෂ්ටික නිදර්ශනයන්ද දක්වති. තතු එසේ බැවින් මේ පිළිබඳව ථෙරීය බුදුසමයානුකූල සම්‍යක් ගවේෂණයක නියලෙමින් බොදු සච්චන් මිත්‍යා දෘෂ්ටියෙන් මුදවාලීම මෙම ලිපි පෙළෙහි පරමාරම්මණයයි.

ථෙරවාද මූල ත්‍රිපිටකගත ඇතැම් දේශාන්තරයෙහි මෙම අන්තරාභවික සංකල්පය සෘජු භාෂණයෙන් නොවූවද, වක්‍රෝත්තියෙන් ස්ඵුට වූ කිසියම් සේයාවක් පෙනෙයි.

''භූතාවාසම්භවෙසීවා'' (සුත්ත නිපාතය - මෙත්ත සූත්‍රය)

''ගන්ධබ්බො ච පච්චුපට්ඨිතොහොති'' (මජ්ඣිමනිකාය - මහාතණ්හාසංඛය සූත්‍රය)


''නෙවිධ න හුරංඋභය මන්තරෙන'' (උදන පාළිය - බාහියසූත්‍රය)

''අන්තරා පරිනිබ්බායි'' සංයුක්ත නිකාය - අංගුත්තර නිකාය)


'භූතානංවා සත්තානංඨිතියා සම්භවේසීනං අනුග්ගහාය'' (අංගුත්තර නිකාය - චතුක්කනිපාත - ආහාරසූත්‍රය)

# අන්තරාභවය යනු කුමක්ද?

01 කොටස



''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''



යථා කාරණා හේතුවෙන් පූර්වාපර දෙදිග ධර්ම විචාරකයෝ ථෙරීය න්‍යාය සිද්ධාන්තය තුළ භවසාංක්‍රමණික අන්තරාභවික තත්ත්වයෙන් වෙතියි උපකල්පනය කරන්නාහ. එසේ වතුදු විමංසන බුද්ධිය හා මධ්‍යම සමතාවෙන් යුතුව පසක් කළ යුත්තක් වේමය.

ත්‍රිපිටක මූලාශ්‍රගත සාධකයන්ට අනුව භාග්‍යවතුන් වහන්සේ සසරභවික සත්ත්වයාගේ මරණින් මතු භවය පිළිබඳව දරා ඇත්තේ තුණ්හීභාව පටිපත්තියයි. නොහොත් අව්‍යාකෘත වූ ඨපනීය ප්‍රශ්නයක් ලෙසිනි.

"යානිමානි දිට්ඨිගතානි භගවතා අබ්‍යාකතානිඨපිතානිපටික්ඛිත්තානි", "සස්සතො ලොකො'තිපි, අසස්සතො ලොකො'තිපි, අන්තවා ලොකො'තිපි, අනන්තවා ලොකො'තිපි, තං ජීවං තං සරීරං ඉතිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ඉතිපි, හොති තථාගතො පරම්මරණා'තිපි, නහොති තථාගතො පරම්මරණා'තිපි, හොති ච නචහොති ච තථාගතො පරම්මරණා'තිපි, නෙවහොති න නහොති තථාගතො පරම්මරණා'තිපි - තානිමෙභගවා න බ්‍යාකරොති, යානිමෙභගවා න බ්‍යාකරොති තං මෙ න රුච්චති. තං මෙනක්ඛමති."

(මජ්ඣිමනිකාය - 2 - භික්ඛුවග්ග - චූලමාලුංකයපුත්ත සූත්‍රය)

භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් මෙම ප්‍රශ්න විසර්ජනය අව්‍යාකෘත සේක්ද?

"නහෙතං ආවුසො අත්ථසංහිතං ආදිබ්‍රහ්මචරියකං න නිබ්බිදයන විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤය න සම්බෝධාය න නිබ්බාණායසංවත්තති, තස්මා තං අබ්‍යාකතංභගවතා."

(එම)

(ඇවැත්නි, මෙය අර්ථ සංහිත නොවෙයි. බඹසරටමුල නොවෙයි, කළකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස, කෙලෙස්ගම්නය පිණිස, විශිෂ්ට ඥනය පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස අදළ නොවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය අප්‍රකාශිතයි.)

ථෙරවාද මතය අනුව විමසන කල ප්‍රත්‍යක්ෂාවබෝධය වනුයේ, පංචේන්ද්‍රියන් වෙත පැමිණෙන රූප, ශබ්ද, ගන්ධාදී පංචාරම්මණයන් උපාදන මාත්‍රයන් සේ ගනු ලබන සත්ත්වයා මතු භවයක් කරා එළඹෙන බවයි.

"යස්මිං සමයේ අච්ඡිවාතෙනඛිත්තා දූරම්පි ගච්ඡති. තමහංචාතුපාදනං වදමි. වාතොහිස්ස තස්මිංසමයෙ උපාදනංහොති, සඋපාදනස්ස බොහංචච්ඡඋප්පත්තිං පඤ්ඤපෙමි. නොඅනුපාදනස්ස."

(සංයුක්ත නිකාය - මහාවග්ග - කුතුහලසාලා සූත්‍රය)

(...වච්ඡ, උපාදන සහිතයාට මම උපත පනවමි. උපාදන නැතියාට නොවෙයි.)

මෙලෙස උපාදන ප්‍රත්‍යය කොට ගෙන කර්ම බීජ රැස්කරන සසරභවික සත්ත්වයාගේ ච්‍යුතිය හා ප්‍රතිසන්ධිය අතරෙහි ගත වනුයේ, නේත්‍ර නිමේෂයක කාලයක්ය යනු, ථෙරවදීය මතයයි.

"...මරණ මඤ්චෙතිපන තස්ස යථූපචිතං පාපකම්මංවා කම්ම නිමිත්තං වාමනොද්වාරෙ ආපත්ථමා ගච්ඡති. තං ආරබ්භ උප්පන්නාය තදරම්මණ පරියොසනායජවනවීථියා අන්තරංභවංග විසයන්ති."

(විසුද්ධිමග්ග - පටිච්චසමුප්පාදනිද්දේස)

නමුත් නිකායාන්තරික ලබ්ධීහු සත්ත්වයාගේ ච්‍යුතිය හා ප්‍රතිසන්ධිය අතරෙහි කිහිප දිනක කාල පරාසයක් පිළිබඳව අදහස් දරන්නාහ. එම කාලාන්තරය **අන්තර්භවය** නාමයෙන් හැඳින්විණ. එතද්අන්තරාභවය තුළ වූ සත්ත්වයාගේ සත්ත්ව සංයුතික පදර්ථය ගන්ධය ආහාර කොටගත් **ගන්ධර්ව (ගන්ධබ්බ)** නම් වුණි. ඒ වග,

"මෘත්‍යුප්පන්තිභවයොං අන්තරාභවතීභයඃ - ගම්‍යදෙශානුපෙත්වාත් නොපපන්නො අන්තරාභවඃ"

(විඥනවාදී යොගාචාර අභිධර්ම කෝෂය - තෘතීයපරිච්ඡේද)

මෙසේ විග්‍රහ වේ. එහෙත් ස්ථවිරවාදීහු මේ සම්බන්ධයෙන් දරනුයේ, අන්‍යමතාන්තරයහ.

ථෙරවාද ටිකාචාර්යයෝ **ගන්ධබ්බ** නම්, උත්පත්ති ස්වභාවයයි. (තඤ්චබොපන පටිසන්ධිනිමිත්ත සණ්ඨිත පකතිසභාවංච ගහෙතබ්බා) (සාරත්ථදීපනීවිනයටිකා) අර්ථ දක්වන්නාහ.

**ගන්ධබ්බ** නාමය ඇතැම් තන්හි කුසුම සුගන්ධය, පත්‍ර සුගන්ධය, හරසුගන්ධය කෙරෙහි අධිගෘහිත දේවසමූහයක් ලෙසින්ද නිරූපිතයි. (සංයුක්ත නිකාය - ගන්ධබ්බ සංයුක්ත) ඉන්දු යුරෝපීය භාෂා නිරුක්තියට අනුවද, ගන්ධභුක් (-ගන්ධය අනුභව කරන්නා) ශබ්ද මූලයෙන් නිෂ්පන්නය. එමතුදු නොව,

"ගන්ධ ධර්මයෝ නම් නැට්ටුවෝය. ඔවුන් නා නා වෙස් ගන්නාක් මෙන් සත්ත්වයාත් නා නා වෙස් ගන්නා බැවින් **ගන්ධබ්බ** යැයි කියන ලදී."

(විමතිවිනොදනීවිනයටීකා - 86 පිට)

"ගන්ධබ්බ නම් එහි ඉපදීමට එළඹෙන ස්වභාවයයි. මෙය ථකාරයට ධ කාරය කොට සිද්ධයි."


(පාරාජිකා පාළි - සුදින්නවත්ථුවණ්ණනා)

යථා පරිදි ථෙරවාදීය බුදු සමයාන්තර්ගත සූත්‍රානුසූත්‍ර කොට්ඨාසයන්හි කිසිම් අසමානිත වූ අර්ථකරණයක් දක්නට ලැබේ. කෙසේ නමුත් සසර භවිකයාගේ අන්තරභවිකත්ත්වය හා ගන්ධබ්බත්ත්වය කෙරෙන් ඉස්මතු වූ මතවාදයන් ස්ථවිරවාදීන් විසින් පිළිගන්නා ලද්දේද යනු විසඳිය යුත්තෙකි.

(මතු සම්බන්ධයි)

**රාජකීය පණ්ඩිත වාඩිගල සමිතරතන හිමි**
**මහාවිහාර මහ පිරිවෙණ, අස්ගිරිය, මහනුවර.**

# මහනුවර තරුණ බෞද්ධ සංගමය 50 විය සපුරයි



මහනුවර නගරය ආගමික වශයෙන්, ඓතිහාසික වශයෙන් හා සමාජයීය වශයෙන් ශ්‍රී ලංකාවේ වැදගත් නගරයක් වන අතර ලෝක උරුම නගරයක් වශයෙන්ද ප්‍රකාශිතය. ආගමික වශයෙන් වැදගත් වන්නේ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ වම් දළදාව ශ්‍රී දළදා මාලිගාව තුළ ජීවමානව වැඩ සිටීම නිසාය. මෙම දළදා පුරයේ එනම් මහනුවර නගරයේ පිහිටි මහනුවර තරුණ බෞද්ධ සංගමය ශ්‍රී ලංකාවේ බෞද්ධ සංගම් අතර ප්‍රධාන තැනක් ගන්නා සංගමයකි.

එදා 1965 දී අවුරුදු 20-35 තරුණයන් 61 දෙනකු එකතුව පිහිටුවන ලද බෞද්ධ සමිතියේ පුරෝගාමී ආරම්භක සාමාජිකයන් වන් රන්ජිත් කේ. ද අල්විස් හා අ. වි. ද විජේවර්ධන යන තරුණයන් දෙදෙනා අනගාරික ධර්මපාලතුමාගේ දේශනයකට සවන් දීමට යන ගමනේදී සාකච්ඡා කළ අදහසකට අනුව මහනුවර පුෂ්පදාන බාලිකා විද්‍යාලයේදී 1965.10.31 දින සමිතිය පිහිටුවිය. අනගාරික ධර්මපාලතුමාගේ දේශනයට සවන් දීමට යමින් සිටින විට සමිතිය පිහිටුවීමේ අදහස ඇතිවීම එක්තරා දෛවෝපගත සිදුවීමකි.

1966 දී මහනුවර පුරපතිව සිටි ඊ. එල්. සේනානායක මැතිඳුන් විසින් රජවාසල උද්‍යානය අසලින් ලබාදුන් ඉඩම් කැබැල්ල තුළ ඉදිකරන ලද තරුණ බෞද්ධ සමිතියේ මුල්ම ගොඩනැගිල්ලට සිය ධන පරිත්‍යාගය ලබාදුන්නේ පී. ද එස්. විජේසේකර මහතා විසිනි. ඉන්පසු මේ දක්වා 50 වන වසර සපුරන අද වන විට සංගමය විශාල ගොඩනැගිලි සංකීර්ණයකින් සමන්විත වන අතර සංගමයේ ගොඩනැගිලිවලට නැගෙනහිරින් මීටර් 400ක පමණ දුරක දළදා මාලිගාව පිහිටා ඇති අතර ඒ හා සමාන දුරක මල්වතු මහා විහාරය පිහිටා ඇත.

මල්වතු මහා විහාරය හා දළදා මාලිගාව අතර කිරි මුහුද නමින් හැඳින්වෙන මහනුවර වැවය. ඊසාන හා උතුරු දිසාවට බහිරවකන්ද බුදු පිළිමයද, අස්ගිරි මහා විහාරයේ ඉදිවන මහා චෛත්‍යරාජයාණන් වහන්සේද අස්ගිරි මහා විහාරයද, දකුණින් රජවාසල උද්‍යානය මෙන්ම මහනුවරට ජලය සපයන දුණුමඩලාව රක්ෂිතයද පිහිටීමත් ගඟින් වට වූ කෝරළය (ගඟවට කෝරළය) තුළ මහනුවර නගරයේ හදවත වන් තැනක සංගමයේ ගොඩනැගිල්ල පිහිටීමද එක්තරා දුරකට ආශිර්වාදයකි.

බුද්ධ ධර්මය නගා සිටුවීම, එහි අධ්‍යාපනය හා ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම, බෞද්ධයන් අතර සමගිය සහයෝගය වැඩිදියුණු කිරීම, බෞද්ධයන්ගේ ආධ්‍යාත්මික සංස්කෘතික හා අධ්‍යාපනික ශාරීරික හා සමාජීය අභිවෘද්ධිය සැලසීම, බෞද්ධයන්ගේ ආර්ථික සංවර්ධනය නංවාලීමට කටයුතු සැලසීම, බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, සාමාජික සුබසාධනය සැලසීම වැනි කටයුතු මහනුවර තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමේ මූලික පරමාර්ථයන් විය. මේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අනු අංශ වශයෙන් ආගමික හා ධර්ම අධ්‍යාපන අංශය, සාහිත්‍ය සංස්කෘතික හා කලා අංශය, සමාජසේවා හා සුබසාධන අංශය, ක්‍රීඩා හා තරුණ කටයුතු අංශය, දේශීය හා විදේශීය සම්බන්ධතා අංශය මෙන්ම තුරුණු බෞද්ධයන් ලෙස සමාජගත කිරීම සඳහා ළමා අංශයක්ද පිහිටුවා ඇත. මෙම අංශ මගින් කෙරෙන කාර්යභාරයන් තුළ දාන සීල භාවනා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සුවිශේෂ ධර්ම දේශනා පැවැත්වීම, ආර්ථික අපහසුතා ඇති දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම, සමාජ සත්කාරක සේවා මෙන්ම බෞද්ධ ළදරු පාසල් පවත්වාගෙන යාම, විශේෂයෙන් දළදා පෙරහර පැවැත්වෙන කාලයේදී සුවසේවා හා ප්‍රථමාධාර කඳවුරක් පවත්වාගෙන යාම වැනි ප්‍රධාන වශයෙන් ඉටුකෙරෙන කාර්යයන් වේ.

සංගමය මගින් මාසිකව නිකුත් කරන සම්බෝධි සඟරාව 1973 සිට මේ දක්වා වසර 43 ක් ඔස්සේ නොකඩවා පළකරන අතර බෞද්ධ සමිති සංවිධාන, පාසල්වලට, අතිපූජනීය වෙහෙර විහාරවලට, විද්වතුන්ට හා මහා සාමාජිකත්වයට තැපැල් කර හරිනු ලැබේ. සංගමයෙන් කෙරෙන කටයුතු දෙස බැලූ විට ශ්‍රී ලංකාව තුළ බෞද්ධ සමිති සමාගම් අතර ඉතා විශිෂ්ට තත්ත්වයකට මහනුවර තරුණ බෞද්ධ සංගමය පත්වී ඇත. බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දළදා වහන්සේගේ ආශිර්වාදය ලැබීමත්, ඓතිහාසික මල්වතු මහා විහාරය, අස්ගිරි මහා විහාරය ඇතුළු සිව් නිකායික මහානායක අනුනායක ස්වාමීන් වහන්සේලාගේ මෙන්ම අනෙකුත් ධර්මධර විනයධර ස්වාමීන් වහන්සේලාගේ ආශිර්වාදය ලැබීමත් සංගමයේ කටයුතු සාර්ථකව කරගෙන යාමට මහත් පිටුවහලකි.

**එච්. එම්. එන්. ඒකනායක**

බොදු පුවත්

## අස්ගිරිය මහා විහාරයේ කඨින පූජෝත්සවය නොවැම්බර් 10/11 දිනවල

**මහනුවර** අස්ගිරිය මහා විහාරයේ කඨින පින්කම නොවැම්බර් 10-11 දිනවල අස්ගිරිය මහා විහාරයේදී පැවැත්වේ. නොවැම්බර් 10 වැනි දින මාහිමි නිල ආරාමයේදී සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවකි. 11 වැනිදා අලුයම 4 ට වස් ආරාධනා කළ කඨින පින්කමේ ප්‍රධාන දායකත්වය දරණ මහනුවර රජ පිහිල්ල මාවතේ ලයනල් ගුණතිලක මහතාගේ නිවසේ සිට කඨින වස්ත්‍රය රැගත් රිය පෙරහර ශ්‍රී දළදා මාලිගාව වෙත පැමිණ පාන්දර 4.30 ට ශ්‍රී දළදා මාලිගාව අසල සිට පෙරහරකින් අස්ගිරිය මහා විහාරය කරා කඨින චීවරය වැඩමවාගෙන එනු ඇත.

දවල් 11 ට බුද්ධ පූජාව හා අස්ගිරි මාහිමි අනුනායක හිමි දෙනම ප්‍රධාන මහා සංඝරත්නය විෂයෙහි පිරිනමනු ලබන කප්රුක් සහිත සංඝගත දක්ෂිණාවකි.

මහනුවර සම්බෝධි විහාරාධිපති කර්මාචාර්ය රාවණාඇල්ලේ පඤ්ඤමෝලි හිමි ප්‍රධාන අස්ගිරිය මහා විහාර තරුණ භික්ෂු සංගමයේ මූලිකත්වයෙන් හා අස්ගිරිය මහනුවර දායක දායිකාවන්ගේ දායකත්වයෙන් සිදුකෙරෙන කඨින පින්කම ලයනල් ගුණතිලක, ලේඛා ගුණතිලක දෙපල ප්‍රධාන පවුලේ පිරිසගේ මූලික දායකත්වයෙන් පැවැත්වේ.


## ඓතිහාසික පොළොන්නරුව ගල් විහාරයේ කඨින පින්කම ඔක්තෝබර් 27/28 දිනවල

**ඓතිහාසික** පොළොන්නරුව ගල් විහාරයේ කඨින පින්කම් පූජෝත්සවය ඔක්තෝබර් 27-28 දිනවල විහාරාධිපති, පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රජමහ විහාරාධිපති අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක ශාස්ත්‍රපති වේඩරුවේ ශ්‍රී උපාලි නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.


කඨින පින්කම විශේෂ තැනක් ගනු ලබන්නේ ඓතිහාසික පොළොන්නරුව කිරිවෙහෙරේ තායිලන්ත බෞද්ධ දූත පිරිසගේ සහභාගිත්වයෙන් සිදුකරනු ලබන මහ් කප්රුක පූජාවය. පිළියන්දල මඩපාත සෝමරත්න කොඩිතුවක්කු, දර්ශන කොඩිතුවක්කු යන මහත්වරු කඨින පින්කමේ දායකත්වය දරයි. ඔක්තෝබර් 27 සවස 6.30 ට බෝධි පූජාව, රාත්‍රී 8.30-9.30 දක්වා පිරිත් දේශනාව, රාත්‍රී 10 ට කඨින වස්ත්‍රය වැඩම කිරීම, 28 උදේ 5.30 ට කඨිනය විහාරයට භාරදීම, උදේ 7 ට බුද්ධ පූජාව, 10.45 ට බුද්ධ පූජාව, 11.15 ට මහා සංඝරත්නය විෂයෙහි පිරිනමනු ලබන සාංඝික දානය, 12.30 ට පිරිකර පූජාව, 12.45 ට කඨින චීවර පූජාව හා අනුශාසනාව.

**කේ. බණ්ඩාරනායක**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# නිවන් මගට බාධා කරන දෝෂ දහඅටක් ඇති ස්ථාන



භාවනාවට කැමති යෝගාවචරයා එයට සුදුසු ස්ථානයක් සොයාගත යුතුය. ආචාර්යවරයාත් සමග කමටහන් විමසමින් වැඩ විසීමට හැකිනම් යහපත්ය. එලෙස තෝරාගත් තැන 18 දෝෂයන්ගෙන් මිදුනු තැනක් විය යුතුය. එම දෝෂ 18 මෙසේය.

**1. මහා විහාර පන්සලේ දෝෂ**

මහා විහාරයට නිතර යන එන භික්ෂූන් නිසා තදබදය වැඩිවේ. නොයෙක් දෙස් ඇති හිමිවරු එකතු වෙති. එකිනෙකා අතර මතවාද ඇතිකර ගැනීමෙන් වත් පිළිවෙත් ඉටු නොකරයි. යම් හෙයකින් වත් පිළිවෙත් සිදුකරයි නම් ගැටලු නොවන්නේ නම් එබඳු වූ මහා විහාරයක වැඩ සිටීම වරදක් නොවන බව දැක්වේ.

**2. අභිනව විහාරස්ථානයේ දෝෂ**

ප්‍රතිසංස්කරණ කටයුතු හා නව කර්මාන්ත ඇති හෙයින් වැඩ කටයුතු කරන හා නොකරන ලෙස කණ්ඩායම් දෙකක් සිටිය හැක. දෙපිරිස අතර ඔබවහන්සේ මහණදම් කටයුතු ඉටු කරගන්න, අපි විහාරයේ සංවර්ධන කටයුතු සිදු කරන්නම් යැයි සහයෝගිතාවය ඇත්නම් එම අභිනව විහාරයේ වැඩ සිටීම වරදක් නැත.

**3. දිරාපත් වූ විහාරස්ථානයේ දෝෂ**

එම විහාරස්ථානයේ සකස් කළ යුතු වැඩ බොහෝය. තමන් එහි සිටියත් එය යථා තත්ත්වයට පත් නොකළහොත් අනුන්ගේ දෝෂයට ලක්වේ. ඒවා ඉටු කරන්නට යෑමෙන් කමටහන් පිරිහේ.

**4. මහා මාර්ගය අසල විහාරස්ථානයේ දෝෂ**

ආගන්තුක හිමිවරු නිතර වැඩම කරති. තමන්ගේ සේනාසනය පවා අනුන්ට දී පිටතට යෑමට සිදුවේ. එයින් කමටහන් වැඩීමට අවස්ථාව නැතිවේ. එහෙත් එවැනි බාධක නැත්නම් කිසිම වරදක් නොවේ.

**5. පැන් පොකුණු සහිත විහාරස්ථානයේ දෝෂ**

ජල පහසුව ලබාගැනීමට නිතර ජනයා පැමිණේ. ඔවුන්ට ජල භාජන අවශ්‍යතා සපයා දීමට සිදුවේ. එයින් කමටහන් වැඩීමට අවකාශය නොලැබේ.

**6. පලා වර්ග බහුලව ඇති විහාරස්ථානයේ දෝෂ**

යෝගී ස්වාමීන් වහන්සේලා කමටහන් ගෙන දිවා විහරණයේ යෙදී සිටින විට පලා නෙළීමට පැමිණි කාන්තාවෝ ගී කියමින් පලා නෙළන විට ගී රාවය හේතුවෙන් කමටහන්වලට අන්තරාය පැමිණේ.

**7. මල් ඇති විහාරස්ථානයේ දෝෂ**

මල් නෙළීමට, බැලීමට එන පිරිස හේතුවෙන් කමටහන් වැඩීමට ඉඩ නොලැබේ.

**8. ඵල ඇති විහාරස්ථානයේ දෝෂ**

ඵල වර්ග ඉල්ලා නොයෙකුත් දෙනා කෑමට පැමිණේ. ඒවා ඉල්ලති. නුදුන්නොත් කිපේ. තරහකාරයන් ඇතිවේ. එම නිසා කර්මස්ථානයට අන්තරාය වේ.

**9. බොහෝ දෙනා බැලීමට පැමිණෙන විහාරස්ථානවල දෝෂ**

දක්ෂිණාගිරි, හත්ථි කුච්ඡි ලෙණ, සෑගිරි, සිතුල්පව්ව වැනි විහාරස්ථානවල භික්ෂූන් වහන්සේලාද රහතුන් යැයි සිතා මහජනතාව උන්වහන්සේලා වැඳීමට පැමිණේ. එවිට යෝගී භික්ෂූන්ට එය බාධාවකි.

**10. නගරය ආශ්‍රිත විහාරස්ථානවල දෝෂ**

එවැනි විහාරස්ථානවල අයහපත් අරමුණු ඇතිවීමට බලපාන කටයුතු බහුල වේ. අධිපති ජනයා නිතර විහාරස්ථානය ඇසුරු කරයි. එවිට යෝගීනට බාධා ඇතිවේ.

**11. දැව ඇති විහාරස්ථානවල දෝෂ**

දැව හෝ වෘක්ෂ ඇති පන්සල්වලට ඒවා කපාගෙන යාමට නොයෙක් ජනයා පැමිණ ශබ්ද කරති. ගෙවල් හැදීමට මිනිසුන් ගස් කපන විට ඒවාට බාධා කළහොත් තරහකාරයන් ඇතිවේ. එයින් කමටහන් වැඩීමට බාධා ඇතිවේ.

**12. කුඹුරු සීමා ඇසුරු කළ විහාරය**

ගොවිතැන් කටයුතුවලින් කෙරෙන අඬහැර හඬ ගොයම් නෙළන කවි ගී නිසා බාධා ඇතිවේ. එවිට කමටහන් වැඩීමට බාධා ඇතිවේ.

**13. විසම අදහස් ඇති භික්ෂූන් සිටින විහාරස්ථාන**

අන්‍යෝන්‍යයන් අතර දබර ඇති කරගනී. ඒවා වළක්වන්නට යාමෙන් චෝදනා විඳීමට සිදුවේ. එය කමටහන් වැඩීමට බාධාවකි.

**14. මුහුදු වෙරළ ආශ්‍රිත විහාරස්ථාන**

නැව්වලින්, ගැල්වලින් එන ජනයා නිතර ගැවසේ. නවාතැන් පහසුකම් ඉල්ලති. එය කමටහන් වැඩීමට සුදුසු පරිසරයක් නොවේ.

**15. පිටිසරබද විහාරස්ථාන**

ඇතැම් පිටිසරබද විහාරස්ථානවල තෙරුවන් පිළිබඳව නොසලකා කටයුතු කිරීමෙන් එයින් බාධා පැන නඟී. ඔවුන්ගෙන් හිරිහැර වේ. එය බාධකයකි.

**16. රාජ්‍ය සීමා ආශ්‍රිත විහාරස්ථාන**

රාජ භය ඇතිවේ. රජ කුමරු චරි පුරුෂයෝ යැයි සැක කොට හිංසා කරති.

**17. අයෝග්‍ය (සුදුසු නොවන) විහාරස්ථාන**


විසම අදහස් ඇතිවීම, අමනුෂ්‍ය දෝෂ නිසා භාවනාවට බාධා ඇතිවේ.

**18. කල්‍යාණ මිත්‍රයන් නැති විහාරස්ථාන**

ආචාර්යයන් හෝ ආචාර්යයන් හා සම අය නැති උපාධ්‍ය හෝ උපාධ්‍යය හා සම අය නැති උපදෙස් ගැනීමට නොහැකි නිස් කරමස්ථාන නිවැරදිව අනුගමනයට බාධා ඇතිවේ.

**පූජ්‍ය කඹුරුපිටියේ මුනින්දවංශ හිමි**

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"



# ඔබටත් මේ වගේ දේවල් අමතක වෙලා මතක් වුණාද ?

1. අද බැංකුවට ගියා. පෑනක් අරගෙන යන්න බැරිවුණා. පෑනක් හොයාගෙන ලෑස්ති වෙනකොට බැංකුවේ පෝලිම දික්වෙලා තිබුණා.

2. තාත්තාගේ අවුරුද්දේ දානය දෙන්න ඕන නිසා දිනය නියම කරගෙන නෑදෑයන්ට, යාළුවන්ට, කන්තෝරුවේ අයට කිව්වා. අන්තිමට පන්සලට ගියා බණටත්, දානයටත් හාමුදුරුවන්ට ආරාධනා කරන්න. එදට රාත්‍රී බණකුත්, පහුවද දානයකුත් තිබෙන බව පන්සලේ හාමුදුරුවෝ කිව්වා. "දිනේ වෙනසක් කරමු මහත්තයෝ" හාමුදුරුවෝ මට මතක් කළා. "හාමුදුරුවනේ, මට දිනේ වෙනස් කරන්න බැහැ. නෑදෑයන්ට, යාළුවන්ට, කන්තෝරුවේ හැමෝටම මතක් කරලා ඉවරයි" කිව්වා. "ආ... එහෙනම් මහත්තයා පන්සලට ආවේ අන්තිමටම මතක් කරන්න නම්, කලින් මතක් කරපු අයටම දානය දෙන්න" කියලා හාමුදුරුවෝ කිව්වා. ඇත්තටම මම කරලා තියෙන්නේ වරදක්. මුලින් පන්සලට ගිහින් දිනය කතා කරගෙන අනිත් අයට කියන්න ඕන කියලා තේරුණේ අද.

3. අද ලේ බලන්න දොස්තර මහත්තයා ළඟට ගියා. දොස්තර කිව්වා මට සීනි ඇවිල්ලා කියලා. ඇත්ත. තේ කොළ හැන්දක් දලා සීනි හැඳි තුන හතරක් දලා තේ කියලා මෙච්චර කාලයක් මම බීලා තියෙන්නේ සීනි කියලා අද තේරුණා.

4. පෝය දවසේ පන්සල් ගියා. වාහනේ යන නිසා සෙරෙප්පු දාගෙන යන්න ඕන නැහැ කියලා අම්මා කිව්වා. මම සෙරෙප්පු දෙක දාගෙන ගිහින් පන්සල් මළුවේ ගැලෙව්වා. බුදුන් වැඳලා ඇවිල්ලා බලනකොට සෙරෙප්පු දෙක එතන නැහැ. දෙවියෝ බුදුන් ඉන්න තැනත් නොහිතන දේවල් වෙනවා කියලා මතක් වුණේ එතකොට.

5. පන්සලේ නඩත්තු, අලුත්වැඩියා, ප්‍රතිසංස්කරණ, සති පින්කම්, මාස පින්කම්, හේවිසි ශබ්ද, පීකර් ශබ්ද එක එක හඬවල්වලින් කන්අඩි පිරුණා. ගිය අවුරුද්දේ, මේ අවුරුද්දටත් ඒ වගේමයි. හේවිසිකාරයොයි, ලයිට් වැල් ටිකයි, සවුන්ඩ්ස්කාරයොයි ගියාට පස්සේ අවුරුද්දම කානිවල් එකක් වගේ කියලයි මට හිතුණේ. හිත සන්සුන් කරන විදියට ආගම දහම අදහන්න අවශ්‍ය පරිසරයක් අපිට තාම නැහැ කියලා තේරුණේ මේ ගැන හිතන කොට.

6. බැංකුවට ගියා වියදමට සල්ලි ටිකක් ගන්න. එකකට එකක් ගැළපෙන්නේ නැති ප්‍රමාණයේ මුදල් නෝට්ටු ගොඩාක් මට ලැබුණා. 10, 20, 50, 100, 1000 පිළිවෙළට හඳුනගන්න අමාරුයි. සමහර මුදල් නෝට්ටු පසුම්බියට දන්නත් බැරි තරම් ලොකුයි. අන්තිමට සල්ලි ටික නවලා කලිසම් සාක්කුවේ දාගත්තා. කඩේකට ගිහින් බඩු ගත්තා. මම රු. 20 කියලා 500 කොළයක් මුදලාලිට දීලා.

7. ලියුමක් තැපැල් කරන්න තැපැල් කන්තෝරුවට ගියා. ලිපිනය ලියලා මුද්දරය අලවන්න බැලුවා. ලොකු රු. 10 ක මුද්දරයක් කොතන අලවන්නද කියලා කල්පනා කළා. අන්තිමට හිතලා හිතලා ලිපිනය වැහෙන්නැති තැනක් බලලා ලියුම් කවරේ පිටුපස්සේ මුද්දරය ඇලෙව්වා.

8. සත් අන්තෙ ගෙදරට ඕන බඩුමුට්ටු ටික ගන්න නගරෙට ගියා. ගන්න ඕන ගොඩාක් දේවල් මග ඇරුණා. ලබන සතියටත් වැඩ ඉතුරු වුණා. ඒ කොළයක් පෑනක් අරගෙන ගෙනායුතු බඩු, යා යුතු තැන් පිළිබඳව සටහනක් ලියාගෙන යන්න පුරුදු නැති නිසා කියලා මට හිතුණා.

9. මගේ හොඳම යාළුවගේ අම්මා නැතිවුණා. මළ ගෙදර අඳින්න සුදු ඇඳුමක් ගෙදර අල්මාරියේ අහුමුළු පෙරළා බැලුවා. ඇත්තටම මළ ගෙදරකට, දානෙ ගෙදරකට, පන්සලකට ඇඳගෙන යන්න ගැළපෙන ඇඳුමක් ඇඳුම් ගොඩේ තිබුණේ නැහැ. තියෙන ඇඳුම් ඇඳගෙන කොහොම පාරේ ගියාද කියලා පස්සේ මට හිතුණා. අන්තිමට කඩේට ගිහින් අලුත් ඇඳුමක් අරගෙන ඒක ඇඳන් මළ ගෙදර ගියා.

10. දරුවෝ නිසා තාත්තට කරදරයි නේද අපිත් එක්ක ඉන්න කියලා අපේ දූ මට මහළු නිවාසයක් හොයලා ඇතුල් කරන්න සූදානම් කළා. අද මම මහළු නිවාසයට ඇතුල් වුණා. තරුණ කාලේ ගමේ ගෙවල්වල ඉන්න බල්ලෝ පූසෝ පන්සල ළඟට හන්දි ගානේ ගෙනිහිල්ලා දන කොන්ත්‍රාත් එක භාරව කටයුතු කළ මගේ අතීතය මතක් වුණා.

11. ගෙදරට හැමදම බඩු ගන්න ගියේ මා එක්ක එකට ඉස්කෝලේ ගියපු මගේ හොඳම යාළුවගේ කඩේට. බලනකොට යාළුකමට කියලා අනික් කඩවලට වඩා වැඩි බිලක් මට දලා බඩු දීලා තියෙන්නේ.

12. චිත්‍රපට, ටෙලි නාට්‍ය බලලා ආදරයත්, විවාහයත් ඒ විදිහට ගෙවන්න ඕන කියලා සිහින මැව්වා. ගොඩක් චිත්‍රපට, ටෙලිනාට්‍යවල රඟපාන, රඟපාපු නළු නිළියන්ගේ ආදරය, විවාහය සාර්ථක නැහැ කියලා පස්සේ මට තේරුණා. අම්මා තාත්තාගේ ජීවිතය ආදර්ශයට අරගෙන විවාහ ජීවිතය ගත කරන්න මම තීරණය කළා.

**පූජ්‍ය කඹුරුපිටියේ මුනින්දවංශ හිමි**

